

සන්න සහිත

# නාමපද මාලාව

සහ

# ආඛ්‍යාතපද මාලාව.



# NAMAPADAMALA

&

# AKHYATAPADAMALA

with

Paraphrase

---

By

A clever Buddhist Priest

---

Printed By

D. P. Pathmaperuma

Nedimala

At the

Ginalankara Press

HUNUPITIYA

*Colombo*

---

සන්නස සහිත

# නාමපදමාලාව

සහ

## ආඛ්‍යාතපදමාලාව

---

සමර්ථ ස්ථවිරයන්වහන්සේ නමක් ලවා

සම්පාදනය කරවාගෙණ

නැදිමාලේ පදිංචි

දනියෙල් ප්‍රේරා පත්ම පෙරුම වන මාවිසින්

ජිනාලඞ්කාර යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී.

---

ශ්‍රී. බු. ව. 2450.

1907

# NAMAPADAMALA

&

# AKHYATAPADAMALA

with

Paraphrase

By

**A clever Buddhist Priest**


Printed By

D. P. Pathmaperuma

Nedimala

At the

Jinalankara Press

HUNUPITIYA

*Colombo*


සන්න සහිත

# නාමපදමාලාව

සහ

**ආඛ්‍යාතපදමාලාවු**

සමණ ස්ථවිරයන්වහන්සේ නමක් ලවා

සම්පාදනය කරවාගෙණ

නැදිමාලේ පදිංචි


දනියෙල් පේ‍රරා පත්ම පෙරුම වන මා විසින්

ජිනාලඞ්කාර යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදී.

**ශ්‍රී. බු. ව. 2450.**

1907

# සංඥාපත්‍රය.

——oo——

"නාමපදමාලා" නම් පාලිනාම වරනැගිල්ල හා "ආඛ්‍යාත පදමාලා" නම් ආඛ්‍යාතවරනැගිල්ලද, බාලාවතාරයට අනුව ගලපා කාත්‍යායන ව්‍යාකරණ ක්‍රමය පුහුණුකිරීම පිණිස බස ගන්නන්ගේ පළමුවෙනි පොතක් වශයෙන් බොහෝ කලක පටන් භාවිතා කරගෙණ එති, මීට පදසිද්ධි කියන ක්‍රමයට "රූපමාලා" නම් පොතක්ද පාලිභාෂාවෙන්ම ගලපා මුද්‍රණයකොට තිබේ, එසේම සිංහල සන්නයක්ද විද්‍යමානවූවහොත් ඉතා ආධුනිකයන්ට මහත් ප්‍රයෝජනවන්නේයයි සලකා ඒ ඒ ආචාර්‍ය්‍යයන්වහන්සේලා විසින් පුරාණ පටන් අර්ථ කියවාගෙණ එන ලබණ ක්‍රමයට සම්බන්ධ ස්ථවිරයන්වහන්සේ නමක් ලවා පොත දීර්ඝ නොවීම පිණිස වර නගා තිබෙන ශබ්දයන්ට පමණක් හා එසේම ආඛ්‍යාත වරනැගිල්ලටද අර්ථ ලියවා අන්වය කියන ක්‍රමය හා අර්ථ කියන ක්‍රමය පහසුවෙන් දැන ගැණීමට හැකිවනසේ සම්පාදනය කරවාගෙණ මෙයි පහත නම් [illegible] මා විසින් මුද්‍රණය කරවනලදී.

මෙහි "ඉකාරන්තං, ඊකාරන්තං, සී. එකවචනය කියයුතු සමහර තැනක 'ඉකාරන්තා. ඊකාරන්තා' යනු වෙන් බහුවචනද, "අකාරන්තා" යනාදියට "අකාරන්තයි" යනුවෙන් එකවචනද, ණකාර නකාර විපර්‍ය්‍යාශ හා දීර්ඝවිය යුතු සමහරතැන් හ්‍රස්වවද හ්‍රස්වවිය යුතුතැන් දීර්ඝවද ඇතත් එයින්ද, ආධුනිකයන්ගේ ප්‍රයෝජනයට බාධාවක් නොවෙතැයි හඟින බැවින් එබඳු තැන් සුද්ධි පත්‍රයට ඇතුලත් නොකළ බවදසැලකිය යුතු.

නවත් මෙහි යම් කිසි අසුද්ධස්ථාන ඇතිවෙත්ව නුපුළුවනැයි නොකියමු. එබඳු තැන් ලොකාර්ථකාමී සුධීන් විසින් සුද්ධකරණු ලැබේවා—

මෙය නැවත අච්චුගැස්වීමේ බලයද මටම තබාගත් බවත් සැලකියයුතු.

ලම්බවගට,

නැදිමාලේ පදිංචි

**දනියෙල් ජේ‍්‍රන් පත්මපෙරුම**

වනම්මස.

18/2/1907.

# ශුද්ධිපත්‍රය.

| පිට | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 5 | 3 | සැපනැත්තාහ | සැප නැත්තේය |
| ,, | 16 | අත්මය | ආත්මය |
| 8 | 16 | යත්තවුන් | යන්නවුන් |
| 11 | 31 | ජනතු | ජන්තු |
| 13 | 16 | මුනුබුරය | මුනුබුර |
| 16 | 4 | තනැත්තෙති | තෙනැත්තෙති |
| 19 | 10 | භයං | භයෑති |
| 20 | 16 | පරිපුණණං | පරිපුණ්ණා |
| 21 | 3 | බවයෝසි | භාවයෝසි |
| ,, | 28 | ධුමො | ධූමා |
| ,, | 31 | මධුරභාවයි | මධුරබවයි |
| ,, | 34 | දෙස් නැත්තාහුය | දෙස් නැත්තේය |
| 22 | 17 | භය නැත්තාහ | භය නැත්තේය |
| 28 | 32 | පවත්තතු | පවතත |
| ,, | 33 | පවතීවා | පවතුව |
| 29 | 18 | කොහ ඉවජනනි | කෙන ඉවඤ්ජනි |
| 30 | 23 | කම්පාකරයි | කම්පාවෙයි |
| 39 | 37 | කරණ ලද්දහුය | කළහ |
| 41 | 21 | කපෙපනති | කපෙපති |
| 42 | 10 | උපාසිකවා | උපාසිකාව |
| 52 | 13 | ගියේද | යන්නෙහිද |
| ,, | 15 | ආවාහුද | එන්නාහුද |
| 58 | 27 | භික්ෂුණීයෙනි | භික්ෂුණී |
| 59 | 6 | පැහැදුනේ | පැහැදුනෝ |
| ,, | 18 | සජ්ඣායංකරොනානි,<br>සජ්ඣායනාකරත්; | පසසථ,<br>බලව්; |
| 60 | 12 | බුරභායෝසි | බූරශ්‍රිභයෝසි |
| ,, | 21 | ශබ්දය | ශබ්ද |
| 61 | 25 | පමුව | පමුවථ |
| 62 | 3 | පසාදෙන | පසාදෙ |
| ,, | 4 | පැහැදීමෙන් | පැහැදීම |
| ,, | 39 | නිඝිතා | නිචි |

සන්නස් සහිත

# නාමපදමාලා.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

"බුද්ධං තිලොක සරණං අභිවන්දියග්ගං
ධම්මං විචක්ඛණජනෙහි සුසෙවනීයං
සඞ්ඝං ච සාධුජනපුඤ්ඤඵලං දදන්තං
ව්‍යාඛ්‍යං කරොමි ජිනමාතුනිකාන්තිමාහං"

ප—ඒ. අත්‍ර 'බුද්ධො' ඉති අකාරන්තපුල්ලිඞ්ග කිතකන්ත පඨම විභත්‍යෙකවචන නාමපදං.

මේ නාමපදමාලාවෙහි (පළමුකොට) "බුද්ධො" යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත ප්‍රථමා විභක්ති එකවචන නාම පදයකි

ප—බ. "බුද්ධා" ඉති අකාරන්තපුල්ලිඞ්ග කිතකන්ත පඨමා විභත්ති බහුවචන නාම පදං.

බුද්ධා, යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත ප්‍රථමාවිභක්ති බහුවචන නාම පදයකි.

ආ—ඒ. (භෙ) 'බුද්ධ. බුද්ධා' ඉති වෙ පදානි අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත ආලපනවිභත්‍යෙකවචන නාම පදානි.

(භෙ) 'බුද්ධ. බුද්ධා' යන (මේ) දෙපදයෝ අකාරන්ත පුල්ලිඟු කිතකන්ත ආලපනවිභක්ති එකවචන නාම පදයෝ.

ආ—බ. (භවන්තො 'බුද්ධා' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත ආලපනවිභත්ති බහුවචන නාම පදං.

(භවන්තෝ) 'බුද්ධා' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත ආලපනවිභක්ති බහුවචන නාම පදයකි.

දු—ඒ. 'බුද්ධං' ඉති අකාරන්තපුල්ලිඞ්ග කිතකන්ත දුතියා විභත්‍යෙකවචන නාම පදං.

'බුද්ධං' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත ද්විතීයා විභක්ති එකවචන නාම පදයකි.

දු—බ. 'බුද්ධෙ' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත දුතියාවිභත්ති බහුවචන නාම පදං.

'බුද්ධෙ' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත දුතියාවිභත්ති බහුවචන නාම පදයකි.

තෘ—ඒ. 'බුද්ධෙන' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත තතියා විභත්‍යෙකවචන නාම පදං.

'බුද්ධෙන' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත තෘතියා විභක්ති ඒකවචන නාම පදයකි.

තෘ—බ. 'බුද්ධෙභි. බුද්ධෙහි' ඉති වෙ පදානි අකාරන්ත පුල්ලිඞ්ග කිත් කන්ත තතියාවිභත්ති බහුවචන නාම පදානි.

'බුද්ධෙභි. බුද්ධෙහි' යන (මේ) දෙපදයෝ අකාරන්ත පුල් ලිඟු කිතකන්ත තෘතීයාවිභක්ති බහුවචන නාම පදයෝයි.

ක—ඒ. 'බුද්ධෙන' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත කරණ වි භත්‍යෙකවචන නාම පදං.

'බුද්ධෙන' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන් ත කරණවිභක්ති ඒකවචන නාම පදයකි.

ක—බ. 'බුද්ධෙභි. බුද්ධෙහි' ඉති වෙ පදානි අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත කරණවිභත්ති බහුවචන නාම පදානි.

'බුද්ධෙභි. බුද්ධෙහි' යන (මේ) දෙපදයෝ අකාරන්ත පුල් ලිඟු කිතකන්ත කරණවිභක්ති බහුවචන නාමපදයෝයි.

ච—ඒ. 'බුද්ධාය. බුද්ධස්ස' ඉති වෙ පදානි අකාරන්ත පුල්ලිඞ්ග කිත කන්ත චතුත්ථි විභත්‍යෙකවචන නාම පදානි.

'බුද්ධාය. බුද්ධස්ස' යන (මේ) දෙපදය් අකාරන්ත පුල්ලිඟු කිතකන්ත චතුර්ථිවිභක්ති ඒකවචන නාම පද යෝයි.

ච—බ. 'බුද්ධානං' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත චතුත්ථි විභත්ති බහුවචන නාම පදං.

'බුද්ධානං' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත චතුර්ථිවිභක්ති බහුවචන නාම පදයකි.

පං—ඒ. 'බුද්ධා. බුද්ධම්හා. බුද්ධස්මා' ඉති තීණි පදානි අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත පඤ්චමිවිභත්‍යෙකවචන නාමපදානි.

'බුද්ධා. බුද්ධම්හා. බුද්ධස්මා' යන (මේ) පදත්‍රය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත පඤ්චමිවිභක්ති ඒකවචන නාම පදයෝයි.

පං—බ. 'බුද්ධෙහි. බුද්ධෙභි' ඉති ඉමෙ පදනි අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත පඤ්චමීවිභත්ති බහුවචන නාම පදනි.

'බුද්ධෙහි. බුද්ධෙභි' යන (මේ) දෙපදය අකාරන්ත පුල් ලිඟු කිතකන්ත පඤ්චමීවිභත්ති බහුවචන නාම පද යෝයි.

ඡ—එ. 'බුද්ධස්ස' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත ඡට්ඨී විභත්‍යෙකවචන නාම පදං.

'බුද්ධස්ස' යන (මේ) පදය අකාරන්තපුල්ලිඟු කිතකන්ත ෂෂ්ඨීවිභත්ති එකවචන නාම පදයකි.

ඡ—බ. 'බුද්ධානං' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත ඡට්ඨී විභත්ති බහුවචන නාම පදං.

'බුද්ධානං' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත ෂෂ්ඨී විභත්ති බහුවචන නාම පදයකි.

ස—එ. 'බුද්ධෙ. බුද්ධම්හි. බුද්ධස්මිං' ඉති තීණි පදනි අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත සත්තමීවිභත්‍යෙකවචන නාම පදනි.

'බුද්ධෙ. බුද්ධම්හි. බුද්ධස්මිං' යන (මේ) පදත්‍රය අකාරන්ත පුල්ලිඟුකිතකන්ත සත්තමීවිභත්ති එකවචන නාම පද යෝයි.

ස—බ. 'බුද්ධෙසු' ඉති අකාරන්ත පුල්ලිඞ්ග කිතකන්ත සත්තමී විභත්ති බහුවචන නාම පදං

'බුද්ධෙසු' යන (මේ) පදය අකාරන්ත පුල්ලිඟු කිතකන්ත සත්තමීවිභත්ති බහුවචන නාම පදයකි.

——oo——

අනන්ත රාජාදී ශබ්දයන්ගේ අන්ක්‍ද

මෙසේම යොදාගතයුතු.

මෙහි 'ශ්‍රී'කාර 'ඊ'කාරන්තාදී වශයෙන් යෙදීමපමණක් වෙනසි

---

ප—එ. බුද්ධො, බුදුරජතෙම; විරොචති, බබලයි.

ප—බ. බුද්ධා, බුදුවරයෝතුමූ; විරොචන්ති, බබලත්.

ආ—එ. (භෙ) බුද්ධ. බුද්ධා, (පින්වත්) බුදුවරණ; මං පාලය, මා රැකකරව.

ආ—බ. (භවන්තො) බුද්ධා, (පින්වත්) බුදුවරජුනි; අම්හෙ පාලෙථ. අප රක්‍ෂාකරව්.

දු—එ. බුද්ධං, බුදුන්; වන්දාමි, වඳිමි.

දු—බ. බුද්ධෙ, බුදුවරයන්; වන්දාම, වඳිමු.

තෘ—එ. බුද්ධෙන, බුදුන් විසින්; දෙසිතො ධම්මො, දෙසනලද ධර්මයයි.

තෘ—බ. බුද්ධෙහි. බුද්ධෙභි බුදුවරයන් විසින්; දෙසිතා ධම්මා, දෙසනලද ධර්මයෝයි,

කර—එ. බුද්ධෙන, බුදුන් කරණකොට; සුඛං ලභාමි, සැප ලබමි.

කර—බ. බුද්ධෙහි. බුද්ධෙභි, බුදුවරයන් කරණකොට: සුඛානි ලභාම, සැපලබමු.

ච—එ. බුද්ධාය. බුද්ධස්ස, බුදුන්ට: පුප්ඵං පූජෙමි, මලක් පුදමි.

ච—බ. බුද්ධානං, බුදුවරයන්ට; පුප්ඵානි පූජෙම, මල්පුදමු.

පං—එ. බුද්ධා. බුද්ධම්හා. බුද්ධස්මා, බුදුන් කෙරෙන්; පභා නිච්ඡරති, ප්‍රභා නික්මෙයි.

පං—බ. බුද්ධෙහි. බුද්ධෙභි, බුදුවරයන් කෙරෙන්; පභා නිච්ඡරන්ති, ප්‍රභා නික්මෙත්.

ෂ—එ. බුද්ධස්ස, බුදුන්ගේ; විහාරො, විහාරයයි.

ෂ—බ. බුද්ධානං, බුදුවරයන්ගේ: විහාරා, විහාරයෝයි.

ස—එ. බුද්ධෙ. බුද්ධම්හි. බුද්ධස්මිං, බුදුන්කෙරෙහි: පණ්ඩිතොරමති, පණ්ඩිතතෙම ඇලේයි.

ස—බ. බුද්ධෙසු, බුදුවරයන් කෙරෙහි; පණ්ඩිතාරමන්ති, පණ්ඩිතයෝ ඇලෙත්.

## 'බුද්ධ'ශබ්දයෙන් සවිඥයන්කියත්.

---

ප—එ. අත්තා, ආත්මය තෙම; නප්පවත්තති, නොපවතියි.

ප—බ. අත්තානො, ආත්මයෝතුමූ; නප්පවත්තන්ති, නොපවතිත්

ආ—එ. (භො) අත්ත. අත්තා, (පින්වත්) ආත්මය; චිරං ජීව, කලක් ජිවත්වව.

ආ—බ. (භවන්තො) අත්තානො, (පින්වත්) ආත්මයිනි; චිරං ජීවථ, කලක් ජීවත්වව්.

ද්වි—එ. අත්තානං. අත්තං, ආත්මය; රක්ඛාමි, රකිමි?

ද්වි—බ. අත්තානො, ආත්මයන්; රක්ඛාම, රකිමු.

තෘ—එ. අත්තෙන. අත්තනා, ආත්මය විසින්; පාපං කතං, පව් කරණලදී.

තෘ—බ. අත්තනෙහි. අත්තනෙභි, ආත්මයන් විසින්; පාපානි කතානි, පව්කරණ ලද්දුහ.

කර—එ. අත්තෙන. අත්තනා, ආත්මය කරණකොට; සුඛං නත්ථි, සැප නැත්තේය.

සා—බ. අත්තනෙහි. අත්තනෙහි; ආත්මයන් කරණකොට, සුඛානි නැඹි, සැපනැත්තාහ.

ච—එ. අත්තනො; ආත්මයට; සුඛං දදමි, සැපදෙමි.

ච—බ. අත්තානං, ආත්මයන්ට; සුඛානි දදම, සැපදෙමු.

පං—එ. අත්තතා. අත්තම්හා. අත්තස්මා, ආත්මය කෙරෙන්, මුචාමි, මිදෙමි,

පං—බ. අත්තනෙහි අත්තනෙහි, ආත්මයන් කෙරෙන්; මුචාම, මිදෙමු.

ඡ—එ. අත්තනො, ආත්මයගේ; ගති, ගතියයි,

ඡ—බ. අත්තානං, ආත්මයන්ගේ; ගතී, ගතිහුයි.

ස—එ. අත්තනි, ආත්මය කෙරෙහි; කො පණ්ඩිතොරමති, කවර පණ්ඩිතයෙක් ඇලේද?

ස—බ. අත්තනෙසු, ආත්මයන් කෙරෙහි; කෙ පණ්ඩිතාරමන්ති, කවර පණ්ඩිතයෝ ඇලෙද්ද?

**'අත්ත' ශබ්දයෙන් අ ත්මය කියන්.**

---

ප—එ. රාජා, රජතෙම; චිරං ජීවතු, බොහෝකල් ජීවත්වේවා.

ප—බ. රාජානො, රජදරුවෝ තුමූ; චිරං ජීවන්තු, බොහෝකල් ජීවත්වෙත්වා.

ආ—එ. (භො) රාජ. රාජා, (පින්වත්) රජ; දානං දෙහි, දන්දෙව.

ආ—බ. (භවන්තො) රාජානො, (පින්වත්) රජදරුවෙනි; දානානි දෙථ, දන් දෙව්.

දු—එ. රාජානං. රාජං, රජ; පස්සාමි, බලමි.

දු—බ. රාජානො, රජදරුවන්; පස්සාම, බලමු.

ත—එ. රඤ්ඤා. රාජෙන, රජවිසින්; පුඤ්ඤං කතං, පින්කරණ ලද්දේය.

ත—බ. රාජූහි, රාජූභි. රාජෙහි. රාජෙභි, රජදරුවන් විසින්; පුඤ්ඤානිකතානි, පින්කරණලද්දහුය.

කා—එ. රඤ්ඤා රාජෙන, රජ කරණකොට; අමච්චො ජීවති, අමාත්‍ය තෙම ජීවත්වෙයි.

කා—බ. රාජූහි. රාජූභි. රාජෙහි. රාජෙභි, රජදරුවන් කරණකොට; අමච්චා ජීවන්ති, අමාත්‍යයෝ තුමූ ජීවත්වෙත්.

ච—එ. රඤ්ඤො. රාජිනො, රජහට; පණ්නාකාරං දදමි, පඬුරක් දෙමි.

ච—බ. රඤ්ඤං. රාජූනං. රාජානං, රජදරුවන්ට; පණ්ණාකාරානි දදම, පඬුරුදෙමු.

පං—ඒ. රඤ්ඤා. රාජම්හා. රාජස්මා, රජකෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි.

පං—බ. රාජූහි. රාජූභි. රාජේහි. රාජේභි, රජදරුවන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්.

ඡ—ඒ. රඤ්ඤො. රාජිනො, රජහුගේ; ආභරණං, ආභරණයයි.

ඡ—බ. රඤ්ඤං. රාජූනං. රාජානං, රජවරුන්ගේ; ආභරණානි, ආභරණයෝයි.

ස—ඒ. රඤ්ඤෙ. රාජිනි. රාජම්හි. රාජස්මිං, රජකෙරෙහි; රාජධම්මො විජ්ජති, රාජධර්මය විද්‍යමානවෙයි.

ස—බ. රාජූසු රාජේසු, රජදරුවන් කෙරෙහි; රාජධම්මා විජ්ජන්ති, රාජධර්මයෝ විද්‍යමානවෙත්.

## 'රාජ' ශබ්දයෙන් රජ දරුවන් කියත්.

ප—ඒ. ගුණවා පුරිසො, ගුණවත් පුරුෂතෙම; තිට්ඨති, සිටියි.

ප—බ. ගුණවන්තො. ගුණවන්තා පුරිසා, ගුණවත් පුරුෂයෝ තුමූ; තිට්ඨන්ති, සිටිති.

ආ—ඒ. (භො) ගුණවං. ගුණව. ගුණවා පුරිසා, (පින්වත්) ගුණවත් පුරුෂය; සීලං රක්ඛ, සිල් රක්‍ෂාකරව.

ආ—බ. (භවන්තො) ගුණවන්තො. ගුණවන්තා පුරිසා, (පින්වත්) ගුණවත් පුරුෂයෙනි; සීලානි රක්ඛථ, සිල් රක්‍ෂිව්.

දු—ඒ. ගුණවන්තං පුරිසං, ගුණවත් පුරුෂයා; පස්ස, බලව.

දු—බ. ගුණවන්තෙ පුරිසෙ, ගුණවත් පුරුෂයන්; පස්සථ, බලවූ.

ත—ඒ. ගුණවතා, ගුණවන්තෙන පුරිසෙන, ගුණවත් පුරුෂයා විසින්; කතො විහාරො, කරණලද විහාරයයි;

ත—බ. ගුණවන්තෙහි. ගුණවන්තෙභි පුරිසෙහි, ගුණවත් පුරුෂයන් විසින්; කතා විහාරා, කරණලද විහාරයෝයි;

කා—ඒ. ගුණවතා. ගුණවන්තෙන පුරිසෙන, ගුණවත් පුරුෂයා කාරණකොට; දිට්ඨි විසුජ්ඣති; දෘෂ්ටිය පිරිසිදුවෙයි;

කා—බ. ගුණවන්තෙහි. ගුණවන්තෙභි පුරිසෙහි, ගුණවත් පුරුෂයන් කාරණකොට; දිට්ඨියො විසුජ්ඣන්ති, දෘෂ්ටිහු පිරිසිදු වෙත්;

ච—ඒ. ගුණවතො, ගුණවන්තස්ස පුරිසස්ස, ගුණවත් පුරුෂයාහට; භොජනං දදාමි, ආහරයක් දෙමි;

ච—බ. ගුණවතං. ගුණවන්තානං පුරිසානං, ගුණවත් පුරුෂයන්ට; භොජනානි දදාම, ආහාර දෙමු;

පං—ඒ. ගුණවතා, ගුණවන්තම්හා. ගුණවන්තස්මා පුරිසස්මා, ගුණවත් පුරුෂයා කෙරෙන්; භයං න උප්පජ්ජති, භය නූපදියි.

පං—බ. ගුණවන්තේහි. ගුණවන්තේහි පුරිසේහි, ගුණවත් පුරුෂයන් කෙරෙන්; භයානි න උප්පජ්ජන්ති, භය නූපදිත්;

ෂ—ඒ. ගුණවතො. ගුණවන්තස්ස පුරිසස්ස, ගුණවත් පුරුෂයාගේ; ගුණං, ගුණයයි;

ෂ—බ. ගුණවතං. ගුණවන්තානං පුරිසානං, ගුණවත් පුරුෂයන්ගේ; ගුණානි, ගුණයෝයි;

ස—ඒ. ගුණවති. ගුණවන්තෙ. ගුණවන්තම්හි. ගුණවන්තස්මිං පුරිසස්මිං, ගුණවත් පුරුෂයා කෙරෙහි; පණ්ඩිතො රමති, පණ්ඩිතතෙම ඇලෙයි;

ස—බ. ගුණවන්තෙසු පුරිසෙසු, ගුණවත් පුරුෂයන් කෙරෙහි; පණ්ඩිතා රමන්ති, පණ්ඩිතයොතුමූ ඇලෙත්;

**'ගුණවන්තු' ශබ්දයෙන් ගුණවතුන් කියත්.**

---

ප—ඒ. ගච්ඡං. ගච්ඡන්තො බුද්ධො, යන්නාවූ බුදුරජතෙම; විරොචති, බබලයි;

ප—බ. ගච්ඡන්තො. ගච්ඡන්තා බුද්ධා, යන්නාවූ බුදුවරයෝතුමූ විරොචන්ති, බබලත්;

ආ—ඒ. (භෙ) ගච්ඡං. ගච්ඡ. ගච්ඡා බුද්ධා, (පින්වත්) යන්නාවූ බුදුවරය; මං පාලය, මා රක්ෂාකරව.

ආ—බ. (භවන්තො) ගච්ඡන්තා. ගච්ඡන්තා බුද්ධා, (පින්වත්)යන්නාවූ බුදුවරයිනි; අම්හෙ පාලෙථ, අපරක්ෂාකරව්;

දු—ඒ. ගච්ඡන්තං බුද්ධං, යන්නාවූ බුදුන්; වන්දමි, වඳිමි.

දු—බ. ගච්ඡන්තෙ බුද්ධෙ, යන්නාවූ බුදුවරයන්; වන්දාම, වඳිමු:

ත—ඒ. ගච්ඡතා. ගච්ඡන්තෙන බුද්ධෙන, යන්නාවූ බුදුන්විසින්; දෙසිතො ධම්මො, දෙසනලද ධර්මයයි.

ත—බ. ගච්ඡන්තෙහි. ගච්ඡන්තෙහි බුද්ධෙහි, යන්නාවූ බුදුවරයන් විසින්, දෙසිතා ධම්මා, දෙසනලද ධර්මයෝයි.

ක—ඒ. ගච්ඡතා. ගච්ඡන්තෙන බුද්ධෙන, යන්නාවූ බුදුන්කරණකොට; සුඛං ලභාමි, සැපලබමි.

ක—බ. ගච්ඡන්තෙහි. ගච්ඡන්තෙහි බුද්ධෙහි, යන්නාවූ බුදුවරයන් කරණකොට; සුඛානි ලභාම, සැපලබමු.

ච—ඒ. ගච්ඡතො. ගච්ඡන්තස්ස බුද්ධස්ස, යන්නාවූ බුදුන්ට; දානං දදමි, දානයක් දෙමි.

ච—බ. ගච්ඡතං. ගච්ඡන්තානං බුද්ධානං, යන්නාවූ බුදුවරයන්ට; දනානි දදම්, දන්දෙමු.

පං—ඒ. ගච්ඡතා. ගච්ඡන්තම්හා. ගච්ඡන්තස්මා, බුද්ධස්මා; යන්නාවූ බුදුන්කෙරෙන්; රංසිනිච්ඡරති, රස්මිවිහිදෙයි.

පං—බ. ගච්ඡන්තෙහි. ගච්ඡන්තෙහි බුද්ධෙහි, යන්නාවූ බුදුවරයන් කෙරෙන්; රංසියො නිච්ඡරන්ති, රස්මීහු විහිදෙත්.

ඡ—ඒ. ගච්ඡතො. ගච්ඡන්තස්ස බුද්ධස්ස, යන්නාවූ බුදුන්ගේ; පාදෙවන්දාමි, පා වඳිමි.

ඡ—බ: ගච්ඡතං. ගච්ඡන්තානං බුද්ධානං, යන්නාවූ බුදුවරයන්ගේ පාදෙවන්දාම, පා වඳිමු;

ස—ඒ. ගච්ඡති. ගච්ඡන්තෙ. ගච්ඡන්තම්හි. ගච්ඡන්තස්මිං බුද්ධස්මිං, යන්නාවූ බුදුන්කෙරෙහි; චිත්තං පසීදති, සිතපහදියි.

ස—බ. ගච්ඡන්තෙසු බුද්ධෙසු, යන්නාවූ බුදුවරයන් කෙරෙහි; චිත්තානි පසීදන්ති, සිත් පහදින්.

**'ගච්ඡන්ත' ශබ්දයෙන් යෙදුනවුන්ගියෙන්.**

අකාරන්තා, අකාරන්ත ශබ්දයෝයි.

———o———

ප—ඒ. අග්ගි, වහ්නියතෙම; විරොචති, බබලයි.

ප—බ. අග්ගී. අග්ගයො වහ්නිහුතුමූ, විරොචන්ති, බබලත්.

ආ—ඒ. (හෙ) අග්ගි, (පින්වත්) වහ්නිය; සීතං විනොදෙහි, සීත දුරුකරව.

ආ—බ. (භවන්තො) අග්ගී. අග්ගයො, (පින්වත්) වහ්නීනි; සීතානි විනොදෙථ, සීත දුරුකරව්.

දු—ඒ. අග්ගිං, වහ්නිය; නිබ්බාපෙමි, නිවමි.

දු—බ. අග්ගී, අග්ගයො, වහ්නීන්; නිබ්බාපෙම, නිවමු.

ත—ඒ. අග්ගිනා, වහ්නිය විසින්. දඩ්ඪො පුරිසො, දවනලද පුරුෂයයි,

ත—බ. අග්ගිභි, අග්ගිහි, වහ්නීන් විසින්, දඩ්ඪා පුරිසා, දවනලද පුරුෂයෝයි.

ක—ඒ. අග්ගිනා, වහ්නිය කරණකොට. භත්තාදී පචාමි, බත් ආදිය පිසමි.

ක—බ. අග්ගිභි, අග්ගිහි, වහ්නීන්කරණකොට, භත්තාදිනී පචාම, බත් ආදීන් පිසමු.

ච—ඒ. අග්ගිනො, අග්ගිස්ස, වහ්නියට, උපාදනං දදමි, දරදෙමි.

ච—බ, අග්ගීනං, වහ්නීන්ට. උපාදනානි දදම, දරදෙමු.

පං—ඒ. අග්ගිනා, අග්ගිම්හා; අග්ගිස්මා, වහ්නිය කෙරෙන්. ධූමො අපෙති, දුම පහවෙයි.

පං—බ. අග්ගිභි, අග්ගීහි, වහ්නීන්කෙරෙන්. ධූමා අපෙන්ති, දුම් පහවෙත්.

ඡ—ඒ. අග්ගිනො, අග්ගිස්ස, වහ්නියගේ. ආලොකො, ආලෝකයයි

ඡ—බ. අග්ගීනං, වහ්නින්ගේ. ආලොකා, ආලෝකයෝයි,

ස-එ අග්ගිම්හි. අග්ගිස්මිං, වහ්නිය කෙරෙහි; සිතපුරිසො රමති, සිතපුරුෂතෙම ඇලෙයි.

ස-බ අග්ගීසු, වහ්නීන් කෙරෙහි; සීතපුරිසා රමන්ති, සිතපුරුෂයෝතුමූ ඇලෙත්.

'අග්ගි' ශබ්දයෙන් ගිනිකියත්.

---

ප-එ ආදි, මයඩ්ඩ්ඪවලුතම; තිඨති, සිටියි.

ප-බ ආදී. ආදයො, මයහිාඳුවෝතුමූ, තිඨනති, සිටිත්.

ආ-එ (භො) ආදි, (පින්වත්) මයහිාඳුව; කම්මං කරොහි, කම්යකරව.

ආ-බ. (භවන්තො) ආදී. ආදයො, (පින්වත්) මයහිාඳුවෙනි; කම්මානි කරොථ, කර්ම කරව්.

දු-එ. ආදිං, මයහිාඳුව; පස්සාමි, බලමි.

දු-බ. ආදී. ආදයො, මයහිාඳුවන්; පස්සාම, බලමු.

ත-එ. ආදිනා, මයහිාඳුව විසින්; කතං කම්මං, කරණලද කර්මයයි.

ත-බ. ආදීහි. ආදීභි, මයහිාඳුවන් විසින්; කතානි කම්මානි, කරණලද කර්මයෝයි.

කා-එ. ආදිනා, මයහිාඳුව කාරණකොට; උපොසථං කරොමි, පොහොයකරමි.

කා-බ. ආදීහි. ආදීභි, මයහිාඳුවන් කාරණකොට; උපොසථානි කරොම, පොහොකරමු.

ච-එ, ආදිනො. ආදිස්ස, මයහිාඳුවට; ජලං දදමි, ජලයදෙමි.

ච-බ. ආදීනං, මයහිාඳුවන්ට; ජලං දදම, ජලයදෙමු.

පං-එ. ආදිනා. ආදිම්හා. ආදිස්මා, මයහිාඳුව කෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි.

පං-බ. ආදීහි. ආදීභි, මයහිාඳුවන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්.

ඡ-එ. ආදිනො. ආදිස්ස, මයහිාඳුවගේ; බලං, බලයයි.

ඡ-බ. ආදීනං, මයහිාඳුවන්ගේ; බලානි, බලයෝයි.

ස-එ. ආදිං. ආදෙ., ආදිම්හි. ආදිස්මිං, මයහිාඳුව කෙරෙහි; කොචි පසීදති, කිසිවෙක් පහදියි.

ස-බ. ආදිසු. ආදීසු, මයහිාඳුවන් කෙරෙහි; කෙචි පසීදන්ති, කිසිවෙක් පහදිත්.

ආදිශබ්දයෙන් මයහිාඳුය. ප්‍රකාරය. සමීපය. අවයවය. යන අර්ථ සතරක් කියත්.

'ඉකාරන්ත, ඉකාරාන්තයි'.

---

ප-එ. දණ්ඩීපුරිසො, දඬුගත් පුරුෂතෙම; තිඪති, සිටියි.
ප-බ. දණ්ඩී. දණ්ඩිනො පුරිසා, දඬුගත්පුරුෂයෝ තුමූ; තිඪන්ති, සිටිත්.
ආ-එ. (භො)දණ්ඩි, (පින්වත්) දඬුගත් පුරුෂය; මං පාලය, මා රක්‍ෂා කරව.
ආ-බ. (භවන්තො) දණ්ඩී. දණ්ඩිනොපුරිසා, (පින්වත්) දඬුගත් පුරුෂයෙනි; අම්හෙ පාලෙථ, අප රක්‍ෂාකරව්.
දු-එ. දණ්ඩිනං. දණ්ඩිං පුරිසං, දඬුගත් පුරුෂයා; ගණ්හාමි, ගණිමි.
දු-බ. දණ්ඩී. දණ්ඩිනො පුරිසා, දඬුගත් පුරුෂයන්; ගණ්හාම ගණිමු.
ත-එ. දණ්ඩිනා පුරිසෙන, දඬුගත් පුරුෂයා විසින්; කතං ගෙහං, කරණලද ගෘහයයි.
ත-බ. දණ්ඩීහි. දණ්ඩීහි පුරිසෙහි, දඬුගත් පුරුෂයන් විසින්; කතානි ගෙහානි, කරණලද ගෘහයෝයි.
ක-එ. දණ්ඩිනා පුරිසෙන, දඬුගත් පුරුෂයා කරණකොට; ගෙහං කරොමි, ගෙයක්කරමි.
ක-බ. දණ්ඩීහි. දණ්ඩීහි පුරිසෙහි, දඬුගත් පුරුෂයන් කරණකොට; විහාරං කරොම, විහාරයක්කරමු.
ච-එ. දණ්ඩිනො. දණ්ඩිස්ස පුරිසස්ස, දඬුගත් පුරුෂයාට; දණ්ඩං දදමි, දඬක් දෙමි.
ච-බ. දණ්ඩීනං පුරිසානං,දඬුගත් පුරුෂයන්ට; දණ්ඩෙදදම,දඬුදෙමු.
පං-එ. දණ්ඩිනා. දණ්ඩිම්හා. දණ්ඩිස්මා පුරිසස්මා, දඬුගත් පුරුෂයා කෙරෙන්; භයං ජායතෙ, භය හටගණී,
පං-බ. දණ්ඩීහි. දණ්ඩීහි පුරිසෙහි, දඬුගත් පුරුෂයන්කෙරෙන්; භයානි ජායන්ති. භය හටගණීත්.
ඡ-එ. දණ්ඩිනො. දණ්ඩිස්ස පුරිසස්ස, දඬුගත් පුරුෂයාගේ; බලං බලයයි.
ඡ-බ. දණ්ඩීනං පුරිසානං, දඬුගත් පුරුෂයන්ගේ; බලානි, බලයෝයිං
ස-එ. දණ්ඩිනි. දණ්ඩිම්හි. දණ්ඩිස්මිං පුරිසස්මිං, දඬුගත් පුරුෂයා කෙරෙහි; මෙ චිත්තං න රමති, මාගේ සිත නො ඇලෙයි.
ස-බ. දණ්ඩීසු. දණ්ඩීසු පුරිසෙසු, දඬුගත් පුරුෂයන් කෙරෙහි; එ, කච්චෙ න රමන්ති, සමහරුන් නො ඇලෙත්.

දණ්ඩී ශබ්දයෙන් දඬුගත්තවුන් කියත්.
'ඊකාරන්තා' ඊකාරාන්තයි.'

—— 00 ——

ප්‍ර-ඒ. භික්ඛු, භික්ෂුතෙම; ධම්මං දෙසෙති, දහම්දෙසයි.

ප්‍ර-බ. භික්ඛවො. භික්ඛූ. භික්ෂුහුතුමු; ධම්මං දෙසෙන්ති, දහම්දෙසත්.

ආ-ඒ. (හෙ) භික්ඛු, (පින්වත්) භික්ෂුව; ධම්මං දෙසෙහි, දහම්දෙසව.

ආ-බ. (භවන්තො) භික්ඛවෙ. භික්ඛවො. භික්ඛූ, (පින්වත්) භික්ෂූනි; ධම්මං දෙසෙථ, දහම්දෙසව්.

දු-ඒ. භික්ඛුං, භික්ෂුව; වන්දාමි, වඳිමි.

දු-බ. භික්ඛවො. භික්ඛූ, භික්ෂූන්; වන්දාම, වඳිමු.

තෘ-ඒ. භික්ඛුනා, භික්ෂුව විසින්; රක්ඛිතං සීලං, රක්නාලද සීලයයි.

තෘ-බ. භික්ඛුභි. භික්ඛුහි, භික්ෂූන්විසින්; සීලානි රක්ඛියන්තෙ, සිල්රක්ෂාකරණුලැබෙත්.

කා-ඒ. භික්ඛුනා, භික්ෂුවකරණකොට; සග්ගං ගමිස්සාමි, ස්වර්ගයට යන්නෙමි.

කා-බ. භික්ඛුභි. භික්ඛුහි, භික්ෂූන්කරණකොට; සප්පුරිසධම්මෙ පතිට්ඨාම, සත්පුරුෂ ධර්මයෙහි පිහිටමු.

ච-ඒ. භික්ඛුනො. භික්ඛුස්ස, භික්ෂුවට; දානං දදාමි, දානයක් දෙමි.

ච-බ. භික්ඛූනං, භික්ෂූන්ට; පරික්ඛාරානි දදාම, පිරිකරදෙමු.

පං-ඒ භික්ඛුනා. භික්ඛුම්හා. භික්ඛුස්මා, භික්ෂුවකෙරෙන්; ධම්මං සුණාමි, බණ අසමි.

පං-බ. භික්ඛුභි. භික්ඛුහි, භික්ෂූන්කෙරෙන්; ධම්මංසුණාම, බණඅසමු.

ෂ-ඒ. භික්ඛුනො. භික්ඛුස්ස, භික්ෂුවගේ; පත්තො, පාත්‍රයයි.

ෂ-බ. භික්ඛූනං, භික්ෂූන්ගේ; පත්තා, පාත්‍රයෝයි.

ස-ඒ. භික්ඛුම්හි. භික්ඛුස්මිං, භික්ෂුවකෙරෙහි; පසීදති, පහදියි.

ස-බ. භික්ඛූසු. භික්ඛුසු, භික්ෂූන්කෙරෙහි; පසීදන්ති, පහදිත්.

'භික්ඛු' ශබ්දයෙන් භික්ෂූන්කියත්.

---

ප්‍ර-ඒ. ජන්තු, සත්වතෙම; ජීවති, ජීවත්වෙයි.

ප්‍ර-බ. ජන්තූ. ජන්තවො. ජන්තුනො. ජන්තුයො, සත්වයෝතුමු; ජීවන්ති, ජීවත්වෙත්.

ආ-ඒ. (හෙ) ජන්තු, (පින්වත්) සත්වය; පාපං නකරොහි, පව් නොකරව.

ආ-බ. (භවන්තො) ජන්තූ. ජන්තවො. ජන්තුනො. ජන්තුයො, (පින්වත්) සත්වයිනි; පාපානි නකරොථ, පව් නොකරව්.

දු-ඒ. ජන්තුං, සත්වයා; පස්ස, බලව.

දු-බ. ජන්තූ. ජන්තවො. ජන්තුනො. ජන්තුයො, සත්වයන්; පස්සථ, බලව්.

ත-එ. ජන්තුනා, සත්‍වයාවිසින්; කතං පුඤ්ඤං, කරණලද පින්යි.
ත-බ. ජන්තුහි. ජන්තුහි, සත්‍වයන් විසින්; කතානි පුඤ්ඤානි, කර ණලද පුණ්‍යයෝයි.
ක-එ. ජන්තුනා, සත්‍වයාකරණකොට; දුක්ඛං පාපුනාති, දුකට පැ මිණෙයි.
ක-බ. ජන්තුහි. ජන්තුහි, සත්‍වයන් කරණකොට; දුක්ඛං පාපුනන්ති දුකටපැමිණෙත්.
ච-එ. ජන්තුනො. ජන්තුස්ස, සත්‍වයාට; පුඤ්ඤං දදමි; පින්දෙමි.
ච-බ. ජන්තූනං, සත්‍වයන්ට; පුඤ්ඤානිදදම, පින්දෙමු.
පං-එ ජන්තුනා. ජන්තුම්හා. ජන්තුස්මා, සත්‍වයාකෙරෙන්; භයං උ ප්පජ්ජති, භය උපදියි.
පං-බ. ජන්තුහි. ජන්තුහි, සත්‍වයන්කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්.
ඡ-එ. ජන්තුනො. ජන්තුස්ස, සත්‍වයාගේ; පඤ්චක්ඛන්ධො, පඤ්චස්ක න්ධයයි.
ඡ-බ. ජන්තූනං, සත්‍වයන්ගේ; පඤ්චක්ඛන්ධා, පඤ්චස්කන්ධයෝයි.
ස-එ. ජන්තුම්හි. ජන්තුස්මිං, සත්‍වයාකෙරෙහි; පසීදති, පහදියි.
ස-බ. ජන්තුසු. ජන්තූසු, සත්‍වයන්කෙරෙහි; පසීදන්ති, පහදිත්.

## 'ජන්තු' ශබ්දයෙන් සත්‍වයන් කියත්.

ප-එ. සත්ථා, ශාස්තෘතෙම්; පරිනිබ්බායි, පිරිනිවීයේය.
ප-බ. සත්ථාරො, ශාස්තෲහුතුමූ; පරිනිබ්බායිංසු, පිරිනිවියාහුයි.
ආ-එ. (හෙ) සත්ථ. සත්ථා, (පින්වත්) ශාස්තෲන්වහන්ස; ධම්මං දෙ සෙති, දහම් දෙසව්.
ආ-බ. (භවන්තො) සත්ථාරො, (පින්වත්) ශාස්තෲවරයිනි; ධම්මංදෙ සෙථ, දහම්දෙසව්.
දු-එ. සත්ථාරං, ශාස්තෘව; වන්දාමි, වඳිමි.
දු-බ. සත්ථාරෙ. සත්ථාරො, ශාස්තෲන්; වන්දාම, වඳිමු.
ත-එ. සත්ථාරා, ශාස්තෘව විසින්; දෙසිතො ධම්මො, දෙසනලද ධර් මයයි.
ත-බ. සත්ථාරෙහි. සත්ථාරෙහි, ශාස්තෲන්විසින්; දෙසිතා ධම්මා, දෙ සනලද ධර්මයෝයි.
ක-එ. සත්ථාරා, ශාස්තෘව කරණකොට; සුඛීහොමි, සුවපත්වෙමි.
ක-බ. සත්ථාරෙහි. සත්ථාරෙහි, ශාස්තෲන්කරණකොට; සුඛීහොම, සුවපත්වමු.

ච-ඒ. සත්ථු. සත්ථුනො. සත්ථුස්ස, ශාස්තෘවට; භික්ඛං දදාමි, භික්ෂාව දෙමි.

ච-බ. සත්ථාරානං. සත්ථානං, ශාස්තෘන්ට; භික්ඛං දදාම, භික්ෂාව දෙමු.

පං-ඒ සත්ථාරා, ශාස්තෘව් කෙරෙන්; පභානිච්ඡරති, ප්‍රභානික්මෙයි.

පං-බ සත්ථාරෙහි. සත්ථාරෙභි, ශාස්තෘන් කෙරෙන්: පභානිච්ඡරන්ති, ප්‍රභානික්මෙත්.

ඡ-ඒ. සත්ථු. සත්ථුනො. සත්ථුස්ස, ශාස්තෘවගේ; පාදෙ වන්දාමි, පාවඳිමි.

ඡ-බ. සත්ථාරානං. සත්ථානං, ශාස්තෘන්ගේ; පාදෙ වන්දාම, පාවඳිමු,

ස-ඒ. සත්ථරි, ශාස්තෘව කෙරෙහි; චිත්තං පසීදති, සිත පහදියි.

ස-බ. සත්ථාරෙසු, ශාස්තෘන් කෙරෙහි; චිත්තානි පසීදන්ති, සිත් පහදිත්.

'සත්ථු' ශබ්දයෙන් ශාස්තෘන් කියත්.

---

ප-ඒ. නත්තා, මුනුබුරු තෙම; කීළති, ක්‍රීඩාකරයි.

ප-බ. නත්තාරො, මුනුබුරෝ තුමූ; කීළන්ති, ක්‍රීඩාකරත්.

ආ-ඒ. (හෙ) නත්ත. නත්තා, (පින්වත්) මුනුබුරය; සිප්පං උග්ගණ්හ, සිල්ප උගණුව.

ආ-බ. (භවන්තො) නත්තාරො, (පින්වත්) මුනුබුරෙනි; සිප්පානි උග්ගණ්හථ, සිල්ප උගණිව්.

දු-ඒ. නත්තාරං, මුනුබුරා; පොසෙති, පොෂ්‍යකරයි.

දු-බ. නත්තාරෙ. නත්තාරො, මුනුබුරන්; පොසෙන්ති, පොෂ්‍යකරත්.

ත-ඒ. නත්තාරා, මුනුබුරා විසින්; කතො විහාරො, කරණලද විහාරයයි.

ත-බ. නත්තාරෙහි. නත්තාරෙභි, මුනුබුරන් විසින්: කතානි පීඨානි, කරණලද ඇඳපුටුයි.

ක-ඒ. නත්තාරා, මුනුබුරා කරණකොට; ජීවති, ජීවත්වෙයි.

ක-බ. නත්තාරෙහි. නත්තාරෙභි, මුනුබුරන් කරණකොට; ජීවන්ති, ජීවත් වෙත්.

ච-ඒ. නත්තු. නත්තුනො. නත්තුස්ස, මුනුබුරාට; ඛෙත්තං දදාමි, කෙතක් දෙමි.

ච-බ. නත්තාරානං. නත්තානං, මුනුබුරන්ට; ඛෙත්තානි දදාම, ක්ෂෙත්‍ර දෙමු.

පං-ඒ. නත්තාරා, මුනුබුරා කෙරෙන්; න විරමාමි, වෙන්නොවෙමි.

පං-බ. නත්තාරෙහි. නත්තාරෙභි, මුනුබුරන් කෙරෙන්; න විරමාම, වෙන්නොවෙමු.

ඡ-එ. නත්තු. නත්තුනො: නත්තුස්ස, මුනුබුරාගේ; ජනනී, මෑනී යොය.

ඡ-බ. නත්තාරානං. නත්තානං, මුනුබුරන්ගේ; භාතරා, සහෝදරයෝයි.

ස-එ. නත්තරි, මුනුබුරාකෙරෙහි; සිනෙහො උපපජ්ජති, සෙනහය උපදියි.

ස-බ. නත්තාරෙසු, මුනුබුරන් කෙරෙහි; සිනෙහා උපපජ්ජන්ති, සෙනහ උපදිත්.

**'නත්තු' ශබ්දයෙන් මුනුබුරන් කියත්.**

---

ප-එ. පිතා, පියතෙම; පුත්තං රක්ඛති, පුත්‍රයා රකී.

ප-බ. පිතරො, පිතෘහුතුමූ; පුත්තෙ රක්ඛන්ති, පුත්‍රයන් රකිත්.

ආ-එ. (හෙ) පිත. පිතා, (පින්වත්) පිය; චිරං ජීව, කලක් ජීවත්වව.

ආ-බ. (භවන්තො) පිතරො, (පින්වත්) පියවරුනි; චිරං ජීවථ, කලක් ජීවත්වව්.

දු-එ. පිතරං, පියා; පොසෙති, පොෂ්‍යකරයි.

දු-බ. පිතරෙ. පිතරො, පියන්; පොසෙන්ති, පොෂ්‍යකරත්.

ත-එ. පිතරා, පියාවිසින්; කතං ගෙහං, කරණලදගෙයයි.

ත-බ, පිතරෙහි. පිතරෙභි. පිතූහි. පිතුභි, පියන්විසින්; කතානි ගෙහානි, කරණලද ගෘහයෝයි.

කා-එ. පිතරා, පියාකරණකොට; ජීවාමි, ජීවත් වෙමි,

කා-බ. පිතරෙහි. පිතරෙභි. පිතූහි. පිතුභි, පියන්කරණකොට; ජීවාම; ජීවත්වෙමු;

ච-එ. පිතු. පිතුනො. පිතුස්ස, පියාට; අන්නපානං දදාමි, ආහාරපාන දෙමි.

ච-බ. පිතරානං. පිතානං. පිතූනං, පියන්ට, අන්නපානෙ දදාම, ආහාරපාන දෙමු;

පං-එ. පිතරා, පියාකෙරෙන්; නිවිරමාමි, වෙන්නොවෙමි;

පං-බ. පිතරෙහි. පිතරෙභි. පිතූහි. පිතුභි, පියන්කෙරෙන්; නිවිරමාම, වෙන්නොවෙමු;

ඡ-එ. පිතු. පිතුනො. පිතුස්ස, පියාගේ; ඛෙත්තවත්ථුං, කෙත්වත්ය.

ඡ-බ. පිතරානං, පිතානං. පිතූනං, පියන්ගේ; ඛෙත්තවත්ථූනි, කෙත්වත්හුයි.

ස-එ. පිතරි, පියාකෙරෙහි; ගාරවං කරණීයං, ගෞරවකටයුත්තේය.

ස-බ. පිතරෙසු. පිතූසු, පියන්කෙරෙහි; සක්කරොථ, සත්කාර කරව්.

**'පිතු' ශබ්දයෙන් පියන්කියත්.**

---

ප-එ. භාතා, භ්‍රාතෘව තෙම; ඛීරං පිබති, කිරිබොයි.
ප-බ. භාතරො, භ්‍රාතෘහු තුමූ; ඛීරානි පිබන්ති, කිරිබොත්.
ආ-එ. (හෙ) භාත, භාතා, (පින්වත්) භ්‍රාතෘව; මාතාපිතරං පොසෙහි, මව්පියන් පොෂ්‍යකරව.
ආ-බ. (භවන්තො) භාතරො, (පින්වත්) භ්‍රාතෘනි; මාතාපිතරං පොසෙථ, මව්පියන් පොෂ්‍යකරව්.
දු-එ. භාතරං, භ්‍රාතෘව; රක්ඛාමි, රකිමි.
දු-බ. භාතරෙ භාතරො, භ්‍රාතෘන්; රක්ඛාම රකිමු.
ත-එ: භාතරා, භ්‍රාතෘව විසින්; කථිතං එතං, මෙය කියනලදි.
ත-බ. භාතරෙභි. භාතරෙහි භාතුභි. භාතුහි, භ්‍රාතෘන් විසින්; කථිතන්තියාමෙන ගච්ඡථ, කී ක්‍රමයෙන් යව්.
ක-එ. භාතරා, භ්‍රාතෘව කරණකොට; සුඛීජාතො පරිජනො. පිරිවර ජනතෙමේ සුවපත්වූයේය.
ක-බ. භාතරෙභි. භාතරෙහි. භාතුභි. භාතුහි, භ්‍රාතෘන් කරණකොට; විවාදුප්පන්නා, විවාද උපන්නාහ.
චි-එ. භාතු. භාතුනො. භාතුස්ස, භ්‍රාතෘවට: වත්ථංදදාමි, වස්ත්‍රයක් දෙමි.
ච-බ. භාතරානං භාතානං. භාතූනං, භ්‍රාතෘන්ට; වත්ථානි දදාම; වස්ත්‍රදෙමු.
පං-එ. භාතරා, භ්‍රාතෘවකෙරෙන්, පුච්ඡිත්වා ජානිස්සසි, විචාරා දැනගන්නෙහිය.
පං-බ. භාතරෙභි. භාතරෙහි. භාතුභි. භාතුහි, භ්‍රාතෘන් කෙරෙන් පුච්ඡිත්වා ජානිස්සථ. විචාරා දැනගණිව්.
ඡ-එ. භාතු. භාතුනො. භාතුස්ස, භ්‍රාතෘවගේ; ඛෙත්තවත්ථුං, කෙත්වත්ය.
ඡ-බ. භාතරානං භාතානං. භාතූනං, භ්‍රාතෘන්ගේ; ඛෙත්තවත්ථූනි, කෙත්වත්හුයි.
ස-එ. භාතරි, භ්‍රාතෘවකෙරෙහි; පෙමං උප්පජ්ජති, ප්‍රේමය උපදියි.
ස-බ. භාතරෙසු. භාතුසු, භ්‍රාතෘන් කෙරෙහි, වෙරං න කරොථ, වෛර නොකරව්.

"භාතු" ශබ්දයෙන් භ්‍රාතෘන් කියත්.

ඌකාරන්තා, උකාරන්තයි.

---

ප-එ. අභිභූ, මැඩපවත්වන්නාහු තෙම; ගච්ඡති, යෙයි.
ප-බ. අභිභුවො. අභිභූ, මැඩපවත්වන්නාහු තුමූ; ගච්ඡන්ති, යෙත්.

ආ-ඒ. (හෙ) අභිභූ, (පින්වත්) මැඩපවත්වන තැනැත්ත; මං පාල ය, මා රක්‍ෂාකරව.

ආ-බ. (භවන්තො) අභිභුවො. අභිභූ, (පින්වත්) මැඩපවත්වන තැනැත්තනි; අම්හෙ පාලෙථ, අප රක්‍ෂාකරව්.

දු-ඒ. අභිභුං, මැඩපවත්වන්නහු; වන්‍දාමි, වදිමි.

දු-බ. අභිභුවො. අභිභූ, මැඩපවත්වන්නවුන්; වන්‍දාම, වඳිමු.

තෘ-ඒ. අභිභුනා, මැඩපවත්වන්නහු විසින්; දෙසිතො ධම්මො, දෙසනලද ධර්‍මයයි.

තෘ-බ. අභිභූහි. අභිභූහි, මැඩපවත්වන්නවුන් විසින්; දෙසිතා ධම්මා, දෙසනලද ධර්‍මයෝයි.

කා-ඒ. අභිභුනා, මැඩපවත්වන්නහු කරණකොට; ලොකො සුවරති, ලොකයතෙමේ සඟපත්ව හැසිරෙයි.

කා-බ. අභිභූහි. අභිභූහි, මැඩපවත්වන්නවුන් කරණකොට; ලොකා සුචරන්ති, ලොකයෝතුමූ යහපත්ව හැසිරෙත්;

ච-ඒ. අභිභුනො. අභිභුස්ස, මැඩපවත්වන්නහුට; පූජං දදමි, මල ක්දෙමි.

ච-බ. අභිභූනං, මැඩපවත්වන්නවුන්ට; පූජානි දදම, මල්දෙමු.

පං-ඒ අභිභුනා. අභිභුම්හා. අභිභුස්මා, මැඩපවත්වන්නහු කෙරෙන්; භයං න උප්පජ්ජති, භය නූපදියි.

පං-බ. අභිභූහි. අභිභූහි, මැඩපවත්වන්නවුන් කෙරෙන්; භයානි න උප්පජ්ජන්ති, භය නූපදිත්.

ෂ-ඒ. අභිභුනො. අභිභුස්ස, මැඩපවත්වන්නහුගේ; ගෙහං, ගෙයයි;

ෂ-බ. අභිභූනං, මැඩපවත්වන්නවුන්ගේ; ගෙහානි, ගෘහයෝයි.

ස-ඒ. අභිභුම්හි. අභිභුස්මිං, මැඩපවත්වන්නහු කෙරෙහි; පසන්නො ප්‍රසන්නවූයේය.

ස-බ. අභිභූසු, මැඩපවත්වන්නවුන් කෙරෙහි; පසන්නා, ප්‍රසන්න වූවාහ.

'අභිභූ' ශබ්දයෙන් මැඩපවත්වන්නවුන් කියත්.

---

ප-ඒ. සබ්බඤ්ඤූ, සර්‍වඥතෙම්; ධම්මංදෙසෙති, ධර්‍මදෙසනාකෙරෙයි.

ප-බ. සබ්බඤ්ඤුනො. සබ්බඤ්ඤූ, සර්‍වඥවරයෝතුමූ; ධම්මං දෙසෙන්ති, ධර්‍මදෙසනාකෙරෙත්.

ආ-ඒ. (හෙ) සබ්බඤ්ඤූ, (පින්වත්) සර්‍වඥය; ධම්මනාවං මෙ දද, දහම් නැව මටදෙව.

ආ-බ. (භවන්තො) සබ්බඤ්ඤුනො. සබ්බඤ්ඤූ, (පින්වත්) සර්‍වඥයෙනි; ධම්මනගරං මාපෙථ, දහම්නුවරක් මවව්.

දු-ඒ. සබ්බඤ්ඤුං, සර්‍වඥයන්වහන්සේ; දස්සනාය ආගතො, දැකීම පිණිසගියේය.

දු-බ. සබ්බඤ්ඤුනො. සබ්බඤ්ඤූ, සර්‍වඥයන්වහන්සේලා; රත්තිං දිවං සරාම, රෑ දවල් සිහිකරමු.

තෘ-එ. සබ්බඤ්ඤුනා, සර්වඥයන්වහන්සේ විසින්; දෙවබ්‍රහ්මානං දෙසිතො ධම්මො, දිව්‍යබ්‍රහ්මයන්ට දේශනාකරණලද ධර්මයයි;

තෘ-බ, සබ්බඤ්ඤූහි. සබ්බඤ්ඤූභි, සර්වඥයන්වහන්සේලා විසින්; නිරයග්ගිනිබ්බාපිතා, නරකාග්නිනිවන ලද්දාහුය;

කෘ-එ. සබ්බඤ්ඤුනා, සර්වඥයන්වහන්සේ කරණකොට; සුඛිතො භික්ඛු සංඝො, භික්ෂුසංඝතෙමේ සුවපත්වූයේය;

කෘ-බ. සබ්බඤ්ඤූහි. සබ්බඤ්ඤූභි, සර්වඥයන්වහන්සේලා කරණකොට; පමුදිතාලොකා, ප්‍රමුදිතවූ ලොවැස්සෝය;

ච-එ. සබ්බඤ්ඤුනො. සබ්බඤ්ඤුස්ස, සර්වඥයන්වහන්සේට; දානං දදාමි, දන්දෙමි;

ච-බ. සබ්බඤ්ඤූනං, සර්වඥයන්වහන්සේලාට; දානං දදාම, දන්දෙමු;

පං-එ සබ්බඤ්ඤුනා. සබ්බඤ්ඤුම්හා. සබ්බඤ්ඤුස්මා, සර්වඥයන්වහන්සේ කෙරෙන්; කිලෙසො පහීනො, ක්ලේශය තෙමේ ප්‍රහීණවූයේය.

පං-බ. සබ්බඤ්ඤූහි. සබ්බඤ්ඤූභි, සර්වඥයන්වහන්සේලාකෙරෙන්; ඡරංසියො නිච්ඡරන්ති, ෂට්වර්ණරශ්මිහු නික්මෙත්;

ජ-එ. සබ්බඤ්ඤුනො. සබ්බඤ්ඤුස්ස, සර්වඥයන්වහන්සේගේ; සබ්බඤ්ඤුතඤ්ඤාණං, සර්වඥතාඥානයයි;

ජ-බ. සබ්බඤ්ඤූනං, සර්වඥයන්වහන්සේලාගේ; සමතිංසපාරමියො සමත්‍රිංසත්පාරමීහුයි·

ස-එ. සබ්බඤ්ඤුම්හි. සබ්බඤ්ඤුස්මිං, සර්වඥයන්වහන්සේ කෙරෙහි; ගාරවං කරොමි, ගෞරවකරමි;

ස-බ. සබ්බඤ්ඤූසු, සර්වඥයන්වහන්සේලා කෙරෙහි; ගාරවං කරොම, ගෞරවකරමු;

'සබ්බඤ්ඤු' ශබ්දයෙන් සර්වඥයන් කියත්.

ඕකාරන්තා, ඕකාරාන්තයි

---

ප-එ. ගො, ගෙරිතෙම; තිණං ඛාදති, තෘණ කයි;

ප-බ. ගාවො, ගෙරීහුතුමු; තිණානි ඛාදන්ති, තෘණ කත්;

ආ-එ. (භො) ගො, (පින්වත්) ගෙරිය; කථං ජීවිස්සසි. කෙසේ ජීවත් වන්නෙහිද;

ආ-බ. (භවන්තො) ගාවො, (පින්වත්) ගෙරීනි; කථං ජීවිස්සථ, කෙසේ ජීවත්වන්නාහුද;

දු-එ. ගාවුං ගාවං ගවං, ගෙරියා; පරියෙසිතුං ගතො; සොයන්ට ගියේය;

දු-බ. ගාවො, ගෙරීන්; පරියෙසිතුං ගතා, සොයන්ට ගියාහු;

**ත-එ.** ගාවේන ගවේන, ගෙරියා විසින්; ආනීතසකටං, ගෙනෙන ලද ගැලයි

**ත-බ.** ගොහි. ගොහි, ගෙරින් විසින්; ආනිතසකටානි, ගෙනෙන ලද ගැල්හුයි;

**ක-එ.** ගාවෙන. ගවෙන, ගෙරියාකරණකොට; ජිවිකංකප්පෙති, ජිවිකාවකරයි;

**ක-බ.** ගොහි. ගොහි, ගෙරින්කරණකොට; ජිවිකං කප්පෙනති, ජිවිකාව කරත්;

**ච-එ.** ගාවස්ස. ගවස්ස, ගෙරියාට; තිණංදදාමි; තණදෙමි;

**ච-බ.** ගවං. ගුන්නං, ගොනං, ගෙරින්ට, තිණානිදදාමි, තණදෙමු;

**පං-එ.** ගාවා. ගවා. ගාවම්හා. ගවම්හා. ගාවස්මා. ගවස්මා, ගෙරියා කෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි;

**පං-බ.** ගොහි. ගොහි, ගෙරින් කෙරෙන්; භයානි උප්පජ්ජනති, භය උපදිත්;

**ඡ-එ.** ගාවස්ස. ගවස්ස, ගෙරියාගේ; සිඞ්ගං, අඟයි;

**ඡ-බ.** ගවං. ගුන්නං. ගොනං, ගෙරින්ගේ; සිඞ්ගානි, ශෘඞ්ගයෝයි;

**ස-එ.** ගාවෙ. ගවෙ. ගාවම්හි. ගවම්හි. ගාවස්මිං. ගාවස්මිං, ගෙරියා කෙරෙහි; කොනප්පසීදති, කවරෙක් නොපහදීද;

**ස-බ.** ගාවෙසු. ගවෙසු. ගොසු, ගෙරින් කෙරෙහි, කොනප්පසීදනති, කවරෙක්හු නොපහදිද්ද;

**'ගො' ශබ්දයෙන් ගෙරින් කියත්.**

**ඔකාරයෙනා, ඔකාරයතයි.**

පුලලිඞ්ගා, පුමලිඟුයි;

---

**ප-එ.** කඤ්ඤා, කන්‍යාස්ත්‍රීතොම; පචති, පිසයි;

**ප-බ.** කඤ්ඤා. කඤ්ඤායො, කන්‍යාස්ත්‍රීහුතුමු; පචනති, පිසත්;

**ආ-එ.** (හෙ) කඤ්ඤෙ, (පින්වත්) කන්‍යාස්ත්‍රිය; දානංදෙහි, දන් දෙව;

**ආ-බ.** (භොති) කඤ්ඤා. කඤ්ඤායො, (පින්වත්) කන්‍යාස්ත්‍රිනි, සීලං රකඛථ, සිල්රකිව්;

**දු-එ.** කඤ්ඤං, කන්‍යාස්ත්‍රිය, නපස්සාමි, නොදකිමි;

**දු-බ.** කඤ්ඤා. කඤ්ඤායො, කන්‍යාස්ත්‍රීන්; නපස්සාම, නොදකිමු;

**ත-එ.** කඤ්ඤාය, කන්‍යාස්ත්‍රිය විසින්; කතං භොජනං, කරණලද ආහාරයයි;

**ත-බ.** කඤ්ඤාහි. කඤ්ඤාභි, කන්‍යාස්ත්‍රීන් විසින්; කතානි භොජනානි, කරණලද ආහාරයෝයි;

**ක-ඒ.** කඤ්ඤය, කන්‍යාස්ත්‍රිය කරණකොට; සීලං භිජ්ජති, සිල් බිඳෙයි;

**ක-බ.** කඤ්ඤාහි. කඤ්ඤාභි, කන්‍යාස්ත්‍රීන් කරණකොට; සීලානි භිජ්ජන්ති, සිල් බිඳෙත්;

**ච-ඒ.** කඤ්ඤාය, කන්‍යාස්ත්‍රියට; චිත්තං නදෙහි, සිත නොදෙව;

**ච-බ.** කඤ්ඤානං, කන්‍යාස්ත්‍රීන්ට; චිත්තානි නදෙථ, සිත් නොදෙව්;

**පං-ඒ.** කඤ්ඤාය. කන්‍යාස්ත්‍රිය කෙරෙන්; සීලවන්තානං භයං උප්පජ්ජති, සිල්වතුන්ට භය උපදියි;

**පං-බ.** කඤ්ඤාහි. කඤ්ඤාභි, කන්‍යාස්ත්‍රීන් කෙරෙන්; සීලවන්තානං භයං උප්පජ්ජන්ති, සිල්වතුන්ට භය උපදිත්;

**ඡ-ඒ.** කඤ්ඤාය, කන්‍යාස්ත්‍රියගේ; මාතා, මවයි;

**ඡ-බ.** කඤ්ඤානං, කන්‍යාස්ත්‍රීන්ගේ; මාතරො මව්වරුයි;

**ස-ඒ.** කඤ්ඤායං. කඤ්ඤාය, කන්‍යාස්ත්‍රිය කෙරෙහි; නරමාමි; නොඇලෙමි;

**ස-බ.** කඤ්ඤාසු, කන්‍යාස්ත්‍රීන් කෙරෙහි; නරමාම, නොඇලෙමු;

**'කඤ්ඤා' ශබ්දයෙන් දසහැවිරිදි ස්ත්‍රීන් කියත්.**

**අකාරන්තා, ආකාරන්තයි;**

---

**ප-ඒ.** රත්ති, රාත්‍රිතොම; ජුණ්හාය විරොචති, සඳරැසින් බබලයි;

**ප-බ.** රත්තී. රත්තියො, රාත්‍රිහුතුමූ, ජුණ්හාය විරොචන්ති; සඳරැසින් බබලත්;

**ආ-ඒ.** (භෙ) රත්ති, (පින්වත්) රාත්‍රිය; ජුණ්හාය විරොච, සඳරැසින් බබලව;

**ආ-බ.** (භොති) රත්තී. රත්තියො (පින්වත්) රාත්‍රීනි; ජුණ්හාය විරොචථ, සඳරැසින් බබලව්;

**දු-ඒ.** රත්තිං, රාත්‍රිය; නඔලොකෙත්වා ධම්මං සුණාහි, නොබලාබණ අසව;

**දු-බ.** රත්තී. රත්තියො, රාත්‍රීන්; නඔලොකෙත්වා ධම්මං සුණාථ, නොබලාබණ අසව්;

**ත-ඒ.** රත්තියා. රත්‍යා, රාත්‍රිය විසින්; මඝො ආවුතො, මාඝීය වසන ලද්දේය;

**ත-බ.** රත්තීහි. රත්තීභි, රාත්‍රීන් විසින්; මඝා ආවුතා, මාඝීයෝ වසනු ලද්දුහ.

**ක-ඒ.** රත්තියා. රත්‍යා, රාත්‍රිය කරණකොට; චොරො චොරයති, සොරතෙම සොරකම්කරයි.

**ක-බ.** රත්තීහි. රත්තීභි, රාත්‍රීන් කරණකොට; චොරා චොරයන්ති, සොරු සොරකම්කරත්;

**ච-එ.** රත්තියා, රාත්‍රියට; දීපංදදාමි, පහණක් දෙමි;
**ච-බ.** රත්තීනං, රාත්‍රීන්ට; දීපංදදාම, පහන් දෙමු;
**පං-එ.** රත්‍යා රත්තියා, රාත්‍රිය කෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි;
**පං-බ.** රත්තීහි. රත්තීභි, රාත්‍රීන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්;
**ඡ-එ.** රත්තියා, රාත්‍රියගේ; මහන්තතා, මහත්බවයි;
**ඡ-බ.** රත්තීනං, රාත්‍රීන්ගේ; මහන්තතායො, මහත්බවයෝයි;
**ස-එ.** රත්‍යං. රත්තියං. රත්තාය. රත්තං. රත්තො. රත්තියා, රාත්‍රිය කෙරෙහි; සුරියො නපාතුභවති, සූර්‍ය්‍යතෙම පහළ නොවෙයි;
**ස-බ.** රත්තීසු, රාත්‍රීන් කෙරෙහි; උහුංකාරා ගොචරානි ගණ්හන්ති, බකමූණෝ ගොදුරු ගණිත්;

**'රත්ති' ශබ්දයෙන් රාත්‍රිය කියත්.**

**ඉකාරන්තා ඉකාරන්තයි.**

---

**ප-එ.** නදී, ගඟාතොම; පරිපුණ්ණං හොති, පිරුණේවෙයි;
**ප-බ.** නදී. නජ්ජො, නදියො, ගඟාවෝතුමූ; පරිපුණ්ණා භවන්ති, පිරුණාහුවෙත්;
**ආ-එ.** (භො) නදි, (පින්වත්) ගඟාව; උදකං දද, දියදෙව;
**ආ-බ.** (භොන්ති) නදී. නජ්ජො. නදියො, (පින්වත්) ගඟාවෙනි; උදකං දදථ, දියදෙව්;
**දු-එ.** (නදියං) නදිං, ගඟාව; පස්සාමි, බලමි;
**දු-බ.** නදී. නජ්ජො. නදියො, ගඟාවන්, පස්සාම, බලමු.
**ත-එ.** නජ්ජා. නදියා, ගඟාව විසින්; මනුස්සානං උපකාරො කතො, මිනුෂ්‍යයන්ට උපකාරකරණ ලද්දේය;
**ත-බ.** නදීහි නදීභි, ගඟාවන් විසින්, මනුස්සානං උපකාරා කතා, මිනුෂ්‍යයන්ට උපකාරකරණ ලද්දාහ.
**ක-එ.** නජ්ජා. නදියා, ගඟාව කරණකොට; ඛෙත්තං වපති, කෙත වපුරයි;
**ක-බ.** නදීහි. නදීභි. ගඟාවන් කරණකොට; ඛෙත්තානි වපන්ති, කෙත් වපුරත්;
**ච-එ.** නජ්ජා. නදියා, ගඟාවට; විසං න පක්ඛිප, විස නොදමව;
**ච-බ.** නදීනං, ගඟාවන්ට; විසං න පක්ඛිපථ, විස නොදමව්;
**පං-එ.** නජ්ජා. නදියා, ගඟාව කෙරෙන්; උදකං ගණ්හාමි, දියගණිමි;
**පං-බ.** නදීහි. නදීභි, ගඟාවන් කෙරෙන්; උදකං ගණ්හාම, දියගණිමු;

ඡ-එ. නජ්ජා. නදියා, ගඟාවගේ; මහන්තතා, මහත්බවයි;
ඡ-බ. නදීනං, ගඟාවන්ගේ; මහන්තත්තායො, මහත් බවයෝයි;
ස-එ. නජ්ජං, නදියං. නදියා, ගඟාවකෙරෙහි, මච්ඡො විචරති, මත්ස්‍යතෙම හැසිරෙයි;
ස-බ. නදීසු, ගඟාවන්හිකෙරෙහි; මච්ඡා විචරන්ති, මත්ස්‍යයෝ හැසිරෙත්;

**'නදී' ශබ්දයෙන් ගං යනු කියත්.**

**ඊකාරාන්තා, ඊකාරාන්තයි.**

---

ප-එ. යාගු, හුළුකැඳතෙම; ඛුදං හනති, ක්ෂුධාව නසයි;
ප-බ. යාගු යාගුයො, හුළුකැඳහුතුමු; ඛුදං හනන්ති, ක්ෂුධාව නසත්;
ආ-එ. (භෙ) යාගු, (පින්වත්) හුළුකැඳ; උදරග්ගිං හන, බඩගිනි නසව;
ආ-බ. (භොන්තො) යාගූ. යාගුයො, (පින්වත්) හුළුකැඳෙනි; උදරග්ගිං හනථ, බඩගිනි නසව්.
දු-එ. යාගුං, හුළුකැඳ; පිබාමි, බොමි;
දු-බ. යාගූ. යාගුයො, හුළුකැඳන්; පිබාම, බොමු;
ත-එ. යාගුනා, හුළුකැඳ විසින්; උදරග්ගි හඤ්ඤතෙ, බඩගිනි නසන ලද්දේය;
ත-බ. යාගූහි. යාගූභි, හුළුකැඳන් විසින්; උදරග්ගී හඤ්ඤා, බඩගිනි නසන ලද්දාහුය.
ක-එ. යාගුනා, හුළුකැඳ කරණකොට; ජිඝච්ඡං නාසෙති, බඩගිනි නසයි;
ක-බ. යාගූහි, යාගූභි; හුළුකැඳන් කරණකොට; ජිඝච්ඡං නාසෙන්ති, බඩගිනි නසත්.
ච-එ, යාගුයා, හුළුකැඳට; ලවණං දදාමි, ලුණු දෙමි;
ච-බ. යාගූනං; හුළුකැඳන්වලට; ලවණං දදාම, ලුණුදෙමු;
පං-එ. යාගුයා, හුළුකැඳකෙරෙන්; ධූමො අපෙති, දුම් පහවෙයි;
පං-බ. යාගූහි. යාගූභි, හුළුකැඳන්කෙරෙන්; ධූමා අපෙන්ති, දුම් පහවෙත්:
ඡ-එ. යාගුයා, හුළුකැඳගේ; උණ්හං, උණුයි,
ඡ-බ. යාගූනං, හුළුකැඳන්ගේ; මධුරත්තං, මධුරභාවයි;
ස-එ. යාගුයං, යාගුයා, හුළුකැඳකෙරෙහි; දොසො නත්ථි, දොසක් නැත්තේය;
ස-බ. යාගූසු, හුළුකැඳන්කෙරෙහි; දොසා නත්ථි, දොස් නැත්තාහුය.

**'යාගු' ශබ්දයෙන් හුළුකැඳ කියත්.**

---

ප-එ. මාතා, මවතොම; ජීවති, ජීවත්වෙයි.
ප-බ. මාතරො, මව්හුතුමු: ජීවන්ති, ජීවත්වෙත්.
ආ-එ. (භෙ) මාත. මාතා, (පින්වත්) මෑනියෙනි; චිරං ජීව, කලක් ජීවත්වව;

**ආ-බ.** (භොති) මාතරො, (පින්වත්) මෑණිවරුනි; චිරංජීවථ, කලක් ජීවත්වව්;
**දු-ඒ.** මාතරං, මව්; රක්ඛාමි, රකිමි;
**දු-බ.** මාතරෙ. මාතරො, මෑණිවරුන්. රක්ඛාම, රකිමු;
**ත-ඒ** මාතුයා, මවවිසින්; වඩ්ඪිතො පුත්තො, වඩනලද පුත්‍රයයි;
**ත-බ.** මාතරෙහි. මාතරෙභි, මෑණිවරුන් විසින්; වඩ්ඪිතා පුත්තා, වඩනලදපුත්‍රයෝයි;
**කා-ඒ.** මාතුයා, මවකරණකොට; පුත්තො ජීවති, පුත්‍රතෙම ජීවත්වෙයි.
**කා-බ.** මාතරෙහි. මාතරෙභි, මෑණිවරුන්කරණකොට; පුත්තා ජීවන්ති, පුත්‍රයෝ ජීවත්වෙත්;
**ච-ඒ.** මාතුයා, මවට; පුප්ඵං දදාමි, පින්දෙමි;
**ච-බ.** මාතරානං. මාතානං. මාතූනං, මෑණිවරුන්ට; පුප්ඵානි දදාම, පින්දෙමු.
**පං-ඒ.** මාතුයා, මවකෙරෙන්; භයං නත්ථි, භයනැත්තේය.
**පං-බ.** මාතරෙහි. මාතරෙභි, මෑණිවරුන් කෙරෙන්; භයානි නත්ථි, භයනැත්තාහ;
**ඡ-ඒ.** මාතුයා, මවගෙ; පෙමො ප්‍රේමයයි;
**ඡ-බ.** මාතරානං. මාතානං. මාතූනං; මෑණිවරුන්ගේ; පෙමා, ප්‍රේමයෝයි;
**ස-ඒ.** මාතරි, මවකෙරෙහි; සිනෙහො උප්පජ්ජති, සෙනහ උපදියි.
**ස-බ.** මාතරෙසු. මාතූසු, මෑණිවරුන් කෙරෙහි; සිනෙහා උප්පජ්ජන්ති, සෙනහයෝ උපදිත්;

**'මාතු' ශබ්දයෙන් මාතෘන් කියත්,**

**උකාරන්තා, උකාරන්තයි,**

---

**ප-ඒ.** ජම්බු, දඹතොම; විරොචති, බබලයි;
**ප-බ.** ජම්බූ. ජම්බුයො, ජම්බූහුතුමු; විරොචන්ති, බබලත්;
**ආ-ඒ.** (භො) ජම්බු, (පින්වත්) ජම්බුව; ඵලං දද, ගෙඩිදෙව;
**ආ-බ.** (භොන්ති) ජම්බූ. ජම්බුයො, (පින්වත්) ජම්බූනි, ඵලානි දෙථ, ගෙඩිදෙව්;
**දු-ඒ.** ජම්බුං, ජම්බුව; රොපෙමි, රෝපනය කරමි;
**දු-බ.** ජම්බූ. ජම්බුයො, ජම්බූන්, රොපෙම, රෝපනය කරමු;
**ත-ඒ.** ජම්බුයා, දඹවිසින්; ලක්ඛිතො දීපො, සලකුණුකරණලද දීපයයි
**ත-බ.** ජම්බූහි. ජම්බූභි, ජම්බූන්විසින්; ලක්ඛිතා දීපා, සලකුණු කරණලද දීපයෝයි;
**කා-ඒ.** ජම්බුයා, දඹකරණකොට; කොචි ජීවති, කිසිවෙක් ජීවත්වෙයි;
**කා-බ.** ජම්බූහි. ජම්බූභි, ජම්බූන්කරණකොට; කෙචි ජීවන්ති, කිසි වෙක්හු ජීවත්වෙත්;

ච-ඒ. ජම්බුයා, ජම්බුවට; කිංචිනපක්ඛිප, කිසිවක්නොදමව.
ච-බ. ජම්බූනං; ජම්බූන්ට; කිංචිනපක්ඛිපථ, කිසිවක්නොදමව්;
පං-ඒ. ජම්බුයා, දඹකෙරෙන්; රසංගණ්හාමි, රසයගණිමි;
පං-බ. ජම්බූහි. ජම්බූභි, ජම්බූන්කෙරෙන්; රසංගණ්හාම, රසගණිමු
ජ-ඒ. ජම්බුයා, ජම්බුවගේ; ලක්ඛණං, ලක්ෂණයයි.
ජ-බ. ජම්බූනං, ජම්බූන්ගේ; ලක්ඛණානි, ලක්ෂණයෝයි.
ස-ඒ. ජම්බුයං. ජම්බුයා, ජම්බුවකෙරෙහි; කුලාවකං කරොති, කූඩුවක්කරයි.
ස-බ. ජම්බූසු, ජම්බූන්කෙරෙහි; කුලාවකානිකරොන්ති, කූඩුකරත්;

'ජම්බු' ශබ්දයෙන් දඹ කියත්.

ඌකාරන්තා, ඌකාරන්තයි.

---

ඉත්ථිලිඞ්ගා, ස්ත්‍රී ලිඟුයි.

---

ප-ඒ. චිත්තං. චිත්තයතෙම; පරිසුද්ධං හොතු, පිරිසිදුවේවා,
ප-බ. චිත්තා. චිත්තානි, චිත්තයෝතුමූ; පරිසුද්ධාහොන්තු, පිරිසිදු වෙත්වා.
ආ-ඒ. (භෝ) චිත්ත. චිත්තා, (පින්වත්) චිත්තය; පාපංන චින්තෙහි, පව්නොසිතව;
ආ-බ. (භවන්තො) චිත්තානි, (පින්වත්) චිත්තයිනි;පාපංනචින්තෙථ පව්නොසිතව්.
දු-ඒ. චිත්තං, සිත; රක්ඛාමි, රකිමි;
දු-බ. චිත්තෙ. චිත්තානි; චිත්තයන්; රක්ඛාම, රකිමු,
ත-ඒ. චිත්තෙන, සිතවිසින්; කතං පාපං, කරණලද පාපයයි;
ත-බ. චිත්තෙහි. චිත්තෙභි, චිත්තයන් විසින්; කතානි පාපානි, කරණලද පාපයෝයි;
ක-ඒ. චිත්තෙන, සිතකරණකොට; විනස්සති, විනාසවෙයි;
ක-බ. චිත්තෙහි. චිත්තෙභි චිත්තයන්කරණකොට; විනස්සන්ති, විනාසවෙත්;
ච-ඒ. චිත්තාය. චිත්තස්ස, සිතට; ඔවාදංදදමි, අවවාදදෙමි.
ච-බ. චිත්තානං, චිත්තයන්ට; ඔවාදං දදම, අවවාදදෙමු;
පං-ඒ. චිත්තා. චිත්තම්හා. චිත්තස්මා, සිතකෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි;
ප-බ. චිත්තෙහි. චිත්තෙභි, චිත්තයන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්;
ජ-ඒ. චිත්තස්ස, සිතගේ; බලං, බලයයි;
ජ-බ. චිත්තානං, චිත්තයන්ගේ; බලානි, බලයෝයි.

ස-එ. චිත්තෙ. චිත්තම්හි. චිත්තස්මිං, සිතකෙරෙහි; කොධො උප්පජ්ජති, ක්‍රොධය උපදී.

ස-බ. චිත්තෙසු, චිත්තයන් කෙරෙහි; කොධා උප්පජ්ජන්ති, ක්‍රොධ උපදිත්;

**'චිත්ත' ශබ්දයෙන් සිත කියත්.**

---

ප-එ. මනං, සිත තෙම; පරිසුද්ධං හොති, පිරිසිදුවෙයි;

ප-බ. මනා මනානි, චිත්තයෝ තුමූ; පරිසුද්ධා හොන්ති, පිරිසිදුවෙත්;

ආ-එ. (හෙ) මන. මනා, (පින්වත්) සිත; භයං මා දෙහි, භය නොදෙව

ආ-බ. (භවන්තො) මනානි, (පින්වත්) චිත්තයිනි; භයං මා දෙථ; භය නොදෙව්.

දු-එ. මනං, සිත; රක්ඛාමි, රකිමි.

දු-බ. මනෙ. මනානි, චිත්තයන්; රක්ඛාම, රකිමු.

ත-එ. මනසා. මනෙන, සිතවිසින්; පාපං කතං, පව්කරණලදී.

ත-බ. මනෙභි. මනෙහි, චිත්තයන් විසින්; පාපානි කතානි, පව් කරණ ලද්දහ.

කා-එ. මනසා. මනෙන, සිතකරණකොට; විනස්සති, විනාසවෙයි.

කා-බ. මනෙභි. මනෙහි, චිත්තයන්කරණකොට; විනස්සන්ති, විනාසවෙත්

ච-එ. මනසො. මනස්ස, සිතට; ඔවාදං කරොහි, අවවාදකරව;

ච-බ. මනානං, චිත්තයන්ට; ඔවාදං කරොථ, අවවාදකරව්.

පං-එ. මනසා. මනම්හා. මනස්මා, සිතකෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි.

පං-බ. මනෙභි. මනෙහි, චිත්තයන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්.

ඡ-එ. මනසො. මනස්ස, සිතගේ; බලං, බලයයි;

ඡ-බ. මනානං, චිත්තයන්ගේ; බලානි, බලයෝයි;

ස-එ. මනසි. මනෙ. මනම්හි. මනස්මිං, සිතකෙරෙහි, කොධො උප්පජ්ජති. ක්‍රොධ උපදියි.

ස-බ. මනෙසු, චිත්තයන් කෙරෙහි; කොධා උප්පජ්ජන්ති, ක්‍රොධ උපදිත්.

**'මන' ශබ්දයෙන් මනස කියත්.**

---

ප-එ. ගුණවං නපුංසකං, ගුණවත් නපුංසක තෙම; ගච්ඡති. යයි;

ප-බ. ගුණවන්තා. ගුණවන්තානි නපුංසකානි, ගුණවත් නපුංසකයෝ තුමූ; ගච්ඡන්ති, යත්;

ආ-ඒ. (භො) ගුණවං. ගුණව. ගුණවා නපුංසක, (පින්වත්) ගුණවත් නපුංසකය; මාගච්ඡ, නොයැව.

ආ-බ. (භවන්තො) ගුණවන්තා. ගුණවන්තානි නපුංසකානි, (පින්වත්) ගුණවත් නපුංසකයෙනි; මාගච්ඡථ, නොයැවි;

දු-ඒ. ගුණවන්තං නපුංසකං, ගුණවත් නපුංසකයා, පස්ස, බලව,

දු-බ. ගුණවන්තෙ. ගුණවන්තානි නපුංසකානි, ගුණවත් නපුංසකයන්; පස්සථ, බලවු.

ත-ඒ. ගුණවතා. ගුණවන්තෙන නපුංසකෙන, ගුණවත් නපුංසකයා විසින්; කතො මග්ගො, කරනලද මාර්ගයයි;

ත-බ. ගුණවන්තෙහි. ගුණවන්තෙහි නපුංසකෙහි, ගුණවත් නපුංසකයන් විසින්; කතා මග්ගා, කරනලද මාර්ගයෝයි;

ක-ඒ. ගුණවතා. ගුණවන්තෙන නපුංසකෙන, ගුණවත් නපුංසකයා කරණකොට; භයං නත්ථි, භයක් නැත්තේය.

ක-බ. ගුණවන්තෙහි. ගුණවන්තෙහි නපුංසකෙහි, ගුණවත් නපුංසකයන් කරණකොට; භයානි නත්ථි, භය නැත්තාහුය;

ච-ඒ. ගුණවතො. ගුණවන්තස්ස නපුංසකස්ස, ගුණවත් නපුංසකයාට; වත්ථං දදාමි, වස්ත්‍රයක් දෙමි;

ච-බ. ගුණවතං. ගුණවන්තානං නපුංසකානං, ගුණවත් නපුංසකයන්ට; වත්ථානි දදාම, වස්ත්‍ර දෙමු;

පං-ඒ. ගුණවතා. ගුණවන්තම්හා. ගුණවන්තස්මා නපුංසකස්මා, ගුණවත් නපුංසකයා කෙරෙන්; භයං න උප්පජ්ජති, භය නූපදියි;

පං-බ. ගුණවන්තෙහි. ගුණවන්තෙහි නපුංසකෙහි, ගුණවත් නපුංසකයන් කෙරෙන්; භයානි න උප්පජ්ජන්ති, භය නූපදිත්;

ඡ-ඒ. ගුණවතො. ගුණවන්තස්ස නපුංසකස්ස, ගුණවත් නපුංසකයාගේ; ගුණං, ගුණයයි.

ඡ-බ. ගුණවතං. ගුණවන්තානං නපුංසකානං, ගුණවත් නපුංසකයන්ගේ; ගුණානි, ගුණයෝයි.

ස-ඒ. ගුණවති. ගුණවන්තෙ. ගුණවන්තම්හි. ගුණවන්තස්මිං නපුංසකස්මිං, ගුණවත් නපුංසකයා කෙරෙහි; කොරමති, කවරෙක් ඇලේද;

ස-බ. ගුණවන්තෙසු නපුංසකෙසු, ගුණවත් නපුංසකයන් කෙරෙහි; කෙරමන්ති, කවරෙක්හු ඇලෙද්ද;

**මෙසීන් ගුණවත් නපුංසකනාමයෙන් කියන්.**

---

ප-ඒ. ගච්ඡං නක්ඛත්තං, යන්නාවූ තාරකාවතෙම; නනිවත්තති, නොනවතියි;

ප-බ. ගච්ඡන්තා. ගච්ඡන්තානි නක්ඛත්තානි, යන්නාවූ තාරකාවෝතුමූ; නතිවත්තන්ති, නොනවතිත්.

ආ-එ. (හෙ) ගච්ඡං. ගච්ඡ. ගච්ඡානක්ඛත්ත, (පින්වත්) යන්නාවූ තාරකාව; අතිරොච, අතිශයින් බබලව;

ආ-බ. (භවන්තො) ගච්ඡන්තා. ගච්ඡන්තානි නක්ඛත්තානි, (පින්වත්) යන්නාවූ තාරකාවෙනි; අතිරෝචථ, අතිශයින් බබලව්;

දු-එ. ගච්ඡන්තං නක්ඛත්තං, යන්නාවූ තාරකාව; ඕලොකය, බලව;

දු-බ. ගච්ඡන්තෙ. ගච්ඡන්තානි නක්ඛත්තානි, යන්නාවූ තාරකාවන්; ඕලොකෙථ, බලව්.

ත-එ. ගච්ඡතා. ගච්ඡන්තෙන නක්ඛත්තෙන, යන්නාවූ තාරකාව විසින්; අන්ධකාරෝ හතො, අන්ධකාරය නසන ලද්දේය.

ත-බ. ගච්ඡන්තෙහි. ගච්ඡන්තෙහි නක්ඛත්තෙහි, යන්නාවූ තාරකාවන් විසින්; අන්ධකාරා හතා, අන්ධකාරයෝ නසන ලද්දාහු

ක-එ. ගච්ඡතා. ගච්ඡන්තෙන නක්ඛත්තෙන, යන්නාවූ තාරකාව කරණකොට; ඉට්ඨානිට්ඨඵලං ලභති, ඉෂ්ටානිෂ්ට ඵල ලබයි;

ක-බ. ගච්ඡන්තෙහි. ගච්ඡන්තෙහි නක්ඛත්තෙහි, යන්නාවූ තාරකාවන් කරණකොට, ඉට්ඨානිට්ඨ ඵලානි ලභන්ති, ඉෂ්ටානිෂ්ටඵල ලබත්.

ච-එ. ගච්ඡතො. ගච්ඡන්තස්ස නක්ඛත්තස්ස, යන්නාවූ තාරකාවට; කිං කරොති, කුමක්කරයිද?

ච-බ. ගච්ඡතං. ගච්ඡන්තානං නක්ඛත්තානං, යන්නාවූ තාරකාවන්ට; කිං කරොන්ති, කුමක්කරද්ද;

පං-එ. ගච්ඡතා. ගච්ඡන්තම්හා. ගච්ඡන්තස්මා නක්ඛත්තස්මා, යන්නාවූ තාරකාව කෙරෙන්; රංසිනිච්ඡරති රැසම් විහිදෙයි;

පං-බ. ගච්ඡන්තෙහි. ගච්ඡන්තෙහි නක්ඛත්තෙහි, යන්නාවූ තාරකාවන් කෙරෙන්; රංසියො නිච්ඡරන්ති, රසම්හු විහිදෙත්;

ඡ-එ. ගච්ඡතො. ගච්ඡන්තස්ස නක්ඛත්තස්ස, යන්නාවූ තාරකාවගේ; පසන්නතා, ප්‍රසන්න බවයි.

ඡ-බ. ගච්ඡතං. ගච්ඡන්තානං නක්ඛත්තානං, යන්නාවූ තාරකාවන්ගේ; පසන්නතායො, ප්‍රසන්නතාවයෝයි;

ස-එ. ගච්ඡති. ගච්ඡන්තෙ. ගච්ඡන්තම්හි. ගච්ඡන්තස්මිං නක්ඛත්තස්මිං, යන්නාවූ තාරකාව කෙරෙහි; රමති ඇලෙයි.

ස-බ. ගච්ඡන්තෙසු නක්ඛත්තෙසු යන්නාවූ තාරකාවන් කෙරෙහි; රමන්ති, ඇලෙත්;

**මෙසින් යන්නාවූ නපුංසක වාච්‍යයන් කියත්.**

අකාරන්තා, අකාරන්තයි,

———*———

**ප-එ.** අට්ඨි, ඇටයතෙම, ජීරති, දිරයි;
**ප-බ.** අට්ඨීනි. අට්ඨී, ඇට්හුතුමූ; ජීරන්ති, දිරත්.
**ආ-එ.** (භො) අට්ඨි, (පින්වත්) ඇටය; චිරං පවත්තතු, කලක් පවතීවා;
**ආ-බ.** (භවන්තො) අට්ඨීනි. අට්ඨී, (පින්වත්) අෂ්ටිනි; චිරං පවත්තන්තු, කලක් පවතිත්වා;
**දු-එ.** අට්ඨිං, ඇටය; න පස්සති, නොදකී.
**දු-බ.** අට්ඨීනි. අට්ඨී, ඇටයින් න පස්සන්ති, නොදකිත්
**තෘ-එ.** අට්ඨිනා, ඇටය විසින්; නිම්මිතං රූපං, නිර්මිතකරණලද රූපයයි;
**තෘ-බ.** අට්ඨීහි. අට්ඨීභි, ඇට විසින්; නිම්මිත සරීරානි, නිර්මිතකරණ ලද ශරීරයෝයි.
**ක-එ.** අට්ඨිනා, ඇටයකරණකොට; කම්මට්ඨානං භාවෙති, කර්මස්ථානය වඩයි;
**ක-බ.** අට්ඨීහි. අට්ඨීභි, ඇටකරණකොට; කම්මට්ඨානානි භාවෙන්ති, කර්මස්ථානයන් වඩත්.
**ච-එ.** අට්ඨිනො. අට්ඨිස්ස, ඇටයට; කිං කරොති, කුමක්කරයිද?
**ච-බ.** අට්ඨීනං, ඇටවලට; කිං කරොන්ති, කුමක්කරද්ද;
**පං-එ.** අට්ඨිනා. අට්ඨිම්හා. අට්ඨිස්මා, ඇටය කෙරෙන්; සාධිතං එතං, මෙය සාදන ලද්දේය;
**පං-බ.** අට්ඨීහි. අට්ඨීභි, අයපින්කෙරෙන්; සාධිතානි එතානි, මොවුහු සාදන ලද්දුහ.
**ඡ-එ.** අට්ඨිනො. අට්ඨිස්ස ඇටයගේ; සෙතවණ්ණං, සුභ්‍රවර්ණයයි.
**ඡ-බ.** අට්ඨීනං, අයපින්ගේ; සෙතවණ්ණානි, සුභ්‍රවර්ණයෝයි;
**ස-බ.** අට්ඨිනි. අට්ඨිම්හි. අට්ඨිස්මිං, ඇටය කෙරෙහි; ජිගුච්ඡති, පිළිකුල්කරයි;
**ස-බ.** අට්ඨීසු, අයපින් කෙරෙහි; ජිගුච්ඡන්ති, පිළිකුල්කරත්.

**'අට්ඨි' ශබ්දයෙන් ඇට කියත්.**

ඉකාරන්තයා, ඉකාරන්තයයි.

---

**ප-එ.** දණ්ඩි නපුංසකං, දඬුගත් නපුංසකතෙම්; ගච්ඡති, යෙයි;
**ප-බ.** දණ්ඩීනි, දණ්ඩී නපුංසකානි, දඬුගත් නපුංසකයෝතුමූ, ගච්ඡන්ති, යෙත්.
**ආ-එ.** (භො) දණ්ඩි නපුංසක, (පින්වත්) දඬුගත් නපුංසකය; මංපාලය, මාරක්ෂාකරව;
**ආ-බ.** (භවන්තො) දණ්ඩීනි. දණ්ඩී නපුංසකානි, (පින්වත්) දඬුගත් නපුංසකයෙනි; අම්හෙ පාලෙථ, අපරක්ෂා කරව්;

දු-ඒ. දණ්ඩිං නපුංසකං, දඬුගත් නපුංසකයා; නපස්සාමි, නොබලමි
දු-බ. දණ්ඩිනී. දණ්ඩි නපුංසකානි, දඬුගත් නපුංසකයන්; නපස්සාම, නොබලමු.
තෘ-ඒ. දණ්ඩිනා නපුංසකෙන, දඬුගත් නපුංසකයා විසින්; කතං ගෙහං, කරණලද ගෙයයි.
තෘ-බ. දණ්ඩිභි. දණ්ඩිහි නපුංසකෙහි, දඬුගත් නපුංසකයන් විසින්; කතානි ගෙහානි, කරණලද ගෘහයෝයි.
කා-ඒ. දණ්ඩිනා නපුංසකෙන, දඬුගත් නපුංසකයා කාරණකොට; අම්හාකං භයං අත්ථි, අපට භය ඇත්තේය.
කා-බ. දණ්ඩිභි. දණ්ඩිහි නපුංසකෙහි, දඬුගත් නපුංසකයන් කාරණකොට; තුම්හාකං භයං නත්ථි, තොපට භය නැත්තාහ.
ච-ඒ. දණ්ඩිනො. දණ්ඩිස්ස නපුංසකස්ස, දඬුගත් නපුංසකයාට; දණ්ඩං දදාමි, දඬක්දෙමි.
ච-බ. දණ්ඩිනං නපුංසකානං, දඬුගත් නපුංසකයන්ට; දණ්ඩෙ දදාම, දඬුදෙමු.
පං-ඒ. දණ්ඩිනා. දණ්ඩිම්හා. දණ්ඩිස්මා නපුංසකස්මා, දඬුගත් නපුංසකයා කෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි;
පං-බ. දණ්ඩිභි. දණ්ඩිහි නපුංසකෙහි, දඬුගත් නපුංසකයන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්.
ඡ-ඒ. දණ්ඩිනො. දණ්ඩිස්ස නපුංසකස්ස, දඬුගත් නපුංසකයාගේ; බලං, බලයයි,
ඡ-බ. දණ්ඩිනං නපුංසකානං, දඬුගත් නපුංසකයන්ගේ; බලානි, බලයෝයි.
ස-ඒ. දණ්ඩිනි. දණ්ඩිම්හි. දණ්ඩිස්මිං නපුංසකස්මිං, දඬුගත් නපුංසකයා කෙරෙහි; කොචි නරමති, කිසිවෙක් නොඇලෙයි;
ස-බ. දණ්ඩීසු නපුංසකෙසු, දඬුගත් නපුංසකයන් කෙරෙහි, කෙචි නරමන්ති, කිසිවෙක්හු නොඇලෙත්.

මෙසේ දඬු ඇති නපුංසකනාමයන් කියත්.
ඊකාරාන්තා, ඊකාරාන්තයි.

---

ප-ඒ. ආයු, ආයුස තෙම; පරිහායි, පිරිහුනේය;
ප-බ. ආයූනි. ආයූ, ආයුසයෝ තුමූ; පරිහායිංසු, පිරිහුනාහුය.
ආ-ඒ. (භො) ආයු, (පින්වත්) ආයුසය; චිරං පවත්තාහි, කලක් පවතිව.
ආ-බ. (භවන්තො) ආයූනි. ආයූ, (පින්වත්) ආයුසයිනි; චිරං පවත්තථ, කලක් පවතිත්වා.

ද්වි-ඒ. ආයුං, ආයුෂය; පාලෙති, පාලනය කරයි;
ද්වි-බ. ආයූනි. ආයූ, ආයුෂයන්; පාලෙන්ති, පාලනයකරත්.
තෘ-ඒ. ආයුනා, ආයුෂයාවිසින්; පවත්තිතං දෙහං, පවත්වනලද ශරීරයකි.
තෘ-බ. ආයූහි. ආයූභි, ආයුෂයන් විසින්; පවත්තිතදෙහානි, පවත් වනලද ශරීරයෝයි.
කා-ඒ. ආයුනා, ආයුෂයකරණකොට; ජීවති, ජීවත්වෙයි.
කා-බ. ආයූහි. ආයූභි, ආයුෂයන් කරණකොට; ජීවන්ති, ජීවත්වෙත්
ච-ඒ. ආයුනො. ආයුස්ස, ආයුෂයට; ථොමේති, ස්තුතිකරයි;
ච-බ. ආයූනං, ආයුෂයන්ට; ථොමෙන්ති, ස්තුතිකරත්.
පං-ඒ. ආයුනා. ආයුම්හා. ආයුස්මා, ආයුෂය කෙරෙන්; මුච්චාමි, මිදෙමි;
පං-බ. ආයූහි. ආයූභි, ආයුෂයන් කෙරෙන්, මුච්චාම, මිදෙමු.
ෂ-ඒ. ආයුනො. ආයුස්ස, ආයුෂයගේ; පමාණං, ප්‍රමාණයයි.
ෂ-බ. ආයූනං, ආයුෂයන්ගේ; පමාණානි, ප්‍රමාණයෝයි.
ස-ඒ. ආයුම්හි. ආයුස්මිං, ආයුෂය කෙරෙහි; කොනාඉච්ඡති, කව රෙක් නොකැමැතිවේද?
ස-බ. ආයූසු. ආයූසු, ආයුෂයන් කෙරෙහි; කොනාඉච්ඡන්ති, කව රෙක්හු නොකැමැතිවෙද්ද?

'ආයු' ශබ්දයෙන් ආශ්‍රිත කියක්.

උකාරන්තා, උකාරාන්තයි.

නපුංසකලිඞ්ගා, නපුංසකලිඞ්ගය;

---

ප්‍ර-ඒ. සබ්බොලොකො, සියළුලෝකයතෙම; විනස්සති විනාශවෙයි;
ප්‍ර-බ. සබ්බෙමනුස්සා, සියළු මනුෂ්‍යයෝතුමූ; විනස්සන්ති, විනාශ වෙත්.
ආ-ඒ. (භෝ) සබ්බ. සබ්බාලොක, (පින්වත්) සියළුලෝකය; නවිනස්සතු, විනාශනොවේවා,
ආ-බ. (භවන්තො) සබ්බෙමනුස්සා, (පින්වත්) සියළුමනුෂ්‍යයෙනි; නවිනස්සන්තු, විනාශනොවෙත්වා;
ද්වි-ඒ. සබ්බං ලොකං, සියළු ලෝකය; පූරෙත්වාඨිතො, පිරි සිටියේය;
ද්වි-බ. සබ්බෙමනුස්සා, සියළුමනුෂ්‍යයන්; පූරෙත්වාඨිතා, පිරිසිටියාහුය.
තෘ-ඒ. සබ්බෙනලොකෙන, සියළුලෝකය විසින්; පූජිතො, පුදන ලද්දේය.
තෘ-බ. සබ්බෙහි. සබ්බෙභි මනුස්සෙහි, සියළු මනුෂ්‍යයන් විසින්; පූජිතා, පුදනා ලද්දාහ;

තෘ-ඒ. සබ්බේන ලෝකේන, සියළු ලෝකයකරණකොට; සන්තාප මජ්ජති, සත්වෙනම ප්‍රමාදවේයි.

තෘ-බ. සබ්බේහි. සබ්බේහි මනුස්සේහි, සියළු මනුෂ්‍යයන් කරණකොට; භයං නාගච්ඡති, භයනොවෙත්.

ච-ඒ. සබ්බස්ස ලෝකස්ස, සියළුලෝකයට; අග්ගප්පත්තො අහෝසි, අග්‍ර ප්‍රාප්තවූයේය;

ච-බ. සබ්බේසං. සබ්බේසානං මනුස්සානං, සියළු මනුෂ්‍යයන්ට; ධනං අදාසි, වස්තු දුන්නේය;

පං-ඒ. සබ්බස්මා. සබ්බස්මා ලෝකස්මා. සියළු ලෝකය කෙරෙන්; විප්පමුත්තො, මිදුනේය.

පං-බ. සබ්බේහි. සබ්බේහි මනුස්සේහි, සියළු මනුෂ්‍යයන්; කෙරෙන්; විප්පමුත්තා, මිදුනාහුය.

ෂ-ඒ. සබ්බස්ස ලෝකස්ස, සියළු ලෝකයගේ; පරිමාණං නහොති, ප්‍රමාණයක් නැත්තේවෙයි.

ෂ-බ. සබ්බේසං. සබ්බේසානං මනුස්සානං, සියළු මනුෂ්‍යයන්ගේ; කිලේසා, කෙලෙසයෝයි.

ස-ඒ. සබ්බස්මිං. සබ්බස්මිං ලෝකස්මිං, සියළු ලෝකය කෙරෙහි; මෙත්ත චිත්තං භාවේති, මෛත්‍රීසිතවඩයි;

ස-බ. සබ්බේසු මනුස්සේසු, සියළු මනුෂ්‍යයන් කෙරෙහි; බ්‍රහ්මවිහාරං භාවෙන්ති, බ්‍රහ්මවිහරණය වඩත්;

පුල්ලිඞ්ගං, පුම්ලිංගයි,

---

ප-ඒ. සබ්බා පඨවි, සියළු පෘථිවීතොම; පකම්පති, කම්පාකරයි;

ප-බ. සබ්බා. සබ්බායො නාවායො. සියළුනාවුකාවෝතුමූ; ගච්ඡන්ති, යෙත්.

ආ-ඒ. (භෙ) සබ්බෙපඨවි, (පින්වත්) සියළු පෘථිවිය; චිරංතිට්ඨ, කලක් සිටිව;

ආ-බ. (භොති) සබ්බා. සබ්බායො නාවායො, (පින්වත්) සියළුනාවුකාවෙනි; චිරං තිට්ඨථ, කලක් සිටිත්වා.

දු-ඒ. සබ්බං පඨවිං, සියළු පෘථිවිය; විජේස්සති, ජයගන්නේය;

දු-බ. සබ්බා. සබ්බායො නාවායො, සියළු නාවුකාවන්; පරිසෙසන්ති, සොයත්;

තෘ-ඒ. සබ්බාය පඨවියා. සියළු පෘථිවිය විසින්; උපකාරොකතො උපකාරකරණ ලද්දේය.

තෘ-බ. සබ්බාහි. සබ්බාහි නාවාහි, සියළු නාවුකාවන් විසින්; ලද්ධූපකාරා, ලබණලද උපකාරයෝයි.

**ක-එ.** සබ්බාය පඨවියා, සියළු පෘථිවිය කරණකොට; සත්තො ජීවති, සත්වතෙම ජීවත්වෙයි;

**ක-බ.** සබ්බාහි. සබ්බාහි නාවාහි, සියළුනාවුකාවන් කාරණකොට; වණිජ්ජං කරොන්ති, වෙළඳත්කරත්;

**ච-එ.** සබ්බස්සා. සබ්බාය පඨවියා, සියළු පෘථිවියට; ඉස්සරො, ඊශ්වරයි.

**ච-බ.** සබ්බාසං. සබ්බාසානං නාවානං, සියළු නාවුකාවන්ට, භණ්ඩං දදන්ති, බඩුදෙත්;

**පං-එ.** සබ්බාය පඨවියා, සියළු පෘථිවිය කෙරෙන්; රතනානි උප්පජ්ජන්ති, රත්නයෝ උපදිත්.

**පං-බ.** සබ්බාහි. සබ්බාහි නාවාහි, සියළු නාවුකාවන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්.

**ඡ-එ.** සබ්බස්සා. සබ්බාය පඨවියා, සියළු පෘථිවියගේ; විසාලතා, විසාලබවයි.

**ඡ-බ.** සබ්බාසං. සබ්බාසානං නාවානං, සියළු නාවුකාවන්ගේ; ධජපන්තියො සොභන්ති, ධජපන්තිහු ශොබිත්;

**ස-එ.** සබ්බස්සං. සබ්බායං පඨවියං, සියළු පෘථිවිය කෙරෙහි; පංසු විජ්ජන්ති, පස්පවතියි;

**ස-බ.** සබ්බාසු නාවාසු, සියළුනාවුකාවුන් කෙරෙහි; මනුස්සා වසන්ති මිනිස්සුවෙසෙත්;

ඉත්ථිලිඞ්ගං, ඉතිරිලිඟුයි,

---

**ප-එ.** සබ්බං අන්තලික්ඛං, සියළු අහසතෙම; භාසති, බබලයි;

**ප-බ,** සබ්බානිරතනානි, සියළු රතනයෝතුමු; විරොචන්ති බබලත්;

**ආ-එ.** (හෙ) සබ්බ. සබ්බා අන්තලික්ඛ, (පින්වත) සියළු අහස; වස්සං වස්සතු: වැසිවසීවා;

**ආ-බ.** (භවන්තො) සබ්බානිරතනානි, (පින්වත්) සියළු රතනයෙනි; පජ්ජලන්තු, දිලිසෙත්වා;

**දු-එ.** සබ්බං අන්තලික්ඛං, සියළු අහස; ඡාදෙති, වසයි;

**දු-බ.** සබ්බානිරතනානි, සියළුරතනයන්; පරියෙසන්ති, සොයත්;

**ත-එ.** සබ්බෙන අන්තලික්ඛෙන, සියළු අහසවිසින්; ආලොකො කතො, එලියකරණ ලද්දේය;

**ත-බ.** සබ්බෙහි. සබ්බෙහිරතනෙහි, සියළු රතනායන් විසින්; පූරිත ගබ්භානි, පූරවනලද ගබ්ඩාවෝයි:

**කා-එ.** සබ්බෙන අන්තලික්ඛෙන, සියළු අහසකරණකොට; පක්ඛිචරන්ති, පක්ෂි හැසිරෙයි;

ක-බ. සබ්බෙහි. සබ්බෙහි රතනෙහි, සියළු රත්නයන් කරණකොට; ජ්වලන්ති, ජ්වලිත්වෙත්.

ච-එ. සබ්බස්ස අන්තලික්ඛස්ස, සියළු අහසට; කොචි අවකාසංකති, කිසිවෙක් අවකාශකරයි;

ච-බ. සබ්බෙසං. සබ්බෙසානං නාවානං, සියළු නාවුකාවන්ට; තණ්හා උප්පජ්ජන්ති, තෘෂ්ණා උපදිත්.

පං-එ. සබ්බස්මා. සබ්බස්මා අන්තලික්ඛස්මා; සියලු අහසකෙරෙන්; වස්සං වස්සති, වැසිවටි;

පං-බ. සබ්බෙහි. සබ්බෙහි රතනෙහි, සියළු රත්නයන් කෙරෙන්, කායපිකාසං කාරොන්ති, ගේහුදෙශ්‍ය කරත්.

ඡ-එ. සබ්බස්ස අන්තලික්ඛස්ස, සියළු අහසගේ; නිම්මලභාවො, නිම්මල බවයි;

ඡ-බ. සබ්බෙසං. සබ්බෙසානං රතනානං, සියළු රත්නයන්ගේ; මහග්ඝභාවො මහඝී භාවයෝති;

ස-එ. සබ්බස්මිං. සබ්බස්මිං අන්තලික්ඛස්මිං, සියළු අහසකෙරෙහි; චන්ද සූරිය තාරකායො විචරන්ති, චන්ද්‍රසූර්‍ය්‍ය තාරකාවෝ හැසිරෙත්;

ස-බ. සබ්බෙසු රතනෙසු, සියළු රත්නයන් කෙරෙහි; චිත්තානි රමන්ති, සිත් ඇලෙත්;

**නපුංසකලිඞ්ගං, නපුංසකලිඟුයි,**

**'සබ්බ' ශබ්දයෙන් සියල්ල කියත්,**

---

ප-එ. පුබ්බකාලො, පූර්වකාලයතෙම; අතික්කන්තො, ඉක්මුනේය

ප-බ. පුබ්බකාලා, පූර්වකාලයෝතුමූ; අතික්කන්තානි, ඉක්මුනාහුය

ආ-එ. (භො) පුබ්බ. පුබ්බකාල, (පින්වත්) පූර්වකාලය; චිරං පවත්තතු කලක් පවතීවා.

ආ-බ. (භවන්තො) පුබ්බකාලා, (පින්වත්) පූර්වකාලයෙනි; චිරං පවත්තන්තු, කලක් පවතිත්වා.

දු-එ. පුබ්බකාලං, පූර්වකාලය; නපස්සති, නොදකී;

දු-බ. පුබ්බකාලෙ, පූර්වකාලයන්; නපස්සන්ති, නොදකිත්;

ත-එ. පුබ්බකාලෙන, පූර්වකාලය විසින්; යොජිතො, යොදන ලද්දේය.

ත-බ. පුබ්බෙහි. පුබ්බෙහි කාලෙහි, පූර්වකාලයන් විසින්: යොජිතානි, යොදන ලද්දාහුය.

ක-එ. පුබ්බකාලෙන, පූර්වකාලය කරණකොට; පුඤ්ඤං අකරි, පින්කළේය.

ක-බ. පුබ්බෙහි. පුබ්බෙහි කාලෙහි, පූර්වකාලයන් කරණකොට; පුඤ්ඤානි අකාරිංසු, පිංකළාහුය;

ච-එ. පුබ්බස්ස කාලස්ස, පූර්වකාලයට; කොවිනරහති, කිසිමෙක් ගහණීකරයි;

ච-බ. පුබ්බෙසං. පුබ්බෙසානං කාලානං, පූර්වකාලයන්ට; කෙපිගර ගහනි, කිසිවෙක්හු ගහණීකරන්.

පං-එ. පුබ්බා. පුබ්බම්හා. පුබ්බස්මා කාලස්මා, පූර්වකාලය කෙරෙන්; කිං පයොජනං, කවර ප්‍රයොජනද;

පං-බ. පුබ්බෙහි. පුබ්බෙභි කාලෙහි, පූර්වකාලයන් කෙරෙන්; පයොජනං නලභන්ති, ප්‍රයොජන නොලබත්;

ඡ-එ. පුබ්බස්ස කාලස්ස, පූර්වකාලයගේ; දීඝතා, දික්බවයි;

ඡ-බ. පුබ්බෙසං. පුබ්බෙසානං කාලානං, පූර්වකාලයන්ගේ; පරිමාණං නත්ථි, පමණ නැත්තේය

ස-එ. පුබ්බෙ. පුබ්බම්හි. පුබ්බස්මිං කාලස්මිං, පූර්වකාලයෙහි; දීපංකරොනාම සත්ථා ලොකෙ උප්පජ්ජි, දීපංකරනම් ශාස්තෘන් වහන්සේ ලොකයෙහි උපන්සේක;

ස-බ. පුබ්බෙසු කාලෙසු, පූර්වකාලයන්හි; අට්ඨවීසති චක්කවත්තී රාජානො අහෙසුං, අටවිසිදෙනෙක් චක්‍රවර්ති රජදරුවෝ වූවාහුය.

පුල්ලිඞ්ගං, පුල්ලිංගයි,

---

ප-එ. පුබ්බාදිසා, පූර්වදිශාතොමෝ; විරොචති, බබලයි;

ප-බ. පුබ්බා. පුබ්බායොදිසායො, පූර්වදිශාවෝතුමූ; විරොචන්ති බබලත්;

ආ-එ. (භො) පුබ්බාදිසා,(පින්වත්)පූර්වදිශාව;ආලොකංදද, එළියදෙව;

ආ-බ. (භොන්ති) පුබ්බා. පුබ්බායොදිසායො, (පින්වත්) පූර්වදිශාවෙනි; ආලොකං දදථ, එළියදෙව්;

ද-එ. පුබ්බංදිසං, පූර්වදිශාව; විලොකෙති, බලයි;

ද-බ. පුබ්බා. පුබ්බායොදිසායො, පූර්වදිශාවන්, විලොකෙන්ති,බලත්;

ත-එ. පුබ්බායදිසාය, පූර්වදිශාව විසින්; අන්ධකාරොකතො, අන්ධකාර කරණලද්දේය.

ත-බ. පුබ්බාහි. පුබ්බාහිදිසාහි, පූර්වදිශාවන් විසින්; අන්ධකාරාකතා, අන්ධකාරකරණලද්දහ.

ක-එ. පුබ්බායදිසාය, පූර්වදිශාව කරණකොට; මග්ගං ජානාති මාර්ගය දනියි;

ක-බ. පුබ්බාහි. පුබ්බාහිදිසාහි, පූර්වදිශාවන් කරණකොට; මග්ගං ජානන්ති, මාර්ගයදනිත්.

ච-ඒ. පුබ්බස්සා· පුබ්බායදිසාය, පූර්වදිශාවට; අභිමුඛො භවති, අභිමුඛවෙයි;

ච-බ. පුබ්බාසං. පුබ්බාසානං දිසානං, පූර්වදිශාවන්ට; අභිමුඛා භවන්ති, අභිමුඛවූවාහුවෙත්;

පං-ඒ. පුබ්බායදිසාය, පූර්වදිසාවකෙරෙන්; සුරියො උදෙති, සූය්‍යී තෙම පහළවෙයි;

පං-බ. පුබ්බාහි. පුබ්බාහිදිසාහි, පූර්වදිශාවන් කෙරෙන්; චන්දසුරියා උදෙන්ති, චන්ද්‍රසූය්‍යීයෝ තුමූ පහළවෙත්.

ඡ-ඒ. පුබ්බස්සා. පුබ්බායදිසාය, පූර්වදිශාවගේ; නිම්මලභාවො, නිර්මලබවයි;

ඡ-බ. පුබ්බාසං. පුබ්බාසානං දිසානං, පූර්ව දිශාවන්ගේ; නිම්මලතා, නිර්මලතාවයොයි;

ස-ඒ. පුබ්බස්සං. පුබ්බායං දිසායං, පූර්වදිශාවකෙරෙහි; පුබ්බවිදෙහො පතිට්ඨිතො, පූර්වවිදෙහය පිහිටියේය;

ස-බ. පුබ්බාසුදිසාසු, පූර්වදිශාවන් කෙරෙහි; වාසංකරොන්ති, වාසය කරත්.

ඉත්ථිලිඞ්ගං, ඉතිරිලිඟුයි,

---

ප-ඒ. පුබ්බං චිත්තං, පූර්වචිත්තයතෙම; උප්පජ්ජති, උපදියි;

ප-බ. පුබ්බානි චිත්තානි, පූර්වචිත්තයෝතුමූ; උප්පජ්ජන්ති, උපදිත්.

ආ-ඒ. (භො) පුබ්බ. පුබ්බචිත්ත, (පින්වත්) පූර්වචිත්තය; තිට්ඨාහි, තෝ සිටුව.

ආ-බ. (භවන්තො) පුබ්බානිචිත්තානි, (පින්වත්) පූර්වචිත්තයිනි; තුම්හෙ තිට්ඨථ, තොපි සිටිව්;

දු-ඒ. පුබ්බං චිත්තං, පූර්වචිත්තය, රක්ඛති, රකියි;

දු-බ. පුබ්බානි චිත්තානි, පූර්වචිත්තයන්; රක්ඛන්ති, රකිත්;

ත-ඒ. පුබ්බෙන චිත්තෙන, පූර්වචිත්තය විසින්; කතං පුඤ්ඤං, කරණලද පිණයි;

ත-බ. පුබ්බෙහි. පුබ්බෙහි චිත්තෙහි, පූර්වචිත්තයන් විසින්; කතානි පුඤ්ඤානි, කරණලද පුණ්‍යයෝයි;

ක-ඒ. පුබ්බෙන චිත්තෙන, පූර්වචිත්තයකාරණකොට; ජාතං සරීරං, හටගත් ශරීරයයි;

ක-බ. පුබ්බෙහි. පුබ්බෙහි චිත්තෙහි, පූර්වචිත්තයන් කාරණකොට; ජාතානි සරීරානි, හටගත් ශරීරයෝයි;

ච-ඒ, පුබ්බස්ස චිත්තස්ස, පූර්වචිත්තයට; උපද්දවං කරොති, උපද්‍රව කරයි;

ච-බ. පුබ්බෙසං. පුබ්බෙසානං චිත්තානං, පූර්වචිත්තයන්ට; උපද්දවා නිකරොන්ති, උපද්‍රවකරත්.

පං-එ. පුබ්බම්හා. පුබ්බස්මා චිත්තස්මා, පූර්වචිත්තය කෙරෙන්; න අපෙති, පහනොවෙයි;

පං-බ. පුබ්බෙහි. පුබ්බෙහි චිත්තෙහි, පූර්වචිත්තයන් කෙරෙන්; න අපෙන්ති, පහනොවෙත්.

ඡ-එ. පුබ්බස්ස චිත්තස්ස, පූර්වචිත්තයාගේ; සුඛුමභාවො, සියුම්බවයි;

ඡ-බ. පුබ්බෙසං. පුබ්බෙසානං චිත්තානං, පූර්වචිත්තයන්ගේ; සුඛුම භාවා, සූක්ෂ්ම භාවයෝයි;

ස-එ. පුබ්බම්හි. පුබ්බස්මිං චිත්තස්මිං, පූර්වචිත්තය කෙරෙහි; පාපධම්මා විජ්ජන්ති, පාපධර්මය විද්‍යමානවෙයි.

ස-බ. පුබ්බෙසු චිත්තෙසු, පූර්වචිත්තයන් කෙරෙහි; ලොභාදයො කිලෙසා උප්පජ්ජන්ති, ලොභාදීවූ කෙලෙශයෝ උපදිත්;

නපුංසකලිඞ්ගං, නපුංසකලිඟුයි,

**'පුබ්බ' ශබ්දයෙන් පූර්ණ කියන්.**

---

ප-එ. එකො පුරිසො, සමහර පුරුෂයෙක්තෙම; ගච්ඡති, යෙයි;

ප-බ. එකෙ පුරිසා, සමහරපුරුෂයෝතුමූ; ගච්ඡන්ති, යෙත්;

දු-එ. එකං පුරිසං සමහර පුරුෂයෙක්; පස්සාමි, බලමි;

දු-බ. එකෙපුරිසෙ, සමහර පුරුෂයන්; පස්සාම, බලමු.

තෘ-එ. එකෙන පුරිසෙන, සමහර පුරුෂයකු විසින්; ගෙහං කතං, ගෙයක් කරණලදි;

තෘ-බ. එකෙහි. එකෙහි පුරිසෙහි, සමහර පුරුෂයන් විසින්; ගෙහා කතා, ගෙවල් කරණ ලද්දහුය;

කා-එ. එකෙන පුරිසෙන, සමහර පුරුෂයෙකු කරණකොට; සුඛං ලභාමි, සැපලබමි;

කා-බ. එකෙහි. එකෙහි පුරිසෙහි, සමහර පුරුෂයන් කරණකොට; සුඛානිලභාම, සැපලබමු;

ච-එ. එකස්ස පුරිසස්ස, සමහර පුරුෂයෙකුට; වත්ථං දදාමි, වස්ත්‍ර යක් දෙමි.

ච-බ. එකෙසං. එකෙසානං පුරිසානං, සමහර පුරුෂයන්ට; වත්ථානි දදාම, වස්ත්‍රදෙමු.

පං-එ. එකම්හා. එකස්මා පුරිසස්මා, සමහර පුරුෂයෙකු කෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි;

පං-බ. එකෙහි. එකෙහි පුරිසෙහි, සමහර පුරුෂයන් කෙරෙන්, භයානි උප්පජ්ජන්ති, භය උපදිත්;

ඡ-එ. එකස්ස පුරිසස්ස, සමහර පුරුෂයකුගේ; බලං, බලයයි;
ඡ-බ. එකෙසං. එකෙසානං පුරිසානං, සමහර පුරුෂයන්ගේ; බලානි බලයෝයි.
ස-එ. එකම්හි. එකස්මිං, පුරිසස්මිං, සමහර පුරුෂයෙක් කෙරෙහි; රමති, ඇලෙයි;
ස-බ. එකෙසු පුරිසෙසු, සමහර පුරුෂයන් කෙරෙහි; රමන්ති, ඇලෙත්.

පුල්ලිඞ්ගං, පුල්ලිඟයි,

---

ප-එ. එකා ඉත්ථි, සමහර ස්ත්‍රියක්තොම; සරීරං අලංකරොති, ශරීරය අලංකාරකරයි;
ප-බ. එකා. එකායො ඉත්ථියො, සමහර ස්ත්‍රීහුතුමූ; සරීරානි අලංකරොන්ති, ශරීර අලංකාර කරත්.
දු-එ. එකං ඉත්ථිං, සමහර ස්ත්‍රියක්; නපස්සති, නොදකියි;
දු-බ. එකා. එකායො ඉත්ථියො, සමහර ස්ත්‍රීන්; නපස්සන්ති, නොදකිත්.
ත-එ. එකාය ඉත්ථියා, සමහර ස්ත්‍රියක් විසින්; ඔදනො පච්චතෙ, බත පිසනුලැබේ;
ත-බ. එකාහි. එකාහි ඉත්ථිහි, සමහර ස්ත්‍රීන්විසින්; ඔදනා පච්චන්තෙ, බත් පිසනුලැබෙත්.
ක-එ. එකායඉත්ථියා, සමහරස්ත්‍රියක් කරණකොට; සීලං භින්දති, සිල්බිඳෙයි;
ක-බ. එකාහි. එකාහි ඉත්ථිහි, සමහර ස්ත්‍රීන්කරණකොට; සීලානි භිජ්ජන්ති, සිල්බිඳෙත්.
ච-එ. එකිස්සා එකාස්සා. එකායඉත්ථියා, සමහර ස්ත්‍රියෙකුට; අන්නං දදමි, ආහරයක් දෙමි;
ච-බ. එකාසං. එකාසානං ඉත්ථීනං, සමහර ස්ත්‍රීන්ට; අන්නං දදම, ආහරදෙමු.
පං-එ. එකායඉත්ථියා, සමහරස්ත්‍රියක් කෙරෙන්; සීලවන්තානං භයං උප්පජ්ජති, සිල්වතුන්ට භය උපදියි;
පං-බ. එකාහි. එකාහි ඉත්ථිහි, සමහර ස්ත්‍රීන් කෙරෙන්, සීලවන්තානං භයං උප්පජ්ජන්ති. සිල්වතුන්ට භයඋපදිත්.
ඡ-එ එකිස්සා එකස්සා. එකායඉත්ථියා, සමහරස්ත්‍රියකගේ, මාතා, මවයි;
ඡ-බ. එකාසං. එකාසානං ඉත්ථීනං, සමහර ස්ත්‍රීන්ගේ; මාතරො, මව්වරුයි.
ස-එ. එකස්සං. එකායං ඉත්ථියං, සමහර ස්ත්‍රියක් කෙරෙහි; රමති, ඇලෙයි;

ස-බ. එකාසු ඉත්ථීසු, සමහර ස්ත්‍රීන් කෙරෙහි; රමන්ති, ඇලෙත්.

ඉත්ථිලිඞ්ගං, ඉත්ථිලිඞ්ගයි,

———※———

ප-ඒ. එකං කුලං, සමහර කුලයක්තෙම; විජ්ජති, විද්‍යමානවෙයි,

ප-බ. එකෙ. එකානිකුලානි, සමහරකුලයෝතුමූ; විජ්ජන්ති, විද්‍යමානවෙත්,

දු-ඒ. එකං කුලං, සමහර කුලයකට; සඞ්ගහං කරොති, සංග්‍රහකරයි,

දු-බ. එකෙ. එකානිකුලානි, සමහරකුලයන්ට; සඞ්ගහං කරොන්ති; සංග්‍රහකරත්.

ත-ඒ. එකෙනකුලෙන, සමහරකුලයක් විසින්; මනුස්සානං උපකාරො කතො, මිනිසුන්ට උපකාරකරණ ලද්දෙය;

ත-බ. එකෙහි. එකෙහිකුලෙහි, සමහරකුලයන් විසින්; මනුස්සානං උපකාරාකතා, මිණිසුන්ට උපකාර කරණලද්දෑය;

ක-ඒ. එකෙන කුලෙන, සමහරකුලයක් කරණකොට; වසාමි, වාසයකරමි;

ක-බ. එකෙහි. එකෙහි කුලෙහි, සමහර කුලයන් කරණකොට; වසාම, වෙසෙමු.

ච-ඒ. එකස්සකුලස්ස, සමහර කුලයකට; පසංසති, ප්‍රශංසාකරයි;

ච-බ. එකෙසං. එකෙසානං කුලානං, සමහර කුලයන්ට; පසංසන්ති ප්‍රශංසාකරත්.

පං-ඒ. එකම්හා. එකස්මා කුලස්මා, සමහර කුලයක් කෙරෙන්; භයං ජායතෙ, භයහටගණියි,

පං-බ. එකෙහි. එකෙහි කුලෙහි, සමහරකුලයන් කෙරෙන්; භයානි ජායන්තෙ, භය හටගණිත්.

ඡ-ඒ. එකස්ස කුලස්ස, සමහරකුලයක්හුගේ; මහන්තතා, මහත්බවයි;

ඡ-බ. එකෙසං. එකෙසානං කුලානං, සමහර කුලයන්ගේ; මහන්තතායො, මහත් භාවයොයි;

ස-ඒ. එකම්හි. එකස්මිං කුලස්මිං, සමහර කුලයක් කෙරෙහි; චිත්තං රමති, සිත ඇලෙයි;

ස-බ. එකෙසු කුලෙසු, සමහර කුලයන් කෙරෙහි; චිත්තානි රමන්ති සිත් ඇලෙත්;

නපුංසකලිඞ්ගං නපුංසකලිඟුයි.

'එක' ශබ්දයෙන් සංඛ්‍යාය, අතුල්‍යය, අසහාය, අන්‍යයයන අර්ථසතරක් කියත්.

---

මෙහින් සංඛ්‍යාවාචක තැන එකවචනයි. සෙසු තන්හි සර්වවචනයි.

---

**ප**-ඒ. යො රාජා, යම් රජෙක්තෙම; රජ්ජං කාරෙති, රාජ්‍යයකරවයි;
**ප**-බ. යෙ රාජානො, යම් රජදරුවෝතුමූ; රජ්ජං කාරෙන්ති, රාජ්‍යයකරවත්;
**දු**-ඒ. යං රාජං, යම්රජෙක්; සෙවති, සේවනයකරයි;
**දු**-බ. යෙ රාජානො, යම්රජදරුවන්, සෙවන්ති, සේවනය කරත්.
**තෘ**-ඒ. යෙන රාජෙන, යම් රජෙක් විසින්; නගරං කාරාපිතං, නුවරක් කරවනලදී.
**තෘ**-බ. යෙහි. යෙභි රාජෙහි, යම්රජදරුවන් විසින්; නගරානි කාරාපිතානි, නුවරවල් කරවන ලද්දුහ.
**ක**-ඒ. යෙන රාජෙන, යම්රජෙක් කාරණකොට; ජීවිකං කප්පෙති, ජීවිකාව කරයි,
**ක**-බ. යෙහි. යෙභි රාජෙහි, යම් රජදරුවන් කාරණකොට; ජීවිකං කප්පෙන්ති, ජීවිකාවකරත්.
**ච**-ඒ. යස්සරාජස්ස, යම්රජෙකුට; පණ්ණාකාරං දදාති, පඬුරුදෙයි;
**ච**-බ. යෙසං. යෙසානං රාජානං, යම් රජදරුවන්ට; පණ්ණාකාරානි දදන්ති, පඬුරුදෙත්;
**පං**-ඒ. යම්හා. යස්මා රාජස්මා, යම්රජෙක් කෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි;
**පං**-බ. යෙහි. යෙභි රාජෙහි, යම් රජදරුවන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්.
**ඡ**-ඒ. යස්සරාජස්ස, යම්රජෙකුගේ; කිරීටං, ඔටුන්නයි;
**ඡ**-බ. යෙසං. යෙසානං රාජානං, යම්රජදරුවන්ගේ: සත්තවිධ රතනානි සප්තවිධරත්නයෝයි.
**ස**-ඒ. යම්හි. යස්මිං රාජස්මිං, යම්රජෙක් කෙරෙහි; චිත්තං පසීදති, සිතපහදී;
**ස**-බ. යෙසු රාජෙසු, යම් රජදරුවන් කෙරෙහි; චිත්තානි පසීදන්ති, සිත්පහදිත්.

පුල්ලිඞ්ගං, පුල්ලිඞ්ගයි;

---

**ප**-ඒ. යා වනිතා, යම් ස්ත්‍රියක්තොමෙ: පචති, පිසයි;
**ප**-බ. යා. යායො වනිතායො, යම්ස්ත්‍රීනුතුමූ; පචන්ති, පිසත්.
**දු**-ඒ. යං වනිතං, යම් ස්ත්‍රියක්; අද්දක්ඛි, දුටී;
**දු**-බ. යා. යායො වනිතායො, යම්ස්ත්‍රීන්; අද්දක්ඛිංසු, දුටුවාහුයි.
**තෘ**-ඒ. යාය වනිතාය, යම් ස්ත්‍රියක් විසින්; භොජනං සම්පාදිතං, බොජුන් සම්පාදනය කරණලදී.
**තෘ**-බ. යාහි. යාභි වනිතාහි, යම් ස්ත්‍රීන් විසින්; භොජනානි සම්පාදිතානි, බොජුන් සම්පාදනය කරණලද්දුහ.

ක-ඒ. යාය වනිතාය, යම් සත්‍රියක් කරණකොට; විපත්තිසමුප්පන්නා, විපත් උපන්නාය;

ක-බ. යාහි. යාහි වනිතාහි, යම් සත්‍රීන්කරණකොට; විපත්තියො සමුප්පන්නායො, විපත්තින් උපන්නාහ.

ච-ඒ. යස්සා. යාය වනිතාය, යම්සත්‍රියකට; පිළන්ධනං අදාසි, පළඳනාවක් දුන්නේය;

ච-බ. යාසං, යාසානං වනිතානං, යම්සත්‍රීන්ට; පිළන්ධනානි අදංසු, පළඳනා දුන්නාහුය.

පං-ඒ. යායවනිතාය, යම් සත්‍රියක් කෙරෙන්; පුරිසො අපගතො, පුරුෂයෙක් පහව ගියේය;

පං-බ. යාහි. යාහි වනිතාහි, යම්සත්‍රීන්කෙරෙන්; පුරිසා අපගතා, පුරුෂයෝ පහව ගියාහුය.

ඡ-ඒ. යස්සා. යාය වනිතාය, යම් සත්‍රියකගේ; පුත්තොහොති, පුත්‍රයෙක් වෙයි;

ඡ-බ. යාසං. යාසානං වනිතානං, යම් සත්‍රීන්ගේ; පුත්තා හොන්ති, පුත්‍රයෝවෙත්.

ස-ඒ. යස්සං. යායං වනිතායං, යම් සත්‍රියක්කෙරෙහි; අභිරමති, ඇලෙයි;

ස-බ. යාසුවනිතාසු, යම් සත්‍රීන් කෙරෙහි; අභිරමන්ති, ඇලෙත්;

ඉත්ථිලිඞ්ගං, ඉතිරිලිඟයි;

---

ප-ඒ. යං කුලං, යම් කුලයක්තෙම; වඩ්ඪති, වැඩෙයි;

ප-බ. යෙ. යානි කුලානි. යම් කුලයෝතුමූ; වඩ්ඪන්ති, වැඩෙත්,

දු-ඒ. යං කුලං, යම්කුලයක්, නිස්සාය වසති, නිසාවෙසෙයි;

දු-බ. යෙ. යානිකුලානි, යම් කුලයන්; නිස්සාය වසන්ති, නිසා වෙසෙත්;

තෘ-ඒ. යෙන කුලෙන, යම්කුලයක් විසින්; සක්කාරො කතො, සත්කාරකරණ ලද්දේය;

තෘ-බ. යෙහි. යෙහි කුලෙහි, යම්කුලයන් විසින්; සක්කාරාකතා, සත්කාරකරණලද්දුහ:

ක-ඒ. යෙන කුලෙන, යම්කුලයක් කරණකොට; ජීවති, ජීවත්වෙයි;

ක-බ. යෙහි. යෙහි කුලෙහි, යම් කුලයන් කරණකොට; ජීවන්ති, ජීවත්වෙත්;

ච-ඒ. යස්සකුලස්ස, යම්කුලයකට; උපකාරං අකාසි, උපකාර කෙළේය;

ච-බ. යෙසං. යෙසානං කුලානං, යම් කුලයන්ට; උපකාරානි අකංසු, උපකාරකරණ ලද්දුහුය.

පං-ඒ. යස්මා. යස්මා කුලස්මා; යම්කුලයක් කෙරෙන්; අපෙති පහ වෙයි;

පං-බ. යෙහි. යෙහි කුලෙහි, යම්කුලයන් කෙරෙන්; අපෙන්ති, පහවෙත්.

ඡ-ඒ. යස්සකුලස්ස, යම්කුලයකගේ; පසාවතා ප්‍රසන්නභාවයි;

ඡ-බ. යෙසං. යෙසානං කුලානං, යම් කුලයන්ගේ පධානතා, ප්‍රධාන තාවෝයි.

ස-ඒ. යම්හි. යස්මිං කුලස්මිං, යම් කුලයක් කෙරෙහි; නාභිරමති, නොඇලෙයි;

ස-බ. යෙසු කුලෙසු, යම් කුලයන් කෙරෙහි; නාභිරමන්ති, නො ඇලෙත්.

නපුංසකලිඞ්ගං නපුංසකලිඟුයි,

**'ත' ශබ්දයෙන් යමක් ගත අර්ථ කියයි.**

---

ප-ඒ. සොරාජා, ඒරජතෙම; රජ්ජං කාරෙති, රාජ්‍යයකරවයි;

ප-බ. තෙ. තෙ රාජානො, ඒරජදරුවෝතුමූ; රජ්ජං කාරෙන්ති, රාජ්‍යය කරවත්.

දු-ඒ. නං. තං රාජං, ඒරජ (කරා); උපගච්ඡතු, එලඹිවා;

දු-බ. තෙ. තෙ රාජානො, ඒරජදරුවන් (කරා); උපගච්ඡන්තු, එලඹෙත්වා;

ත-ඒ. තෙන. තෙන රාජේන, ඒ රජවිසින්; කතං නගරං, කරණ ලද නුවරයි.

ත-බ, තෙභි. තෙහි. තෙභි. තෙයි, රාජෙහි, ඒ රජදරුවන් විසින් කතානි නගරානි, කරණලද නගරයෝයි;

කා-ඒ. තෙන. තෙන රාජේන, ඒරජකරණකොට; ජීවති, ජීවත් වෙයි

කා-බ. තෙහි. තෙහි. තෙහි. තෙහි රාජේහි, ඒ රජදරුවන්කරණ කොට; ජීවන්ති, ජීවත්වෙත්.

ච-ඒ. තස්ස. තස්ස රාජස්ස, ඒරජහට; පණ්ණාකාරං දදාමි, පඬුරක් දෙමි;

ච-බ. තෙසං. තෙසානං. තෙසං. තෙසානං. රාජානං, ඒරජදරුවන්ට; පණ්ණාකාරානි දදාම, පඬුරුදෙමූ.

පං-ඒ. තම්හා තම්හා. තස්මා. තස්මා; රාජස්මා, ඒරජකෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි.

පං-බ. තෙහි. තෙහි. තෙහි. තෙහි රාජෙහි,ඒරජදරුවන් කෙරෙන් භයානි උප්පජ්ජන්ති. භය උපදිත්.

ඡ-එ. තස්ස. තස්ස රාජස්ස, ඒරජහුගේ; ආභරණං, ආභරණය;

ඡ-බ. තෙසං. තෙසානං. තෙසං තෙසානං රාජූනං, ඒ රජදරුවන්ගේ; ආභරණානි, ආභරණයෝයි.

ස-එ. තම්හි. තම්හි. තස්මිං. තස්මිං රාජස්මිං, ඒරජකෙරෙහි; චිත්තං දූසෙති, සිතදූෂ්‍යකරයි;

ස-බ. තෙසු. තෙසු රාජෙසු, ඒරජදරුවන් කෙරෙහි; චිත්තානි දූසෙන්ති, සිත්දූෂ්‍යකරත්.

පුල්ලිඞ්ගං, පුල්ලිඟුයි;

---

ප-එ. සා කන්තා, ඒකාන්තාතොම; ගච්ඡති, යෙයි;

ප-බ. තා. තායො. තා. තායො කන්තායො, ඒකාන්තාවෝතුමූ; ගච්ඡන්ති, යෙත්.

දු-එ. තං. තං කන්තං, ඒකාන්තාව; අද්දක්ඛි, දිටුයේය;

දු-බ, තා. තායො. තා. තායො කන්තායො, ඒකාන්තාවන්; අද්දක්ඛිංසු, දුටුවාහුයි.

ත-එ. තාය. තායකන්තාය, ඒකාන්තාව විසින්; කතං භොජනං, කරණලද බොජුනයි;

ත-බ, තාභි. තාභි. තාහි. තාහි කන්තාහි, ඒකාන්තාවන් විසින්; කතානි භොජනානි, කරණලද භොජනයෝයි.

ක-එ. තාය. තායකන්තාය, ඒකාන්තාව කරණකොට; කොචිජීවිකං කප්පෙන්ති, කිසිවෙක් ජීවිකාව කරයි;

ක-බ. තාභි. තාභි. තාහි. තාහි කන්තාභි, ඒකාන්තාවන් කරණකොට; කෙචිජීවිකං කප්පෙන්ති, කිසිවෙක්හු ජීවිකාව කරත්

ච-එ. තිස්සාය. තිස්සා. තස්සා. තායකන්තාය, ඒකාන්තාවට; චිත්තං නදෙහි, සිතනොදෙව;

ච-බ. තාසං. තාසානං කන්තානං, ඒකාන්තාවන්ට; චිත්තානි නදෙථ, සිත්නොදෙව්.

පං-එ. තාය. තායකන්තාය, ඒ කාන්තාව කෙරෙන්; භයංජායතෙ, භයහටගණියි;

පං-බ. තාභි. තාභි. තාහි. තාහිකන්තාහි, ඒකාන්තාවන් කෙරෙන්; භයානිජායන්තෙ, භයහටගණිත්.

ඡ-එ. තිස්සාය. තිස්සා. තස්සා. තායකන්තාය, ඒකාන්තාවගේ; ආභරණං, ආභරණයයි;

ඡ-බ, තාසං. තාසානං කන්තානං, ඒකාන්තාවන්ගේ; ආභරණානි, ආභරණයෝයි.

**ස-ඒ.** තිස්සං. තස්සං. තායං කන්තායං, ඒ කාන්තාවකෙරෙහි; රමති, ඇලෙයි;

**ස-බ.** තාසු කන්තාසු, ඒ කාන්තාවන් කෙරෙහි; රමන්ති, ඇලෙත්.

ඉත්ථිලිඞ්ගං, ස්ත්‍රීලිඞ්ගයි.

---

**ප-ඒ.** තං. තං කුලං, ඒකුලය තෙම; පරිහායති, පිරිහෙයි;

**ප-බ.** තෙ. තානි. තෙ. තානිකුලානි, ඒකුලයෝතුමූ; පරිහායන්ති, පිරිහෙත්.

**දු-ඒ.** තං. තං කුලං, ඒකුලය; උද්දිස්සතිට්ඨති, උදෙසා සිටියි;

**දු-බ.** තෙ. තානි. තෙ. තානිකුලානි, ඒ කුලයන්; උද්දිස්සතිට්ඨන්ති, උදෙසාසිටිත්.

**ත-ඒ.** තෙන. තෙනකුලෙන, ඒ කුලය විසින්; උපකාරොකතො, උපකාර කරණලද්දේය:

**ත-බ.** තෙහි. තෙභි. තෙහි තෙභි කුලෙහි, ඒ කුලයන් විසින්; උපකාරාකතා, උපකාරකරණලද්දුහ;

**ක-ඒ.** තෙන. තෙන කුලෙන, ඒ කුලය කරණකොට; ජීවති, ජීවත්වෙයි;

**ක-බ.** තෙහි. තෙභි. තෙහි, තෙභි කුලෙහි, ඒ කුලයන්කරණකොට ජීවන්ති, ජීවත්වෙත්.

**ච-ඒ.** තස්ස. තස්සකුලස්ස, ඒ කුලයට; ධනංදදාති, වස්තුදෙයි;

**ච-බ.** තෙසං, තෙසානං. තෙසං. තෙසානං කුලානං, ඒකුලයන්ට; ධනං දදන්ති, වස්තුදෙත්;

**පං-ඒ.** තම්හා. තම්හා, තස්මා. තස්මාකුලස්මා, ඒ කුලයකෙරෙන්; විවාහං කරොති, විවාහකරයි;

**පං-බ.** තෙහි. තෙභි, තෙහි. තෙභිකුලෙහි, ඒ කුලයන් කෙරෙන්; විවාහං කරොන්ති, විවාහකරත්.

**ඡ-ඒ.** තස්ස. තස්සකුලස්ස, ඒ කුලයාගේ; උත්තමභාවො, උතුම්භාවයයි;

**ඡ-බ.** තෙසං. තෙසානං. තෙසං. තෙසානං, කුලානං, ඒ කුලයන්ගේ; උත්තමභාවා, උතුම්භාවයෝයි.

**ස-ඒ.** තම්හි. තම්හි. තස්මිං. තස්මිං කුලස්මිං, ඒ කුලයකෙරෙහි; අලග්ගා විහරති, නොඇලීවෙසෙයි;

**ස-බ.** තෙසු. තෙසුකුලෙසු, ඒ කුලයන්කෙරෙහි; අලග්ගාවිහරන්ති, නොඇලීවෙසෙත්.

නපුංසකලිඞ්ගං, නපුංසකලිඞ්ගයි.

---

**'ත' ශබ්දයෙන් ශේෂ යන අර්ථකියත්.**

ප-ඒ. එසො පුරිසො, මේ පුරුෂතෙම; ධම්මං සුණාති, බණ අසයි;
ප-බ. එතෙ පුරිසා, මේ පුරුෂයෝතුමූ; ධම්මං සුණන්ති, බණ අසත්.
දු-ඒ. එතං පුරිසං, මේ පුරුෂයා; සරාමි, සිහිකරමි.
දු-බ. එතෙ පුරිසෙ, මේ පුරුෂයන්; සරාම, සිහිකරමු.
ත-ඒ. එතෙන පුරිසෙන, මේ පුරුෂයා විසින්; කතං ඝරං, කරණලද ගෙයයි;
ත-බ. එතෙභි. එතෙහි පුරිසෙහි, මේ පුරුෂයන් විසින්; කතානි ඝරානි, කරණලද ගෘහයෝයි;
ක-ඒ. එතෙන පුරිසෙන, මේ පුරුෂයා කරණකොට; සුඛං අපාපුණිං, සැපයට පැමිණියෙමි;
ක-බ. එතෙභි. එතෙහි පුරිසෙහි, මේ පුරුෂයන් කරණකොට; සුඛං අපාපුණිම්හ, සැපයට පැමිණියෙවෙමු;
ච-ඒ. එතස්ස පුරිසස්ස, මේ පුරුෂයාහට; බලං දදාමි, බලයදෙමි;
ච-බ. එතෙසං. එතෙසානං පුරිසානං, මේ පුරුෂයන්ට; බලං දදාම, බලයදෙමු.
පං-ඒ. එතම්හා. එතස්මා පුරිසස්මා, මේ පුරුෂයා කෙරෙන්; උපද්දවො න හොති, උපද්‍රවයෙක් නොවෙයි;
පං-බ. එතෙභි. එතෙහි පුරිසෙහි, මේ පුරුෂයන් කෙරෙන්; උපද්දවා න හොන්ති, උපද්‍රවයෝ නොවෙත්.
ඡ-ඒ. එතස්ස පුරිසස්ස, මේ පුරුෂයාගේ; පුත්තො, පුත්‍රයායි;
ඡ-බ. එතෙසං එතෙසානං පුරිසානං, මේපුරුෂයන්ගේ; පුත්තා, පුත්‍රයෝහ;
ස-ඒ. එතම්හි එතස්මිං පුරිසස්මිං. මේ පුරුෂයා කෙරෙහි, දොසො න විජ්ජති, දෝෂයෙක් විද්‍යමාන නොවෙයි;
ස-බ. එතෙසු පුරිසෙසු, මේ පුරුෂයන් කෙරෙහි; දොසා න විජ්ජන්ති දෝෂයෝ විද්‍යමාන නොවෙත්.

ඉත්ථිලිඞ්ගං, ස්ත්‍රීලිඟයි.

---

ප-ඒ. එසා ඉත්ථි, මේ ස්ත්‍රීතොම; පුඤ්ඤං කරොති, පිං කරයි;
ප-බ. එතා. එතායො ඉත්ථියො, මේ ස්ත්‍රීහුතුමූ; පුඤ්ඤානි කරොන්ති, පිංකරත්.
දු-ඒ. එතං ඉත්ථිං, මේස්ත්‍රිය; පහාය ගතො, හැරගියේය;
දු-බ. එතා. එතායො ඉත්ථියො, මේස්ත්‍රීන්; පහාය ගතා, හැරගියාහුය.
ත-ඒ. එතාය ඉත්ථියා, මේ ස්ත්‍රිය විසින්; පොසිතො පුත්තො, පොෂ්‍යකරණලද පුත්‍රයායි;
ත-බ. එතාභි. එතාහි ඉත්ථිහි, මේ ස්ත්‍රීන් විසින්; පොසිතා පුත්තා, පොෂ්‍යකරණලද පුත්‍රයෝයි;

ක-එ. එතාය ඉත්ථියා, මේස්ත්‍රිය කරණකොට; සීලංභිජ්ජති, සිල් බිඳෙයි;

ක-බ. එතාභි. එතාහි ඉත්ථිහි, මේසත්‍රීන් කරණකොට; සීලානිභිජ්ජ නති, සිල්බිඳෙත්;

ච-එ. එතිස්සාය. එතිස්සා. එතාය ඉත්ථියා, මේ සත්‍රියට; මනංනදෙති සිතනොදෙව;

ච-බ. එතාසං. එතාසානං ඉත්ථිනං, මේ සත්‍රින්ට; මනානිනදෙථ, සිත් නොදෙව්,

පං-එ. එතාය ඉත්ථියා, මේ සත්‍රිය කෙරෙන්; නිමිත්තං නගණ්හාහි, නිමිත්නොගණුව;

පං-බ. එතාහි. එතාහි ඉත්ථිහි, මේසත්‍රීන් කෙරෙන්; නිමිත්තානින ගණ්හාථ, නිමිත්නොගණිව්;

ඡ-එ. එතිස්සාය. එතිස්සා. එතායඉත්ථියා, මේ සත්‍රියගේ; අසුභ ලක්ඛණං අසුභ ලක්ෂණයයි;

ඡ-බ. එතාසං. එතාසානං ඉත්ථිනං, මේ සත්‍රින්ගේ; අසුභලක්ඛ ණානි, අසුභලක්ෂණයෝයි.

ස-එ. එතිස්සං. එතාසං. එතායං ඉත්ථියං, මේ සත්‍රිය කෙරෙහි; ගුණංනවිජ්ජති, ගුණයවිද්‍යමාන නොවෙයි;

ස-බ. එතාසු ඉත්ථිසු, මේ සත්‍රීන් කෙරෙහි; ගුණානිනවිජ්ජනති, ගුණයෝ විද්‍යමාන නොවෙත්;

ඉත්ථිලිඞ්ගං, සත්‍රීලිඟුයි.

---

ප-එ. එතං පුප්ඵං, මේ පුෂ්පයතෙම; මනං පිනෙති, සිතපිණවයි,

ප-බ. එතෙ. එතානි පුප්ඵානි, මේ පුෂ්පයෝතුමු; මනානිපීනෙනයි සිත් පිණවත්.

දු-එ. එතං පුප්ඵං, මේ පුෂ්පය; පූජෙමි, පූජාකරමි,

දු-බ. එතෙ. එතානි පුප්ඵානි, මේ පුෂපයන්; පූජෙම, පූජාකරමු;

ත-එ. එතෙනපුප්ඵෙන, මේ පුෂ්පය විසින්; සාධිතසුගන්ධොදකං, සාදනලද සුවඳ ජලයයි;

ත-බ. එතෙභි, එතෙහි පුප්ඵෙහි, මේ පුෂ්පයන් විසින්; සාධිතානි සුගන්ධොදකානි, සාදන ලද්දවූ සුවඳ ජලයෝයි.

ක-එ. එතෙන පුප්ඵෙන, මේ පුෂ්පය කරණකොට; තුට්ඨිං ජනයති, සතුටු උපදවයි;

ක-බ. එතෙභි. එතෙහි පුප්ඵෙහි, මේ පුෂපයන් කරණකොට; තුට්ඨිං ජනයනයි. සතුටු උපදවත්,

ච-එ. එතස්ස පුප්ඵස්ස, මේ පුෂපයට; සලිලංසිඤ්චාමි, ජලයඉසිමි;

ච-බ. එතෙසං. එතෙසානං පුප්ඵානං, මේ පුෂ්පයන්ට; සලිලං සිඤ්චාම, ජලය ඉසිමු;

පං-ඒ. එතම්හා. එතස්මා පුප්ඵස්මා, මේ පුෂ්පය කෙරෙන්; භමරො අපෙති, භෘඟතෙම පහවෙයි;

පං-බ. එතෙහි. එතෙහි පුප්ඵෙහි, මේ පුෂ්පයන් කෙරෙන්; භමරා අපෙන්ති, භෘඟයෝ පහවෙත්.

ඡ-ඒ. එතස්ස පුප්ඵස්ස, මේ පුෂ්පයාගේ; සුගන්ධං, සුවඳයි

ඡ-බ. එතෙසං. එතෙසානං පුප්ඵානං, මේ පුෂ්පයන්ගේ; සුගන්ධානි, සුගන්ධයෝයි.

ස-ඒ. එතම්හි. එතස්මිං පුප්ඵස්මිං, මේ පුෂ්පය කෙරෙහි; මධුමක්ඛිකො විචරති, මීමැසිතෙම හැසිරෙයි;

ස-බ. එතෙසු පුප්ඵෙසු, මේ පුෂ්පයන් කෙරෙහි; මධුමක්ඛිකා විචරන්ති, මීමැස්සෝතුමූ හැසිරෙත්.

නපුංසකලිඞ්ගං, නපුංසකලිඟුයි;

---

## 'එත' ශබ්දයෙන් තෙල යන අර්ථ කියත්;

---

ප-ඒ. අයං සීහො, මේ සිංහතෙම; සීහනාදං නදති, සිංහනාදකරයි;

ප-බ. ඉමෙ සීහා, මේ සිංහයෝතුමූ; සීහනාදං නදන්ති, සිංහනාද කරත්.

දු-ඒ. ඉමං සීහං, මේ සිංහයා; ඔලොකෙති, බලව;

දු-බ, ඉමෙ සීහෙ, මේ සිංහයන්; ඔලොකෙථ, බලව්;

ත-ඒ. අනෙන. ඉමිනා සීහෙන, මේ සිංහයා විසින්; මාරිතො ගජො, මරණලද හස්තියායි;

ත-බ. එභි. එහි. ඉමෙභි. ඉමෙහි සීහෙහි, මේ සිංහයන් විසින්; මාරිතා ගජා, මරණලද හස්තීහුයි;

ක-ඒ. අනෙන. ඉමිනා සීහෙන, මේසිංහයා කරණකොට; මිගොවධං පාපුණාති, මෘගතෙම වධයට පැමිණෙයි.

ක-බ. එභි. එහි, ඉමෙභි. ඉමෙහි සීහෙහි, මේ සිංහයන් කරණකොට; මිගාවධං පාපුණන්ති, මෘගයෝතුමූ වධයට පැමිණෙත්;

ච-ඒ. අස්ස. ඉමස්ස සීහස්ස, මේ සිංහයාට; පහාරං න දෙති, පහරක් නොදෙව;

ච-බ. එසං. එසානං. ඉමෙසං. ඉමෙසානං සීහානං, මේ සිංහයන්ට; පහාරා න දෙථ, පහර නොදෙව්.

පං-ඒ. අස්මා. ඉමම්හා. ඉමස්මා සීහස්මා, මේ සිංහයා කෙරෙන්; භයං ජායතෙ, භයනට ගණියි;

පං-බ. එභි. එහි. ඉමෙභි. ඉමෙහි සීහෙහි, මේ සිංහයන් කෙරෙන්; භයානි ජායන්ති, භයනට ගණිත්.

ඡ-ඒ. අස්ස. ඉමස්ස සීහස්ස, මේ සිංහයාගේ කෙසරං, කේසරයයි;

ඡ-බ. එසං. එසානං. ඉමෙසං. ඉමෙසානං සීහානං, මේසිංහයන්ගේ කෙසරානි, කේසරයෝයි,

ස-එ. අස්මිං. ඉමම්හි. ඉමස්මිං සීහස්මිං, මේ සිංහයාකෙරෙහි; භීතිං ජනෙති, භයඋපදියි;

ස-බ. එසු. ඉමෙසුසීහෙසු, මේ සිංහයන් කෙරෙහි; භීතිං ජනෙන්ති භය උපදින්;

පුලලිඞගං, පුල්ලිඟුයි,

---

ප-එ. අයං පඤ්ඤා, මේ ප්‍රඥතොම්; පවඩ්ඪති, වැඩෙයි;

ප-බ. ඉමා. ඉමායො පඤ්ඤායො, මේ ප්‍රඥවෝතුම්; පවඩ්ඪන්ති, වැඩෙත්.

දු-එ. ඉමිං පඤ්ඤං, මේප්‍රඥාව; පවඩ්ඪෙහි, වඩව;

දු-බ. ඉමා. ඉමායො පඤ්ඤායො, මේ ප්‍රඥවන්; පවඩ්ඪෙථ වඩව්;

ත-එ. ඉමායපඤ්ඤාය, මේ ප්‍රඥව විසින්; විචිනිතබ්බාඤාතං, පරීක්‍ෂා කොට දූනගත්තාලදි;

ත-බ. ඉමාහි. ඉමාහි පඤ්ඤාහි, මේ ප්‍රඥවන් විසින්; විචිනිතබ්බා ඤාත ධම්මා, පරීක්‍ෂාකොට දූණගත්නාලද ධර්මයෝයි;

ක-එ. ඉමාය පඤ්ඤාය, මේ ප්‍රඥාවකරණකොට, ලද්ධං සුඛං, ලබන ලද සැපයයි;

ක-බ. ඉමාහි. ඉමාහි පඤ්ඤාහි, මේ ප්‍රඥවන් කාරණකොට; ලද්ධානි සුඛානි; ලබ්ධණලද සැපයෝයි.

ච-එ. අස්සාය. අස්සා ඉමිස්සාය. ඉමිස්සා. ඉමායපඤ්ඤාය, මේප්‍රඥ වට; අනුබලං දතබ්බං, අනුබල දියයුතුයි;

ච-බ. ඉමාසං. ඉමාසානං පඤ්ඤානං, මේප්‍රඥාවන්ට; අනුබලානි දතබ්බානි, අනුබලදිය යුත්තාහ,

පං-එ. ඉමායපඤ්ඤාය, මේප්‍රඥාව කෙරෙන්; නවිරමාමි, වෙන් නොවෙමි;

පං-බ. ඉමාහි. ඉමාහි පඤ්ඤාහි, මේ ප්‍රඥාවන් කෙරෙන්; නවිරමාමු, වෙන් නොවෙමු.

ඡ-එ. අස්සාය. අස්සා. ඉමිස්සාය, ඉමිස්සා. ඉමාය පඤ්ඤාය, මේප්‍රඥා වගේ; පටුභාවො, පටුබවයි;

ඡ-බ. ඉමාසං. ඉමාසානං පඤ්ඤානං, මේ ප්‍රඥාවන්ගේ; පටුභාවා, පටුභාවයෝයි;

ස-එ. අස්සං. ඉමිස්සං. ඉමායං පඤ්ඤායං, මේ ප්‍රඥාවෙහි; පතිට්ඨාතබ්බං, පිහිටිය යුතුයි;

ස-බ. ඉමාසු පඤ්ඤාසු, මේ ප්‍රඥාවන්හි; පතිට්ඨාතබ්බා; පිහිටිය යුත්තාහුය.

ඉත්ථිලිඞගං, ස්ත්‍රීලිඟයි,

---

ප-ඒ. ඉදං ඉමං අරඤ්ඤං, මේ ආරණ්‍යයතෙම; සොභති, සොබියි;

ප-බ. ඉමෙ. ඉමානි අරඤ්ඤානි, මේ ආරණ්‍යයෝතුමු; සොභන්ති, සොබිත්;

දු-ඒ. ඉදං. ඉමං අරඤ්ඤං, මේ ආරණ්‍යය; රොපෙමි, රෝපණය කරමි;

දු-බ. ඉමෙ. ඉමානි අරඤ්ඤානි, මේ ආරණ්‍යයන්; රොපෙම, රෝපණයකරමු;

ත-ඒ. අනෙන. ඉමිනා අරඤ්ඤෙන, මේ ආරණ්‍යය විසින්; පරික්ඛිත්තොපදෙසො, වටලනලද ප්‍රදේශයයි;

ත-බ. එහි. එභි. ඉමෙහි, ඉමෙභි අරඤ්ඤෙහි, මේ ආරණ්‍යයන් විසින්; පරික්ඛිත්තාපදෙසා, වටලනලද ප්‍රදේශයෝයි.

ක-ඒ. අනෙන. ඉමිනා අරඤ්ඤෙන, මේ ආරණ්‍යය කරණකොට; මිගොජීවති, මෘගතෙම ජීවත්වෙයි;

ක-බ. එහි. එභි. ඉමෙහි. ඉමෙභි අරඤ්ඤෙහි, මේ ආරණ්‍යයන් කරණකොට; මිගසූකරා ජීවන්ති, මෘගසූකරයෝ ජීවත්වෙත්;

ච-ඒ. අස්ස. ඉමස්ස අරඤ්ඤස්ස, මේ ආරණ්‍යයට; උපද්දවොනකාතබ්බො, උපද්‍රවයෙක් නොකට යුත්තේය;

ච-බ. එසං. එසානං. ඉමෙසං. ඉමෙසානං අරඤ්ඤානං, මේ ආරණ්‍යයන්ට; උපද්දවා නකාතබ්බා, උපද්‍රවනොකට යුත්තාහ;

පං-ඒ. අස්මා. ඉමම්හා. ඉමස්මා අරඤ්ඤස්මා, මේ ආරණ්‍යය කෙරෙන්; භයං ජායතෙ, භයඋපදියි;

පං-බ. එහි. එභි. ඉමෙහි. ඉමෙභි අරඤ්ඤෙහි, මේ ආරණ්‍යයන් කෙරෙන්; භයානිජායන්තෙ, භයඋපදිත්.

ඡ-ඒ. අස්ස. ඉමස්ස අරඤ්ඤස්ස, මේ ආරණ්‍යයාගේ; විසාලත්තං, විශාලබවයි;

ඡ-බ. එසං. එසානං. ඉමෙසං. ඉමෙසානං අරඤ්ඤානං, මේ ආරණ්‍යයන්ගේ; නිජ්ඣරානි, ජලනිර්ඣරයෝයි.

ස-ඒ. අස්මිං. ඉමම්හි. ඉමස්මිං අරඤ්ඤස්මිං, මේ ආරණ්‍යයෙහි, කුඤ්ජරොවිචරති, හස්තිතෙම හැසිරෙයි;

ස-බ. එසු. ඉමෙසු අරඤ්ඤෙසු, මේ ආරණ්‍යයන්හි; කුඤ්ජරාවිචරන්ති, හස්තීහුතුමූ හැසිරෙත්;

නපුංසකලිඞ්ගං, නපුංසකලිඟුයි;

---

**'ඉම' ශබ්දයෙන් මේය යන අර්ථ කියත්.**

---

ප-ඒ. අසු. අමුකොරාජා, අසවල් රජතෙම; පුඤ්ඤං කරොති, පිං කරයි;

ප-බ. අමූ. අමූයො රාජානො, අසවල් රජදරුවෝතුමූ; පුඤ්ඤානි කරොන්ති, පිංකරත්.

දු-ඒ. අමුං රාජං, අසවල්රජ; සෙවති, සේවනයකරයි;

දු-බ. අමූ. අමූයෝ රාජානො, අසවල්රජදරුවන්; සෙවන්ති, සේවනයකරත්.

ත-ඒ. අමුනාරාජෙන, අසවල් රජවිසින්; කාරිතො විහාරො, කරවනලද විහාරයකි.

ත-බ. අමූහි. අමූභි රාජෙභි, අසවල් රජදරුවන් විසින්; කාරිතානි නගරානි, කරවනලද්දවූ නගරයෝයි.

ක-ඒ. අමුනාරාජෙන, අසවල් රජකරණකොට; නාගරො සුඛීජාතො, නුවරවැසිතෙම සුවපත්වූයේය;

ක-බ. අමූහි. අමූභි රාජෙහි, අසවල් රජදරුවන්කරණකොට; නාගරා සුඛිජාතා, නුවර වැස්සෝ සුවපත්වූවාහ;

ච-ඒ. අමුනො. අමුස්සරාජස්ස, අසවල් රජහට; පණ්ණාකාරං දතබ්බං, පඬුරුදිය යුත්තේය;

ච-බ. අමූසං. අමූසානං රාජූනං, අසවල් රජදරුවන්ට; පණ්ණාකාරානිදතබ්බානි, පඬුරුදියයුත්තාහුය.

පං-ඒ. අමුනා. අමූම්හා. අමුස්මා රාජස්මා, අසවල් රජකෙරෙන්; ඨානන්තරං ලභති, ඨානාන්තරලබයි;

පං-බ. අමූහි· අමූභි රාජූභි, අසවල් රජදරුවන් කෙරෙන්,ඨානන්තරානි ලභන්ති, ඨානන්තරලබත්;

ඡ-ඒ. අමුනො. අමුස්සරාජස්ස, අසවල් රජගේ; පචණ්ඩඛුධභණ්ඩං; පඤ්චඛාද්‍ය භාණ්ඩයයි;

ඡ-බ. අමූසං. අමූසානං රාජූනං, අසවල් රජදරුවන්ගේ; චතුරඞ්ගිනිසෙනා, සිව්රඟසේනාවෝයි.

ස-ඒ. අමුම්හි. අමුස්මිං රාජස්මිං, අසවල් රජකෙරෙහි; අමච්චො වෙරං බන්ධති, අමාත්‍යතෙම වෛර බඳියි;

ස-බ. අමූසු රාජෙසු, අසවල් රජදරුවන්කෙරෙහි; අමච්චාවෙරිං බන්ධන්ති, අමාත්‍යයෝතුමූ වෛරබඳිත්.

පුලලිඞගං, පුල්ලිඟුයි.

---

ප-ඒ. අසු. අමුඋපාසිකා, අසවල් උපාසිකාතෙම; සීලං රක්ඛති, සිල්රකියි;

ප-බ. අමූ. අමූයො උපාසිකායො, අසවල් උපාසිකාවෝතුමූ; සීලානි රක්ඛන්ති, සිල්රකිත්;

දු-ඒ. අමුං උපාසිකං, අසවල් උපාසිකාව; ආරබ්භකථෙසි, අරභයා කීයේය;

දු-බ. අමූ. අමුයො. උපාසිකායො, අසවල් උපාසිකාවන්; ආරබ්භ කථෙසුං, අරභයා කීවාහුයි;

ත-ඒ. අමුයා උපාසිකාය, අසවල් උපාසිකාව විසින්; කාරාපිතවිහා රො, කරවනලද විහාරයයි;

ත-බ. අමූහි. අමූහි උපාසිකාහි, අසවල් උපාසිකාවන් විසින්; කාරා පිතවිහාරා, කරවනලද විහාරයෝයි;

ක-ඒ. අමුයා උපාසිකාය, අසවල්උපාසිකාවකාරණකොට; උප්පන්න පච්චයො. උපන්ප්‍රත්‍යයයි;

ක-බ. අමූහි. අමූහි උපාසිකාහි, අසවල් උපාසිකාවන්කරණකොට; උප්පන්නපච්චයා. උපන් ප්‍රත්‍යයෝයි.

ච-ඒ. අමුස්සා අමුයා උපාසිකාය, අසවල් උපාසිකාවට; දනං දතබ්බං, දන්දියයුතුයි;

ච-බ. අමූසං. අමූසානං උපාසිකානං, අසවල්උපාසිකාවන්ට; දනා නිදතබ්බානි, දන්දිය යුත්තාහ.

පං-ඒ. අමුයා උපාසිකාය. අසවල් උපාසිකාවගෙන්, උපදෙසොන ගෙතබ්බො, උපදේශ ගතයුත්තේය;

පං-බ. අමූහි. අමූහි උපාසිකාහි, අසවල් උපාසිකාවන්ගෙන්; උප දෙසාගහෙතබ්බා, උපදේශ ගතයුත්තාහ;

ඡ-ඒ. අමුස්සා. අමුයාඋපාසිකාය, අසවල් උපාසිකාවගේ; සීලගුණං, සීලගුණයයි;

ඡ-බ. අමූසං. අමූසානං උපාසිකානං, අසවල් උපාසිකාවන්ගේ; සීල ගුණානි, සීලගුණයෝයි.

ස-ඒ. අමුස්සං. අමුයං උපාසිකායං, අසවල් උපාසිකාවකෙරෙහි; අපරාධොනවිජ්ජති, අපරාධයෙක් විද්‍යමාන නොවෙයි:

ස-බ. අමූසු උපාසිකාසු, අසවල් උපාසිකාවන් කෙරෙහි; වජ්ජානි නවිජ්ජනයි, වද්‍යයෝ විද්‍යමාන නොවෙත්.

ඉතිඉත්ථිලිඞ්ගං, ස්ත්‍රීලිඟුයි.

---

ප-ඒ. අදුං නගරං, අසවල් නුවරතෙම; අතිවසොභති, අතිශයින්ම හොබියි;

ප-බ. අමූ. අමූනිනගරානි, අසවල් නගරයෝතුමු; අතිවිසොභන්ති, අතිශයින්ම හොබිත්.

දු-ඒ. අදුං නගරං, අසවල් නුවර; රාජාපාලෙති, රජතෙම පාල නය කරයි;

**දූ-බ.** අමූ. අමූනිනගරානි, අසවල් නගරයන්; අමච්චාපාලෙනති, අමාත්‍යයෝතුමූ පාලනය කරත්.

**තා-එ.** අමූනානගරෙන, අසවල් නුවරවිසින්; පරික්ඛිත්තොපදෙසො, වටකරණලද ප්‍රදේශයයි;

**තා-බ.** අමූහි. අමූහි නගරෙහි, අසවල්නගරයන් විසින්; පරික්ඛිත්තා පදෙසා, වටකරණලද ප්‍රදේශයෝයි.

**කා-එ.** අමූනානගරෙන, අසවල් නුවරකරණකොට, රාජාසුඛිහොති, රජතෙම සුවපත්වෙයි;

**කා-බ.** අමූහි. අමූහිනගරෙහි, අසවල් නගරයන් කරණකොට; රාජානො සුඛිනොභවන්ති, රජදරුවෝතුමූ සුවපත්වෙත්;

**ම-එ.** අමුනො. අමුස්සනගරස්ස, අසවල් නුවරට; මහාජනො නිච්චමෙව පවිසති, මහාජනතෙම නිරතුරුවම ප්‍රවිෂ්ටවෙයි;

**ම-බ.** අමූසං. අමූසානං නගරානං, අසවල් නගරයන්ට; මහාජනා නිච්චමෙව පවිසන්ති, මහාජනයෝතුමූ නිරතුරුවම ප්‍රවිෂ්ට වෙත්.

**පං-එ.** අමුම්හා. අමුස්මානගරස්මා, අසවල් නුවරින්; මහාජනොනිච්චමෙව නික්ඛමති, මහාජනතෙම නිතරම නික්මෙයි;

**පං-බ.** අමූහි. අමූහි නගරෙහි, අසවල් නුවරවලින්; මහාජනානිච්චමෙව නික්ඛමන්ති, මහාජනයෝතුමූ නිතරම නික්මෙත්.

**ඡ-එ.** අමුනො. අමුස්සනගරස්ස, අසවල් නුවරගේ; පාකාරො, ප්‍රාකාරයයි,

**ඡ-බ.** අමූසං. අමූසානං නගරානං, අසවල් නගරයන්ගේ; පාකාරා ප්‍රාකාරයෝයි.

**ස-එ.** අමුම්හි. අමුස්මිං නගරස්මිං, අසවල් නුවරෙහි; සබ්බොජනො අභිරමති, සියළුජනතෙම මනාකොට ඇලෙයි,

**ස-බ.** අමූසුනගරෙසු, අසවල් නගරයන්හි, සබ්බජනා අභිරමන්ති; සියලු ජනයෝතුමූ මනාකොට ඇලෙත්;

නපුංසකලිඞ්ගං, නපුංසකලිංගයි;

**'අමු' ශබ්දයෙන් මේය සත අඤ්කියත්.**

---

**ප-එ.** කොබොධිසත්තො, කවරබොධි සත්වයෙක්තෙම්; පාරමියො පූරෙති, පාරමිහු පූරයිද;

**ප-බ.** කෙ බොධිසත්තා. කවරබොධිසත්වයෝතුමූ; පාරමියො පූරෙන්ති, පාරමිහු පූරද්ද.

**දු-එ.** කං බොධිසත්තං, කවර බොධිසත්වයෙක්; උද්දිස්සපුඤ්ඤං කරිස්සසි; උදෙසා පිංකරයිද;

දු-බ. කෙ බොධිසත්තෙ, කවරබොධිසත්වයන්; උද්දිස්සපුඤ්ඤානි කරිස්සථ, උදෙසා පිං කරව්ද;

ත-එ. කෙන බොධිසත්තෙන, කවර බොධිසත්වයෙක් විසින්; බුද්ධත්තං අධිගතො, බුද්ධබවට පැමිණියේද;

ත-බ. කෙහි. කෙභි බොධිසත්තෙහි, කවර බොධිසත්වයන් විසින්; බුද්ධත්තං අධිගතා, බුදුබවට පැමිණියාහුද.

කා-එ. කෙන බොධිසත්තෙන, කවර බොධිසත්වයෙක්කරණකොට; සංසාරදුක්ඛතො මුච්චති, සසරදුකින් මිදේද;

කා-බ. කෙහි. කෙභි බොධිසත්තෙහි, කවර බොධිසත්වයන්කරණකොට; සංසාරතො මුච්චන්ති, සසරින් මිදෙද්ද;

ච-එ. කස්සබොධිසත්තස්ස, කවරබොධිසත්වයෙකුට; පූජං කරිස්සසි, පූජාකරයිද;

ච-බ. කෙසං. කෙසානං බොධිසත්තානං, කවරබොධිසත්වයන්ට; පූජං කරිස්සථ, පූජාකරව්ද;

පං-එ. කම්හා. කස්මා බොධිසත්තස්මා, කවරබොධිසත්වයෙකුගෙන්; ධම්මං උග්ගණ්හති, බණ උගණියිද;

පං-බ. කෙහි. කෙභි බොධිසත්තෙහි, කවරබොධිසත්වයන්ගෙන්; ධම්මං උග්ගණ්හන්ති, බණ උගණිද්ද.

ඡ-එ. කස්ස බොධිසත්තස්ස, කවර්බොධිසත්වයෙකුගේ; ඉමං පාසාදං, මේ ප්‍රාසාදයද;

ඡ-බ. කෙසං, කෙසානං බොධිසත්තානං, කවර බොධිසත්වයන්ගේ; ඉමෙපාසාදා, මේ ප්‍රාසාදයෝද.

ස-එ. කම්හි. කස්මිං බොධිසත්තස්මිං, කවර බොධිසත්වයෙක් කෙරෙහි; චිත්තං පසීදති, සිත පහදියිද;

ස-බ. කෙසු බොධිසත්තෙසු. කවරබොධිසත්වයන් කෙරෙහි; චිත්තානි පසීදන්ති, සිත් පහදිද්ද.

පුලලිඞගං, පුල්ලිඟයි.

---

ප-එ. කා නාමගඞ්ගා, කවරනම් ගඟාවක්කොව; එත්ථවිජ්ජති, මෙහි විද්‍යමානවේද;

ප-බ. කා. කායොගඞ්ගායො, කවරනම්ගඟාවෝතුමු; එත්ථවිජ්ජන්ති, මෙහි විද්‍යමානවේද්ද;

දු-එ. කං ගඞ්ගං, කවරනම් ගඟාවක්; පස්සසි, දුටුවෙහිද;

දු-බ. කා. කායොගඞ්ගායො, කවරනම් ගඟාවන්; පස්සථ, දුටුවෙව්ද;

ත-එ. කායගඞ්ගාය, කවරනම් ගඟාවක්විසින්; සොභිතපදෙසො, සොබවනලද ප්‍රදේශයද;

තෘ-බ. කාහි. කාහිගඞ්ගාහි, කවරනම් ගඟාවන්විසින්; සොභිතරාජධානියො, හොබවනලද රාජධානීහුද;

තෘ-එ. කායගඞ්ගාය, කවරනම් ගඟාවක්කරණකොට; ඛෙත්තං කරීයතෙ, කෙතකරණුලැබේද;

තෘ-බ. කාහි. කාහිගඞ්ගාහි, කවරනම් ගඟාවන්කරණකොට; ඛෙත්තානිකරීයන්තෙ, කෙත්කරණුලැබෙත්ද;

ච-එ. කාස්සා. කාසගඞ්ගාය, කවරනම් ගඟාවසඳහා; උළුම්පංදදාති, පසුරක් දෙයිද;

ච-බ. කාසං. කාසානං ගඞ්ගානං, කවරනම් ගඟාවන්ට; උළුම්පදදන්ති, පහුරුදෙද්ද;

පං-එ. කායගඞ්ගාය, කවරනම් ගඟාවකින්; පාරං ගමිස්සසි, පරතෙරට ගියේද;

පං-බ. කාහි. කාහි ගඞ්ගාහි, කවරනම් ගඟාවලින්; ඔරං ආගමිස්සථ, මෙතරට ආවාහුද.

ෂ-එ. කාස්සා· කාසගඞ්ගාය, කවරනම් ගඟාවකගේ; ඉමං නාමං, මේ නමද;

ෂ-බ. කාසං. කාසානං ගඞ්ගානං, කවරනම් ගඟාවන්ගේ; ඉමෙනාමානි, මේ නාමයෝද;

ස-එ. කාස්සං. කායං ගඞ්ගායං, කවරනම් ගඟාවෙහි, මච්ඡොවසති, මත්ස්‍යතෙම වෙසෙයිද;

ස-බ. කාසුගඞ්ගාසු, කවරනම් ගඟාවන්හි; මච්ඡාවසන්ති, මත්ස්‍යයෝතුමූ වෙසෙද්ද;

ඉත්ථිලිඞ්ගං, ස්ත්‍රීලිඞ්ගයි;

---

ප-එ. කං පුප්ඵං, කවරනම් පුෂ්පයක්තෙම, විරොචති, බබලයිද;

ප-බ. කෙ. කානිපුප්ඵානි, කවරනම් පුෂ්පයෝතුමූ; විරොචන්ති, බබලද්ද;

දු-එ. කං පුප්ඵං, කවරනම් පුෂ්පයක්; ආනෙමි, ගෙනෙම්ද;

දු-බ. කෙ. කානිපුප්ඵානි, කවරනම් පුෂ්පයන්; ආනෙම, ගෙනෙමුද.

තෘ-එ. කෙනපුප්ඵෙන, කවරනම් පුෂ්පයක්විසින්; කතං ආසනං, කරණලද ආසනයද;

තෘ-බ. කෙහි. කෙහි පුප්ඵෙහි, කවරනම් පුෂ්පයන් විසින්; කතා ආසනානි, කරණලද ආසනයෝද.

තෘ-එ. කෙන පුප්ඵෙන, කවරනම් පුෂ්පයක් කරණකොට; භමරො මධුං කරොති, මීමැසිතෙම මීකරයිද;

තෘ-බ. කෙහි· කෙහිපුප්ඵෙහි, කවරනම් පුෂ්පයන් කරණකොට; භමරාමධූනිකරොන්ති, මීමැස්සෝ මධුන්කරත්ද.

ච-එ. කස්සපුප්ඵස්ස, කවරනම් පුෂ්පයකට; රොචෙති, රුච්චෙයිද;
ච-බ. කෙසං. කෙසානං පුප්ඵානං, කවරනම් පුෂ්පයන්ට; රොචෙ න්ති, රුච්චෙද්ද.
පං-එ. කම්හා. කස්මාපුප්ඵස්මා, කවරනම්පුෂ්පයකින්; සුගන්ධාවා යති, සුවඳ හමයිද;
පං-බ කෙහි. කෙහි පුප්ඵෙහි, කවරනම් පුෂ්පයන්ගෙන්; සුගන්ධා වායන්ති, සුවඳ හමද්ද;
ඡ-එ. කස්සපුප්ඵස්ස, කවරනම් පුෂ්පයක්ගේ; ඉදං සුගන්ධං, මේ සුවඳද;
ඡ-බ. කෙසං කෙසානං පුප්ඵානං, කවරනම් පුෂ්පයන්ගේ; ඉමෙ සුගන්ධා, මේ සුවඳයෝද;
ස-එ. කම්හි. කස්මිං පුප්ඵස්මිං, කවරනම් පුෂ්පයක්කෙරෙහි; පසීදති, පහදියිද?
ස-බ. කෙසු පුප්ඵෙසු, කවරනම් පුෂ්පයන් කෙරෙහි, පසීදන්ති, පහදිද්ද;

නපුංසකලිඞ්ගං, නපුංසකලිඟුයි.

'කිං' ශබ්දයෙන් කිමෙක යන අර්ථ කියන්.

---

ප-එ. ත්වං; තුවං, තුඹ; ගච්ඡසි, යෙහි; අහං, මම; ගච්ඡාමි, යෙමි;
ප-බ. තුම්හෙ, යුෂ්මත්හු; ගච්ඡථ, යෙව්; මයං, අම්හෙ, අප; ගච්ඡාම යෙමු;
දු-එ. තං, තවං; තුවං, ත්වං, තුඹ; පස්සාමි, බලමි; මං, මමං, මා; රක්ඛ, රකුව;
දු-බ. තුම්හාකං, තුම්හෙ, යුෂ්මත්හු; පස්සාච, බලමු; අම්හාකං, අම්හෙ, අප; රක්ඛථ, රකිව්.
ත-එ. ත්වයා, තයා, තුඹ විසින්; පාපං කතං, පව්කාරණලදී; මයා, මා විසින්; පුඤ්ඤං කතං, පිංකරණලදී;
ත-බ. තුම්හෙහි. තුම්හෙභි, යුෂ්මතුන්ලා විසින්; දනානිදියතාත. දන්දෙනු ලැබෙත්; අම්හෙහි, අම්හෙභි, අපවිසින්; පුඤ්ඤානි කරීයන්ත, පිංකරණු ලැබෙත්.
කා-එ. ත්වයා, තයා, තුඹකරණකොට; සුඛං ලභාමි, සැපලබමි; මයා, මා කරණකොට; සග්ගසුඛං ලභ, සවගී සැපලබව;
කා-බ. තුම්හෙහි, තුම්හෙභි, යුෂ්මතුන්ලා කරණකොට; සප්පුරිසො භවාම, සත්පුරුෂයෙවමු; අම්හෙහි, අම්හෙභි, අපකරණකොට. සග්ගසුඛං ලභථ, සවගී සැපලබව්.
ච-එ. තව. තුයහං, තුම්හං, තුඹට; ධනං දදාමි, ධනයදෙමි, මම. මයහං, අම්හං, මමං, මට; ධනංදදාහි, ධනයදෙව,

**ච-බ.** තුම්හාකං, තුම්හෙ, යුෂ්මතුන්ලාට; වත්ථානිදදාම, වස්ත්‍රදෙමු; අම්හාකං, අම්හෙ, අපට; ඛාද්‍යනියානි දදථ, කෑයුතුදෙයක්දෙව්

**පං-ඒ.** ත්වයා, තයා, තුඹගෙන්; භයං මෙ නත්ථි, මට භයක් නැත් තේය; මයා, මාගෙන්; භයං තෙනත්ථි; තුඹටභයක්නැත්තේය

**පං-බ.** තුම්හෙහි, තුම්හෙභි, යුෂ්මතුන්ලාගෙන්; තෙසං භයං ජායතෙ, ඔවුන්ට භය උපදියි; අම්හෙහි, අම්හෙභි, අපගෙන්, ධම්මං සුණාථ, බණ අසව්;

**ඡ-ඒ.** තව, තුය්හං, තුම්හං, තුඹගේ; පුත්තො, පුත්‍රයායි; මම, මය්හං අම්හං, මමං, මාගේ; මාතා, මවයි;

**ඡ-බ.** තුම්හාකං, තුම්හෙ; යුෂ්මතුන්ලාගේ; ඤාතකා, නෑයෝයි; අම්හාකං, අම්හෙ, අපගේ; රාජා, රජය;

**ස-ඒ.** ත්වයි, තයි, තුඹකෙරෙහි, මනොමෙරමති; මාගේ සිතඇලෙයි මයි, මා කෙරෙහි; පසීද, පහදුව;

**ස-බ.** තුම්හෙසු, යුෂ්මතුන්ලා කෙරෙහි; චිත්තානිනරමන්ති, සිත් නොඇලෙත්; අම්හෙසු, අපකෙරෙහි; නෙපසීදන්ති, ඔහුතුමූ පහදිත්.

'තුම්හ' අම්හ, ශබ්දයෝ අලිඟුයි;

---

**'තුම්හ' ශබ්දයෙන් තෝය යන අර්ථහා අම්හ,ශබ්දයෙන් මමය යන අර්ථ කියත්.**

---

**ප-බ** වො, නොප; ගාමං, ගමට; ගච්ඡෙය්‍යාථ, යෙව්; නො, අප; ගාමං, ගමට, ගච්ඡෙය්‍යාම, යමු;

**දු-බ.** වො, නොප; පස්සන්ති, බලයි; නො, අප, පස්සති, බලයි.

**තු-ඒ.** තෙ, තාවිසින්; කතං, කරණලදී; මෙ, මාවිසින්; කතං කරණලදී;

**තු-බ.** වො, තොපවිසින්; කතං කම්මං, කරණලද කර්මයයි; නො, අප විසින්; කතං කම්මං, කරණලද කර්මයයි;

**ච-ඒ.** තෙ, තට; දදාමි, දෙමි; මෙ, මට; දදාහි, දෙව;

**ච-බ.** වො, තොපට; දදාමි, දෙමි; නො, අපට; දදාහි, දෙව;

**ඡ-ඒ.** තෙ, තාගේ; සද්ධා, ශ්‍රද්ධාවයි; මෙ, මාගේ; සත්ථා, ශාස්තෘයි;

**ඡ-බ.** වො,තොපගේ; සද්ධා,ශ්‍රද්ධාවයි;නො,අපගේ; සත්ථා,ශාස්තෘහුය.

අථ, ඉක්බිත්තෙන්; සංඛ්‍යාසඤ්ඤ,* සඞ්ඛ්‍යා ශබ්දයෝතුමූ; උච්චන්තෙ, කියනු ලැබෙත්; එකසඤ්ඤ, එකශබ්දයනෙම; සබ්බාදිසු, සර්ව ශබ්දදීන්හි; වුත්තොව, කියනලද්දේමය; වාදයො, විශබ්දයා ආදි කොට; අඨාරසන්නං, අඨාරස ශබ්දයා කෙළවරකෝට; ඇති(ශබ්දයාට) බහුවචනන්තා, බහුවචනාන්තයි.

ප-ද්වෙ, වෙ; රාජානො, රජදරුවෝ දෙදෙනෙක්තුමූ; රජ්ජං කරොන්ති, රාජ්‍යයකරත්;--දු-ද්වෙ, වෙ, රාජානො, රජදරුවෝ දෙදෙනෙක්; (කරා) උපසංකමාහි, එළඹෙන්නො;-ත-ද්වීහි, වීහි, රාජූහි රජදරුවන් දෙදෙනෙක් විසින්; කතසඞ්ගාමො, කරණලද සංග්‍රාමයෝයි ක—ද්වීහි, වීහි, රාජූහි, රජදරුවන් දෙදෙනෙක් කරණකොට; රඨවාසිනො, ජීවන්ති, රටවැස්සෝ ජීවත්වෙත්;--ච—ද්වින්නං, දුවින්නං, රාජූනං, රජදරුවන් දෙදෙනෙකුට; ලෙඛනානි දදාමි, ලියුම් දෙමි;-පං-ද්වීහි. වීහි රාජූහි, රජදරුවන් දෙදෙනෙකුගෙන්; ධනානිගණ්හාම, ධනයගණිමු;—ඡ-ද්වින්නං, දුවින්නං, රාජූනං, රජදරුවන් දෙදෙනෙකුගේ; නගරානි, නගරයෝයි;—ස-ද්වීසු රාජෙසු, රජදරුවන් දෙදෙනෙක් කෙරෙහි, ගාරවං කරොන්ති, ගෞරව කරත්;

**'ති' ශබ්දයෙන් තිසංඛ්‍යාවාච්‍ය අර්ථකියන්.**

(තීසුලිඞ්ගෙසුසමං, ලිඞ්ගත්‍රයෙහි සමයි;)

ප-තයො පුරිසා, පුරුෂයෝ තුන්දෙනෙක්තුමූ; ගච්ඡන්ති, යෙත්;—දු-තයොපුරිසෙ, පුරුෂයන් තුන්දෙනෙක්; පස්සාම, බලමු;—ත-තීහි තීහි පුරිසෙහි, පුරුෂයන් තුන්දෙනෙක් විසින්; කතො ආවාසො, කරණලද ආවාසයයි;—ක-තීහි, තීහිපුරිසෙහි, පුරුෂයන් තුන් දෙනෙක් කරණකොට; කෙච්ජීවන්ති, කිසිවෙක්හු ජීවත්වෙත්;—ච-තින්නං, තිණ්ණන්නං පුරිසානං, පුරුෂයන් තුන්දෙනෙකුට; බලං දදාම, බලයදෙමු;—පං-තීහි. තිහි පුරිසෙහි, පුරුෂයන් තුන්දෙනෙකුගෙන්; උපකාරං ඉච්ඡන්ති, උපකාරකැමතිවෙත්;—ඡ-තින්නං, තිණ්ණන්නං පුරිසානං, පුරුෂයන් තුන්දෙනෙකුගේ; ඤාණමහත්තතා, ඥාණමහත්බවයි;—ස-තීසු පුරිසෙසු, පුරුෂයන් තුන්දෙනෙක් කෙරෙහි; පසන්නභාවො, ප්‍රසන්නභාවයයි;

පුල්ලිඞ්ගං, පුල්ලිඟුයි;

ප-තිස්සො විජ්ජා, ත්‍රිවිද්‍යාවෝතුමූ; විජ්ජන්ති, විද්‍යමානවෙත්;—දු-තිස්සො විජ්ජායො, ත්‍රිවිද්‍යාවන්; උග්ගණ්හාමි, උගණිමි;—ත-තීහි, තීහි විජ්ජාහි, ත්‍රිවිද්‍යාවන් විසින්; අවිජ්ජාහතා, අවිද්‍යානොමෝ නසනලද් දහ;—ක-තීහි, තීහි විජ්ජාහි, ත්‍රිවිද්‍යාවන්කරණකොට; ජීවිස්සන්ති, ජීවත්වෙත්;-ච-තිස්සන්නං විජ්ජානං, ත්‍රිවිද්‍යාවන්ට; රොචෙමි රුචිවෙමි;-

පං-තීහි, තීහි විජ්ජාහි, ත්‍රිවිද්‍යාවන් කෙරෙන්; කො උපකාරො, කවර උපකාරද;—ඡ-තිස්සන්නං විජ්ජානං, ත්‍රිවිද්‍යාවන්ගේ; උත්තමභාවො, උත්තමභාවයයි;—ස-තීසුවිජ්ජාසු, ත්‍රිවිද්‍යාවන් කෙරෙහි; පසාදතා, ප්‍රසාදභාවයයි.

ඉත්ථිලිඞ්ගං, ස්ත්‍රීලිඟුයි.

---

ප-තීනිධම්මානි, ත්‍රිවිධධර්මයෝ තුමූ; සොභන්ති, හොබිත්; දු-තීනිධම්මානි, ත්‍රිවිධධර්මයන්; උග්ගණ්හාමි, උගණිමි;—ත-තීහි, තීහි ධම්මෙහි, ත්‍රිවිධධර්මයන් විසින්; හතොමොහො, නසනලද මෝහයයි;—ත-තීහි, තීහි ධම්මෙහි, ත්‍රිවිධධර්මයන්කරණකොට; සප්පුරිසොභවාමි, සත්පුරුෂයෙක්වෙමි;—ච-තිණ්ණන්නං, තිණ්ණන්නං ධම්මානං, ත්‍රිවිධධර්මයන්ට; මනං දදාමි, සිතදෙමි;—පං-තීහි, තීහි ධම්මෙහි, ත්‍රිවිධධර්මයන්කෙරෙන්; භයං නත්ථි, භයනැත්තේය;—ඡ-තිණ්ණන්නං, තිණ්ණන්නං ධම්මානං, ත්‍රිවිධධර්මයන්ගේ; නිම්මලභාවො, නිර්මලභාවයයි;—ස-තීසු ධම්මෙසු, ත්‍රිවිධධර්මයන්හි; අභිප්පසන්නො, මනාකොට ප්‍රසන්නය

නපුංසකලිඞ්ගං, නපුංසකලිඟුයි.

**'ති' ශබ්දයෙන් ත්‍රිසංඛ්‍යාවාච්‍ය අර්ථකියන්.**

---

ප-චත්තාරො චතුරොභික්ඛූ, භික්ෂූන් සතර නමක්තුමූ; ධම්මං දෙසෙන්ති, බණදෙසත්;—දු-චත්තාරො, චත්තාරො භික්ඛවො, භික්ෂූන් සතර නමක් වඳුමි, වඳිමි;—ත-චතූහි. චතූහි භික්ඛූහි, භික්ෂූන් සතරනමක් විසින්; කාරිතො විහාරො, කරවනලද විහාරයයි;—ක-චතූහි, චතූහි භික්ඛූහි, භික්ෂූන් සතරනමක්කරණකොට; සප්පුරිසාභවාම, සත්පුරුෂයෝවෙමු;—ච-චතුන්නං භික්ඛූනං, භික්ෂූන් සතරනමකට; අට්ඨපරික්ඛාරානි දදාම. අටපිරිකරදෙමු;—පං-චතූහි, චතූහි භික්ඛූහි, භික්ෂූන් සතර නමකගෙන්; ධම්මං උග්ගණ්හාම; බණ උගණිමු;—ඡ-චතුන්නං භික්ඛූනං, භික්ෂූන් සතරනමකගේ, පත්තචීවරානි, පාත්‍රාසිවුරුයි;—ස-චතූසු භික්ඛූසු, භික්ෂූන් සතර නමක් කෙරෙහි; චිත්තප්පසාදෙන සුගතිං ගච්ඡන්ති, චිත්තප්‍රසාදයෙන් සුගතියට යෙත්.

පුල්ලිඞ්ගං, පුල්ලිඟුයි.

---

ප-චතස්සො නාරියො, ස්ත්‍රීන් සතර දෙනෙක්තුමූ; තිට්ඨන්ති, සිටිති;—දු-චතස්සො නාරියො, ස්ත්‍රීන් සතර දෙනෙක්; පරියෙසිතුං ගච්ඡන්ති. සොයන්ටයත්;—ත-චතූහි, චතූහි නාරීහි, ස්ත්‍රීන් සතර දෙනෙක් විසින්; මාරිතො පුරිසො, මරණලද පුරුෂයායි;—ක-චතූහි, චතූහි නාරීහි, ස්ත්‍රීන් සතර දෙනෙක් කරණකොට; පුරිසාවධං පාපුණන්ති, පුරුෂයෝ වධයට පැමිණෙත්;—ච-චතස්සන්නං නාරීනං, ස්ත්‍රීන් සතර දෙනෙකුට; සඞ්ගහං කරොථ, සංග්‍රහකරව්;—

චතූහි, චතූහි නාරීහි, ස්ත්‍රීන් සතරදෙනෙක් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භය උපදිත්;-ශ-චතස්සන්නං නාරීනං, ස්ත්‍රීන්සතරදෙනාගේ; ආභරණානි, ආභරණයෝයි;-සු-චතූසු නාරීසු, ස්ත්‍රීන් සතරදෙනෙක් කෙරෙහි; චිත්තානි පසීදන්ති, සිත්පහදිත්.

ඉත්ථිලිඞ්ගං; ස්ත්‍රීලිඞ්ගයි.

---

ප-චත්තාරිකුසුමානි, මල්සතරක්තුමූ; විරොචන්ති, බබලත්; දු-චත්තාරි කුසුමානි, මල්සතරක්; ගණ්හාමි, ගණිමි,—ත-චතූහි, චතූහි කුසුමෙහි, මල්සතරක් විසින්; සොභිතා සාඛා, සොබනාලද සාඛාවෝයි;—කා-චතූහි, චතූහි කුසුමෙහි, මල්සතරක් කාරණකොට; කම්මගන්ධං කරොන්ති, මිමැස්සෝ මීකරත්;;—ච-චතුන්නං කුසුමානං, මල්සතරකට; ජලං සිඤ්චන්ති, ජලයඉසිත්;—පං-චතූහි, චතූහි කුසුමෙහි, මල්සතරක් කෙරෙන්; රේණුං ගණ්හන්ති, රේණු ගණිත්;—ශ-චතුන්නං කුසුමානං, මල්සතරකගේ; සුගන්ධා, සුගන්ධයෝයි;—ස—චතූසු කුසුමේසු, මල්සතරක් කෙරෙහි; මධුකරා විචරන්ති, මිමැස්සෝ හැසිරෙත්.

නපුංසකලිඞ්ගං, නපුංසකලිඞ්ගයි.

**'චතු' ශබ්දයෙන් චතු සංඛ්‍යාවාච්‍ය අර්ථ කියත්.**

---

ප-පඤ්ච, පුරිසා, පුරුෂයෝ පස්දෙනෙක්තුමූ; තිට්ඨන්ති, සිටිත්,—දු-පඤ්චපුරිසෙ, පුරුෂයන් පස්දෙනෙක්; පස්සාමි, බලමි;-ත-පඤ්චහි පඤ්චහි පුරිසෙහි, පුරුෂයන් පස්දෙනෙක් විසින්; කතො සක්කාරො, කරණලද සත්කාරයයි;—කා-පඤ්චහි, පඤ්චහි පුරිසෙහි, පුරුෂයන් පස්දෙනෙක් කරණකොට; කෙචිජීවිකං කප්පෙන්ති, කිසිවෙක්හු ජීවිකාවකරත්;—ච-පඤ්චන්නං පුරිසානං, පුරුෂයන් පස්දෙනාහට; පුඤ්ඤං දදමි, පින්දෙමි;—පං-පඤ්චහි, පඤ්චහි පුරිසෙහි, පුරුෂයන් පස්දෙනෙක් කෙරෙන්; භයං උප්පජ්ජති, භයඋපදියි;—ශ-පඤ්චන්නං පුරිසානං. පුරුෂයන් පස්දෙනාගේ; බලං, බලයයි;—ස-පඤ්චසු පුරිසෙසු, පුරුෂයන් පස්දෙනෙක් කෙරෙහි, පසාදො, පැහැදීමයි,

පුල්ලිඞ්ගං පුල්ලිඞ්ගයි.

---

ප-පඤ්ච සාලා, සාලාවෝ පසක්තුමූ; විරොචන්ති, බබලත්;—දු-පඤ්චසාලායො, සාලාවෝ පසක්; රක්ඛාම, රකිමු;—ත-පඤ්චහි, පඤ්චහි සාලාහි, සාලාවන් පසෙක් විසින්; සමලඞ්කතො විහාරො, සමලං

කෘතවිහාරයයි;—ක-පඤ්චහි, පඤ්චහි සාලාහි, සාලාවන් පසක්කරණකොට; එකච්චෙ පුඤ්ඤානි කරොන්ති, සමහරු පින්කරත්;—ච-පඤ්චන්නං සාලානං, සාලාවන් පසකට; දුරූනිදදම, දරදෙමු;—පං-පඤ්චහි, පඤ්චහි සාලාහි, සාලාවන් පසස්කරෙන්; කෙචිඉධාගච්ඡන්ති, කිසිවෙක්හු මෙහි එත්;—ඡ-පඤ්චන්නං සාලානං, සාලාවන්පසකගේ; ඡදනානි, ඡදනයෝයි;—ස-පඤ්චසුසාලාසු, සාලාවන් පසක්කෙරෙහි; දනානිදීයන්තෙ, දන්දෙනු ලැබෙත්.

ඉත්ථිලිඞ්ගං, ස්ත්‍රීලිඟුයි.

---

ප-පඤ්ච වනානි, වනයෝ පසක්තුමූ; විරොචන්ති, බබළත්;—දු-පඤ්චවනානි, වනයෝ පසක්; පස්සාම, බලමු;—ත-පඤ්චහි, පඤ්චහි වනෙහි, වනයන් පසක් විසින්; පරික්ඛිත්තො ජනපදො, වටකරණලද ජනපදයයි,—ක-පඤ්චහි, පඤ්චහි වනෙහි, වනයන් පසක්කරණකොට; ලුද්දකාජීවන්ති, වැද්දෝ ජීවත්වෙත්;—ච-පඤ්චන්නං වනානං වනයන් පසකට; අග්ගිංදදම, ගිණිදෙමු;—පං-පඤ්චහි, පඤ්චහි වනෙහි, වනයන් පසක් කෙරෙන්; සකුණා ආගච්ඡන්ති, පක්ෂීහු එත්;—ඡ-පඤ්චන්නං වනානං, වනයන් පසකගේ; විපුලභාවො, මහත්බවයි;—ස-පඤ්චසුවනෙසු, වනයන් පසක් කෙරෙහි; කුසුමානිවිජ්ජන්ති, මල් විද්‍යමානවෙත්.

නපුංසකලිඞ්ගං, නපුංසක ලිඟුයි.

**'පඤ්ච' ශබ්දයෙන් පඤ්චසංඛ්‍යාවාච්‍ය අර්ථයියක්.**

---

(ඡශබ්දය ආදිකොට අට්ඨාදස ශබ්දය කෙළවරකොට ඇති ශබ්දයෝද පඤ්චශබ්දයමෙන් ලිංගත්‍රයෙහිම යොදගතයුතු)

**බහුවචනගතා, බහුවචනාගතයි.**

---

ප-එ-එකූනවීසති භික්ඛවො, එකුන් විසිනමක් (19) භික්ෂූහු තුමූ; ගච්ඡන්ති, යෙත්;—ආ-එ-(භවන්තො) එකූනවීසති භික්ඛවෙ, පින්වත්) එකුන්විසිනමක්භික්ෂූණි;යෙති;ධම්මංදෙසෙථ,දහම්දෙසව්; දු—එ-එකූනවීසතිං භික්ඛවෙ, එකුන් විසිනමක් භික්ෂූන්; වන්දාම, වඳිමු;—ත-එ-එකූනවීසතියා භික්ඛූහි, එකුන්විසිනමක් භික්ෂූන්විසින්; පටිපත්තිපූරිතා, ප්‍රතිපත්තිපිරුවාහ;—ක-එ-එකූනවීසතියා භික්ඛූහි; එකුන් විසිනමක් භික්ෂූන්කරණකොට; සප්පුරිසො භවාමි; සත්පුරුෂවෙමි;—ච-එ-එකූනවීසතියා භික්ඛූනං, එකුන් විසිනමක් භික්ෂූන්ට, පරික්ඛාරානිදදම, පිරිකරදෙමු;—පං-එ-එකූනවීසතියා

භික්ඛූහි, එකුන් විසිනමක් භික්ෂූන්ගෙන්; සික්ඛාපදානි ගණ්හාම, ශික්ෂාපද ගණිමු;—ෂ-එ-එකූනවීසතියා භික්ඛූනං, එකුන් විසිනමක් භික්ෂූන්ගේ; විහාරා, විහාරයෝයි;—ස-එ-එකූනවීසතියං භික්ඛූසු, එකුන් විසිනමක් භික්ෂූන්කෙරෙහි; පසන්නා සුගතිං යන්ති, පැහැදුනෝ සුගතියට යෙත්.

**'එකූනවීසති' ශබ්දයෙන් එකක් අඩුවිස්සක් කියත්.**

---

වීසත්‍යාදයෝ, වීසතිශබ්දය ආදිකොට; ආනවුතියා, නවුති ශබ්දය කෙළවරකොට; (ඇති ශබ්දයෝ) ඉත්ථිලිඞ්ගෙකවචනන්තා, ස්ත්‍රීලිඞ්ග එකවචනාන්තයෝයි;

වීසති, වීසතිශබ්දයතෙම; රත්තීව, රත්තිශබ්දයාමෙනි;

(වීසති. එකවීසති යනාදීමේ ශබ්දයෝද එකූනවීසති ශබ්දයා මෙන් දතයුතුයි.) රත්තිසමා, රත්තිශබ්දයහාසමයි;

ප-එ-එකූනතිංසමාණවා, එකුන්තිසක් (29) මාණවකයෝ තුමූ; ධම්මං සුණන්ති, බණඅසිත්;--ආ-එ-(භො) එකූනතිංසෙමාණවෙ, (පින්වත්) එකුන්තිසක් මාණවකයෙනි; පුඤ්ඤානිකරොථ, පිං කරව්;—දු-එ-එකූනතිංසං මාණවෙ, එකුන්තිසක් මාණවකයන්; සජ්ඣායං කරොන්ති, සජ්ඣායනාකරත්;-ත-එ-එකූනතිංසාය මාණවෙහි, එකුන්තිසක් මාණවකයන් විසින්; කතාරාමො, කරණලද ආරාමයයි;--කි-එ-එකූනතිංසාය මාණවෙහි, එකුන්තිසක් මාණවකයන් කරණකොට; සුඛානිලභාම, සැපලබමු;—ච-එ-එකූනතිංසාය මාණවකානං, එකුන්තිසක් මාණවකයන්ට; භොජනානිදෙන්ති, බොජුන්දෙත්;--පං--එ--එකූනතිංසාය මාණවකෙහි, එකුන්තිසක් මාණවකයන් කෙරෙන්; භයානි උප්පජ්ජන්ති, භයඋපදිත්;—ඡ-එ-එකූනතිංසාය මානවකානං, එකුන්තිසක් මාණවකයන්ගේ; ගාමානි, ග්‍රාමයෝයි;—ස-එ-එකූනතිංසායං මාණවකෙසු, එකුන් තිසක් මාණවකයන්කෙරෙහි; අනුකම්පං කරොථ, අනුකම්පාකරව්.

**'එකූනතිංසා' ශබ්දයෙන් එකක් අඩුතිසක් කියත්.**

---

තිංසති. ශබ්දය ආදිකොට අසීතිංසා ශබ්දය කෙළවරකොට ඇති ශබ්දද එකූනතිංසා ශබ්දයමෙන් දතයුතුයි

---

ප-එ-එකූනචත්තාලීසතිගාථා, එකුන් සතළිසක් (39) ගාථායෝතුමූ; විචරන්ති, හැසිරෙත්;—ආ-එ-(භො) එකූනචත්තාලීසති

ගාවො, (පින්වත්) එකුන්සතළිසක් ගවයෙනි; ඛීරානිදදථ, කිරි දෙව්;—දු-එ-එකූනචත්තාළීසාහි ගාවීහි, එකුන්සතළිසක් ගවයින්; පරිවෙසසනාති, පොෂයත්; —ත-එ-එකූනචත්තාළීසායගොහි, එකුන්සතළිසක් ගවයන් විසින්: ඛාදිතානිඛාදනානි, කනලද්දවූ ක්ෂෙත්‍රයෝයි;—ය-එ-එකූනචත්තාළීසායගොහි, එකුන්සතළිසක් ගවයන්කාරණකොට; භාරෙනියනානි, බරගෙණියත්;—ච-එ-එකූනචත්තාළීසතියාගුණ්ණං, එකුන්සතළිසක් ගවයන්ට; පාණීයංදදමි, පැන්දෙමි;—පං-එ-එකූනචත්තාළීසතියාගොහි, එකුන්සතළිසක් ගවයන් කෙරෙන්: භයානි උප්පජ්ජනාති, භය උපදිත්;—ජ්-එ-එකූනචත්තාළීසතියා ගුණ්ණං, එකුන් සතළිසක් ගවයන්ගේ; බුරසිංහානි, බුරහාණයෝයි;—ස-එ-එකූනචත්තාළීසතියං ගොසු, එකුන් සතළිසක් ගවයන් කෙරෙහි; පීති උප්පජ්ජනාති. ප්‍රීති උපදීත්;—

චත්තාළීසති චත්තාළීසා ඉති ආදි,-පෙ-සනාදීය; පුබ්බඉව, පෙරමෙනි;

එකූනචත්තාළීසා ඉත්‍යිමෙයා. එකූනචත්තාරීසති එලාති එකූන චත්තාරීසාතුරඟා, යනාදී මේ ශබ්දයෝද එකූනචත්තාළීසති ශබ්දය හා සමානයෝයි.

චත්තාළීසති ශබ්දය ආශ්‍රිකොට අඬ චත්තාරීසති ශබ්දය කෙළවරකොට ඇති ශබ්දයෙයාද එකූනචත්තාළීසති ශබ්දයමෙන් දත යුතුයි.

ප-එ-එකූනපඤ්ඤාසාරුක්ඛා, එකුන්පනසක් (49). වෘක්ෂයෝ තුමූ; විජ්ජනාති, විද්‍යමානවෙත්;—ආ-එ-(භවතො) එකූනපඤ්ඤාසෙ රුක්ඛා, (පින්වත්) එකුන් පනසක් වෘක්ෂයෙනි; ඵලානිදෙථ, ගෙඩිදෙව්;—දු-එ-එකූනපඤ්ඤාසාරුක්ඛෙහි, එකුන් පනසක් වෘක්ෂයන්; ඡින්දාමි, සිඳිමි;—තු-එ-එකූනපඤ්ඤාසාය රුක්ඛෙහි, එකුන් පනසක් වෘක්ෂයන් විසින්; සුගොතා භූමිපදෙසා, සමන්විතවූ භූමි ප්‍රදේශයයි;—ක-එ-එකූනපඤ්ඤාසාය රුක්ඛෙහි, එකුන්පනසක් වෘක්ෂයන්කාරණකොට, මනුස්සානා ජීවනාති, සමහර සත්වයෝ ජීවත් වෙත්,—ච-එ, එකූනපඤ්ඤාසාය රුක්ඛානං, එකුන්පනසක් වෘක්ෂයන්ට; ජලං දදමි, ජලයදෙමි;—පං-එ-එකූනපඤ්ඤාසාය රුක්ඛෙහි, එකුන් පනසක් වෘක්ෂයන් කෙරෙන්; පතිතානි ඵලානි, වැටුනාවූ ඵලයෝයි;—ඡ-එ-එකූනපඤ්ඤාසාය රුක්ඛානං, එකුන් පනසක් වෘක්ෂයන්ගේ, සාඛා, සාඛාවෝයි;—ස-එ-එකූනපඤ්ඤාසාය රුක්ඛෙසු, එකුන්පනසක් වෘක්ෂයන් කෙරෙහි; සකුණා වසනාති පක්ෂිහුවෙසෙත්;

එකූනපඤ්ඤාසති. එකූනපඤ්ඤාසා ඉති, එකූන—පෙ—යන මේ ශබ්දයෝද; කඤ්ඤාසමා, කඤ්ඤාශබ්දය හා සමානයෝයි;

පඤ්ඤාසා පඤ්ඤාසං (හො) පඤ්ඤාසෙ ඉච්චාදි, පඤ්ඤාසා-පෙ-යන මේ ආදී ශබ්දයෝද; පුබ්බෙව, පූර්වයෙහි මෙනි;

එකූනපඤ්ඤාසා ශබ්දය පටන් අට්ඨපණ්ණාසා ශබ්දය දක්වා ඇති ශබ්දයෝද එකූනපඤ්ඤාසා ශබ්දයමෙන් දතයුතුයි;

පි—එ-එකූනසට්ඨිපුරිසා; එකූන්සැටක් (59) පුරුෂයෝතුමූ; තිට්ඨන්ති, සිටිත්;—ආ-එ-(භවන්තො) එකූනසට්ඨිපුරිසා, (පින්වත්) එකූන්සැටක් පුරුෂයෙනි; තුම්හෙ සප්පුරිසා භවථ, තෙපි සත්පුරුෂ වව්;—දු-එ-එකූනසට්ඨිං පුරිසෙ, එකූන් සැටක් පුරුෂයන් පස්සාම, බලමු;—ත-එ-එකූනසට්ඨියා පුරිසෙහි, එකූන්සැටක් පුරුෂයන් විසින්; දානානිදීයන්තෙ, දන් දෙනුලැබෙත්,—ක-එ-එකූනසට්ඨියා පුරිසෙහි, එකූන් සැටක් පුරුෂයන්කරණකොට; ජීවාමි, ජීවත්වෙමි;—ච-එ-එකූනසට්ඨියා පුරිසානං, එකූන් සැටක් පුරුෂයන්ට; සුඛං දදාමි, සැපදෙමි;—පං-එ-එකූනසට්ඨියා පුරිසෙහි, එකූන් සැටක් පුරුෂයන් කෙරෙන්; භයං උප්පජ්ජති, භය උපදියි;—ඡ-එ-එකූනසට්ඨියා පුරිසානං, එකූන් සැටක් පුරුෂයන්ගේ; බලං, බලයයි;—ස-එ-එකූන සට්ඨියං. එකූනසට්ඨියා පුරිසෙසු, එකූන් සැටක් පුරුෂයන් කෙරෙහි; පසාදො, ප්‍රසාදයයි;

(භො) එකූනසට්ඨිඉති ආදි, (භො) එකූනසට්ඨි යනාදි ශබ්දයෝ; (අඨනවුති ශබ්දය දක්වා) මතිසද්දසමා, මති ශබ්දය හා සමානයෝයි.

ප—එ-එකූනසතං අරහන්තා, එකූන්සියයක් (99) රහතන් වහන්සේලාතුමූ; වසන්ති, වෙසෙත්;—ආ-එ-(භො) එකූනසතං අරහන්තා, (පින්වත්) එකූන් සියයක් රහතුනි; සත්තෙ දුක්ඛාපමුච, සත්වයන් දුකින්මුදව්;—දු-එ-එකූනසතං අරහන්තෙ එකූන්සියයක් රහතුන්; වන්දාම, වඳිමු;—ත-එ-එකූනසතෙන අරහන්තෙහි, එකූන් සියයක් රහතුන් විසින්; කතාඉද්ධිපාටිහාරියානි, කරණලද ඉර්ධි ප්‍රාතිහාර්යයෝයි;—ක-එ-එකූනසතෙන අරහන්තෙහි, එකූන් සියයක් රහතුන් කරණකොට; දුක්ඛමොමුච්චන්ති, දුකින්මිදෙත්;—ච-එ-එකූනසතස්ස අරහන්තානං, එකූන් සියයක් රහතුන්ට; දානං දදාම, දන්දෙමු;—පං-එ-එකූනසතා. එකූනසතම්හා. එකූනසතස්මා අරහන්තෙහි, එකූන්සියයක් රහතුන් කෙරෙන්; සද්ධම්මං උග්ගණ්හාම, සදහම් උගණිමු;—ඡ-එ-එකූනසතස්ස අරහන්තානං, එකූන් සියයක් රහතුන්ගේ; පාටිහාරියං පස්සථ, ප්‍රාතිහාර්යබලව්;

ස—එ-එකූනසතෙ. එකූනසතමහි, එකූනසතසම්ං අරහන්තානං, එකූන්සියයක් රහතුන් කෙරෙහි; සාතපසාදේනසුඛං දදති, කරණ ලද පැහැදීමෙන් සැපදෙයි.

සතොපපභුති, සතශබ්දයා මුල්කොට ඇති .යාවසතසහස්සං, සතසහස්ස ශබ්දය දක්වා; එවං, මෙසේමැයි.

කොටි, කොටිශබ්දය; පකොටි, පකොටිශබ්දය; කොටිප්ප කොටි, කොටිප්පකොටි ශබ්දය; අක්ඛොභිණීයො, අක්ඛොභිණීශබ්දය; (යන මේ ශබ්දයෝ) ඉත්ථිලිඞ්ගකාවචනනතා, ස්ත්‍රී ලිඟු එක වචනාන්තයෝයි;

**දසදසකං, දසදසකයක්; සතං නාම, සියයක්නම්; දසසතං, දසසතකයක්; සහස්සං, දහසක්නම්; දසසහස්සං, දසසහස්‍රයක්; නවුතං, නවුතයක්නම්; දසනවුතං, දසනවුතයක්; ලක්ඛං, ලක්ෂ යක්නම්; සතසහස්සංතිපි, සියක් දහසකැයිද; වුච්චති, කියනුලැබේ.**

**ලක්ඛසතං, ලක්ෂසියයක්; කොටි, කෝටියක්වෙයි; කොටිලක්ඛ සතං, කොටිලක්ෂසියයක්, පකොටි, ප්‍රකොටියක්වෙයි; පකොටි ලක්ඛසතං, ප්‍රකොටිලක්ෂසියයක්; කොටිප්පකොටි, කොටිප්‍රකොටි යක්වෙයි; කොටිප්පකොටි ලක්ඛසතං, කෝටිප්‍රකොටිලක්ෂසියයක්; නහුතං, නහුතයක්වෙයි; .නහුතලක්ඛසතං, නහුතලක්ෂසියයක්; නින්නහුතං, නින්නහුතයක්වෙයි; නින්නහුතලක්ඛසතං, නින්නහුත ලක්ෂසියයක්; අක්ඛොභිණී අක්ෂොභිණීයක්වෙයි; අක්ඛොභිණී ලක්ඛ සතං,අක්ෂොභිණී ලක්ෂසියයක්; බින්දු, බින්දුවක්වෙයි;බින්දුලක්ඛසතං, බින්දුලක්ෂසියයක්; අබ්බුදං, අර්බුදයක්වෙයි; අබ්බුදලක්ඛසතං, අර් බුදලක්ෂසියයක්; නිරබ්බුදං, නිරර්බුදයක්වෙයි;නිරබ්බුද ලක්ඛසතං, නිරර්බුදලක්ෂසියයක්; අහහං, අහහයක්වෙයි; අහහලක්ඛසතං, අහ හලක්ෂසියයක්; අබබං, අබබයක්වෙයි;අබබලක්ඛසතං, අබබලක්ෂසිය යක්; අටටං, අටටයක්වෙයි;අටටලක්ඛසතං, අටටලක්ෂසියයක්, සොග න්ධිකං, සොගන්ධිකයක්වෙයි;සොගන්ධිකලක්ඛසතං,සොගන්ධිකලක්ෂසිය යක්; උප්පලං, උප්පලයක්වෙයි; උප්පල ලක්ඛසතං, උප්පලලක්ෂසිය යක්; කුමුදං, කුමුදයක්වෙයි; කුමුද ලක්ඛසතං, කුමුදලක්ෂසියයක්; පුණ්ඩරීකං, පුණ්ඩරීකයක්වෙයි; පුණ්ඩරීක ලක්ෂසතං, පුණ්ඩරීක ලක්ෂසියයක්; පදුමං, පදුමයක්වෙයි; පදුමලක්ඛසතං, පදුමලක්ෂසිය යක්; කථානං, කථානයක්වෙයි; කථානලක්ඛසතං, කථානලක්ෂසිය යක්, මහාකථානං, මහාකථානයක්වෙයි; මහාකථාන ලක්ඛසතං, මහාකථානලක්ෂසියයක්; අසංඛෙය්‍යංතිපි, අසංඛෙය්‍යයනුද; යථා ක්කමං, පිළිවෙළින්; සතලක්ඛගුණං, සියක් ලක්ෂයක් ගුණකොට ඇති; (ශබ්දයෝද) එවං, මෙසේ; වෙදිතබ්බං, දතයුතු;**

සංඛ්‍යා සංගීත නාමපදමාලා

නිට්ඨිතා.

# ආඛ්‍යාතපද්මාලා.

“යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචි තිකාරකං
අතිලිඞ්ගං ද්විවචනං තදාඛ්‍යාතන්ති වුච්චති”.

යං, යම්පදයක්තෙම්; තිකාලං, (අතීත අනාගත වර්තමානයන) කාලත්‍රයක් ඇත්තේද; තිපුරිසං, (ප්‍රථම මධ්‍යම උත්තමයන) පුරුෂත්‍රයක් ඇත්තේද; ක්‍රියාවාචි, (ගමනපචනාදිවූ ධාත්වර්ථයයි කියනලද) ක්‍රියාවාචීද; තිකාරකං, (කර්තෘකර්මභාවයන) කාරකත්‍රයක් ඇත්තේද අතිලිඞ්ගං, (ස්ත්‍රී පුරුෂ නපුංසකයන) ලිඞ්ගත්‍රයරහිතද; ද්විවචනං, (ඒකවචන බහුවචනයන) වචනද්වයක් ඇත්තේද; තං, ඒපදයතෙම; ආඛ්‍යාතං ඉති, ආඛ්‍යාතයයි; වුච්චති, කියනු ලැබේ.

(යම් පදයක් අතීත. අනාගත. වර්තමාන. සඞ්ඛ්‍යාත කාලතුනක් ඇත්තේද, ප්‍රථම. මධ්‍යම. උත්තම යන පුරුෂ තුනක් ඇත්තේද ගමන් පිසීම් සිටීම් ආදීවූ ක්‍රියා කියන ස්වභාව ඇත්තේද කර්තෘකර්ම භාවයන කාරක තුනක් ඇත්තේද ස්ත්‍රී පුරුෂ නපුංසක යන තුන් ලිඞ්ගය නැත්තේද ඒකවචන බහුවචන යන වචන දෙකක් ඇත්තේද ඒ පදය ආඛ්‍යාතයයි කියනු ලැබේ, යනුමෙහි අභිප්‍රායයි).

වත්තමානා, ති. අන්ති. සි. ථ. මි. ම—තෙ. අන්තෙ. සෙ. ව්හෙ. ඒ. ම්හෙ, යන සූත්‍රයෙන්, ති. අන්ති. ආදී ප්‍රත්‍යයදොළස, වත්තමානා වර්තමාන විභක්තිනම්වෙත්.

පච්චුප්පන්නෙ, ප්‍රත්‍යුත්පන්න (දැන් පවත්නා) කාලයෙහි; වත්තමානා, වර්තමාන විභක්තීහුවෙත්; කත්තරිපරස්සපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි; (උදාහරණ කියනු ලැබේ.),

සො, හෙතෙම; ඕදනං, බත; පචති, පිසයි;
තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචන්ති, පිසත්.
ත්වං, තෝ; ඔදනං, බත; පචසි, පිසෙහි.
තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචථ, පිසහු;
අහං, මම; ඔදනං, බත; පචාමි, පිසමි;
මයං, අපි; ඔදනං, බත; පචාම, පිසමු;

**‘පචති’**, ඉති වත්තමානා විභත්ති සකම්මක ධාතුකත්තුකාරක පරස්ස පදපඨමපුරිස එකවචනන්ත ආඛ්‍යාත ක්‍රියාපදා, තෙනවුත්තත්තා **‘සො’** ඉති වුත්තකත්තුනිද්දෙසො, තෙන අවුත්තත්තා **‘ඔදනං’** ඉති අනුත්තකම්ම නිද්දෙසො.

'පචන්ති' ඉතිවත්තමාන විභත්ති සකම්මකධාතුකත්තු කාරක පරස්සපද පඨම පුරිස බහුවචනන්ත ආඛ්‍යාත ක්‍රියාපදං, තෙනවුත්තත්තා 'තෙ' ඉති වුත්තකත්තු නිද්දෙසො, තෙන අවුත්තත්තා 'ඔදනං' ඉති අනුත්තකම්මනිද්දෙසො.

**පචසි**, ඉතිවත්තමාන විභත්ති සකම්මක ධාතුකත්තුකාරක පරස්සපද මජ්ඣිම පුරිස එකවචනන්ත ආඛ්‍යාත ක්‍රියාපදං, තෙනවුත්තත්තා 'ත්වං' ඉති වුත්තකත්තු නිද්දෙසො, තෙන අවුත්තත්තා '**ඔදනං**' ඉති අනුත්තකම්ම නිද්දෙසො.

**පචථ**, ඉතිවත්තමාන විභත්ති සකම්මක ධාතුකත්තුකාරක පරස්සපද මජ්ඣිමපුරිස බහුවචනන්ත ආඛ්‍යාත ක්‍රියාපදං, තෙන වුත්තත්තා '**තුම්හෙ**' ඉතිවුත්තකත්තු නිද්දෙසො, තෙනඅවුත්තත්තා '**ඔදනං**' ඉතිඅනුත්තකම්මනිද්දෙසො.

**පචාමි**, ඉතිවත්තමාන විභත්ති සකම්මක ධාතුකත්තුකාරක පරස්සපද උත්තමපුරිස එකවචනන්ත ආඛ්‍යාත ක්‍රියාපදං, තෙනවුත්තත්තා '**අහං**' ඉති වුත්තකත්තු නිද්දෙසො, තෙන අවුත්තත්තා '**ඔදනං**' ඉති අනුත්තකම්මනිද්දෙසො.

**පචාම**, ඉතිවත්තමාන විභත්ති සකම්මකධාතුකත්තුකාරකපරස්සපද උත්තමපුරිස බහුවචනන්ත ආඛ්‍යාතක්‍රියාපදං, තෙනවුත්තත්තා '**මයං**' ඉති වුත්තකත්තු නිද්දෙසො, තෙනඅවුත්තත්තා '**ඔදනං**' ඉති අනුත්තකම්මනිද්දෙසො.

**පචති**, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතුකර්තෘකාරක පරස්මෛ පද ප්‍රථම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදයකි, ඔහුවිසින් (ඒ ආඛ්‍යාතය විසින්) කියනලද හෙයින් '**සො**' යනු උක්තකර්තෘ නිර්දේශයි, ඔහුවිසින් නොකියනලද හෙයින් '**ඔදනං**' යනු අනුක්ත කර්ම නිර්දේශයි,—**පචන්ති**, යනු වර්තමාන විභක්ති සකර්මකධාතුකර්තෘ කාරක පරස්මෛපද ප්‍රථමපුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදයකි ඔහු විසින් කියනලද හෙයින් '**තෙ**' යනු උක්තකර්තෘ නිර්දේශයි, ඔහුවිසින් නොකියනලද හෙයින් '**ඔදනං**' යනු අනුක්තකර්ම නිර්දේශයි,—**පචසි**, යනු වර්තමාන විභක්තිසකර්මක ධාතුකර්තෘකාරක පරස්මෛපද මධ්‍යම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදයකි, ඔහු විසින් කියනලද හෙයින් 'ත්වං' යනු උක්තකර්තෘ නිර්දේශයි, ඔහුවිසින් නොකියනලද හෙයින් '**ඔදනං**' යනු අනුක්තකර්ම නිර්දේශයි,—**පචථ**, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතුකර්තෘකාරක පරස්මෛපද මධ්‍යම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදයකි, ඔහු විසින් කියනලද හෙයින් '**තුම්හෙ**' යනු උක්තකර්තෘ නිර්දේශයි,

ඔහු විසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්ම නිර්දේසයි,—පචාමි, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක පරස්මෛපද උත්තම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදයකි, ඔහු විසින් කියනලද හෙයින් 'අහං' යනු උක්තකර්තෘ නිර්දේසයි, ඔහු විසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්ම නිර්දේසයි,– පචාම, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක පරස්මෛපද උත්තමපුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදයකි, ඔහුවිසින් කියනලද හෙයින් 'මයං' යනු උක්තකර්තෘ නිර්දේසයි, ඔහුවිසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්ම නිර්දේසයි.

කත්තරි අත්තනෝපදෙ, කර්තෘකාරක ආත්මනේ පදයෙහි; (උදාහරණ කියනු ලැබේ) සො, හෙතෙම; ඔදනං, බත; පචතෙ, පිසේ, තෙ, ඔහුහු; ඔදනං, බත; පචන්තෙ, පිසෙත්; ත්වං, තෝ; ඔදනං; බත; පචසෙ, පිසෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචව්හෙ, පිසහු: අහං, මම; ඔදනං, බත; පචෙ, පිසමි; මයං, අපි; ඔදනං, බත; පචාමහෙ, පිසමු;

'පචතෙ' යනු * වර්තමාන විභක්ති සකර්මකධාතු කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් 'සො' යනු උක්තකර්තෘයි, ඔහුවිසින් නොකියනලද හෙයින් 'ඔදනං, යනු අනුක්තකර්මයි,—'පචන්තෙ' යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් 'තෙ' යනු උක්තකර්තෘයි, ඔහු විසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්මයි,—'පචසෙ' යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපද මධ්‍යම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදය, ඔහුවිසින් කියනලද හෙයින් 'ත්වං' යනු උක්තකර්තෘයි, ඔහුවිසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්මයි,—'පචව්හෙ' යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපද මධ්‍යම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදය, ඔහු විසින් කියනලද හෙයින් 'තුම්හෙ' යනු උක්තකර්තෘයි, ඔහුවිසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්මයි,—'පචෙ' යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්තෘකාරක ආත්මනෙපද උත්තම පුරුෂ එකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් 'අහං' යනු උක්තකර්තෘයි ඔහු විසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්මයි,—'පචාමහෙ' යනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්තෘකාරක ආත්මනෙ පද උත්තමපුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් 'මයං' යනු උක්තකර්තෘයි, ඔහුවිසින් නොකියනලද හෙයින් 'ඔදනං' යනු අනුක්තකර්මයි.

කම්මනි අත්තනෝපදෙ, කර්මකාරක ආත්මනෙ පදයෙහි; උදාහරණ කියනු ලැබේ.

---

* මෙතැන් පටන් භාවය පමණක් දක්වනු ලැබේ.

තෙන. තයා. මයාවා. ඔහුවිසින් හෝ; තාවිසින් හෝ, මාවිසින් හෝ; සොඔදනො, ඒ ආහාරයතෙව; පච්චතෙ, පිසනු ලැබේ; තෙන, ඔහුවිසින්; තෙඔදනා, ඒ ආහාරයොතුමූ; පච්චන්තෙ, පිසනු ලැබෙත්; තයා, තාවිසින්; ත්වංඔදනො, ආහාරවූ තෝ; පච්චසෙ, පිසනු ලැබෙහි; තයා, තාවිසින්; තුමෙහඔදනා, ආහාරවූ තෙපි; පච්චවෙහ, පිසනු ලබහු; මයා, මාවිසින්; අහං ඔදනො, ආහාරවූ මම; පචෙච, පිසනු ලබමි; මයා, මා විසින්; මයං ඔදනා, ආහාරවූ අපි; පච්චාමෙහ, පිසනු ලබමු.

**'පච්චතෙ'** යනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්මකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් **'සො'** යනු උක්තකර්මයි, ඔහු විසින් නොකියන ලද හෙයින් **'තෙනකාසාමසා'** *—යනු අනුක්තකර්තෘයි,—**'පච්චන්තෙ'** යනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්මකාරක ආත්මනෙපද ප්‍රථම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් **'තෙ'** යනු උක්තකර්මයි, ඔහුවිසින් නොකියනලද හෙයින් **'තෙනකාසාමසා'** යනු අනුක්තකර්තෘයි,—**'පච්චසෙ'** යනු වර්තමාන විභක්ති සකර්මක ධාතුකර්මකාරක ආත්මනෙපද මධ්‍යම පුරුෂ ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් **'ත්වං'** යනු උක්තකර්මයි, ඔහුවිසින් නොකියනලද හෙයින් **'තෙනකාසාමසා'** යනු අනුක්තකර්තෘයි,—**'පච්චවෙහ'** යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්මකාරක ආත්මනෙපද මධ්‍යම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියනලද හෙයින් **'තුමෙහ'** යනු උක්තකර්මයි, ඔහු විසින් නොකියනලද හෙයින් **'තෙනකාසාමසා'** යනු අනුක්තකර්තෘයි,—**'පචෙච'** යනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්මකාරක ආත්මනෙපද උත්තම පුරුෂ ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් **'අහං'** යනු උක්තකර්මයි, ඔහු විසින් නොකියනලද හෙයින් **'තෙනකාසාමසා'** යනු අනුක්තකර්තෘයි, **'පච්චාමෙහ'** යනු වර්තමාන විභක්ති සකර්මකධාතු කර්මකාරක ආත්මනෙපද උත්තම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කියනලද හෙයින් **'මයං'** යනු උක්තකර්මයි, ඔහු විසින් නොකියනලද හෙයින් **'තෙනකාසාමසා'** යනු අනුක්තකර්තෘයි.

කම්මනිපරස්සපදෙ, කර්මකාරක පරස් මෛපදයෙහි,

තෙන. තයා. මයාවා, ඔහුවිසින් හෝ, තාවිසින්හෝ, මාවිසින් හෝ; සොඔදනො, ආහාරවූ හෙතෙම; පච්චති, පිසනුලැබේ; තෙන, ඔහු විසින්; තෙඔදනා ආහාරවූ ඔහුතුමූ; පච්චන්ති, පිසනු ලැබෙත්; තයා, තාවිසින්; ත්වං ඔදනො, ආහාරවූතෝ; පච්චසි, පිසනු ලැබෙහි; තයා, තාවිසින්; තුමෙහ ඔදනා, ආහාරවූ තෙපි; පච්චථ, පිසනු ලබහු, මයා, මාවිසින්; අහං ඔදනො, ආහාරවූ මම; පච්චාමි, පිසනුලබමි; මයා, මාවිසින්; මයං ඔදනා, ආහාරවූ අපි, පච්චාම, පිසනු ලබමු.

* 'තෙන, කියාහො 'තයා, කියාහො 'මයා, කියාහො ද්‍රැද යොජනා කටයුතු.

**‘පචති’** යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්මකාරක පරස්සෙපද ප්‍රථම පුරුෂ ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කියන ලද හෙයින් **‘සො’** යනු උක්තකර්මයි, ඔහු විසින් නොකියනලද හෙයින් **‘ඔතනනාසාමයා’** යනු අනුක්තකර්තෘයි,—**‘පචන්ති’**, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්මකාරක පරස්සෙපද ප්‍රථමපුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කථිත හෙයින් **‘තෙ’** යනු උක්තකර්මයි, ඔහු විසින් අකථිත හෙයින් **‘ඔතනනාසාමයා’** යනු අනුක්තකර්තෘයි,—**‘පචසි’** යනු වර්තමාන විභක්ති සකර්මකධාතුකර්මකාරක පරස්සෙපද මධ්‍යම පුරුෂ ඒකවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහුවිසින් කථිත හෙයින් ‘ත්වං’ යනු උක්තකර්මයි, ඔහු විසින් අකථිත හෙයින් **‘ඔතනනසාමයා’** යනු අනුක්තකර්තෘයි,—**‘පචථ’**, යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්මකාරක පරස්සෙපද මධ්‍යම පුරුෂ බහුවචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කථිත හෙයින් **‘තුම්හෙ’** යනු උක්තකර්මයි, ඔහු විසින් අකථිත හෙයින් **‘ඔතනනසාමයා’** යනු අනුක්තකර්තෘයි,—**‘පචාමි’** යනු වර්තමාන විභක්ති සකර්මක ධාතුකර්මකාරක පරස්සෙපද උත්තම පුරුෂෛක වචනාන්ත ආඛ්‍යාත ක්‍රියාපදය, ඔහු විසින් කථිත හෙයින් **‘අහං’** යනු උක්තකර්මයි, ඔහු විසින් අකථිත හෙයින් තෙන, තයා, මයා, යනු අනුක්තකර්තෘයි,—**‘පචාම’** යනු වර්තමාන විභක්ති සකර්මක ධාතු කර්මකාරක පරස්සෙපද උත්තමපුරුෂෛක වචනාන්ත ආඛ්‍යාත ක්‍රියා පදය, ඔහු විසින් කථිත හෙයින් **‘මයං’** යනු උක්තකර්මයි, ඔහු විසින් අකථිත හෙයින් **‘ඔතනනසාමයා’** යනු අනුක්ත කර්තෘයි.

භාවෙ, භාවකාරකයෙහි;

භූයති, වීමයි; භූයතෙ ඉති, වීමය යනු; ආදි, මේ ආදියවේ;

**‘භූයති’** යනු වර්තමාන විභක්ති අකර්මකධාතුභාවකාරක පරස්සෙපද ආඛ්‍යාත ක්‍රියා පදය,—**‘භූයතෙ’** යනු වර්තමාන විභක්ති අකර්මක ධාතුභාවකාරක අත්තනොපද ආඛ්‍යාත ක්‍රියාපදය.

(පඤ්චමී සත්තමී ආදී යෙහිද (උක්තානුක්ත) මෙසේ යොදා ගත යුතුයි.

වත්තමානා. තු. අන්තු. හි. ථ. මි. ම—තං. අන්තං. ස්සු. වෝ. ඒ. ආමසෙ, යන සූත්‍රයෙන් තු අන්තු ආදි ප්‍රත්‍යදොළස, පඤ්චමී, පඤ්චමී විභක්ති නම්; ආණත්ති ආසිට්ඨෙ, ආඥාවක්ද ආසිංසනයක්ද ඇත්තාවූ; අනුත්තකාලෙ, ආම්පයෙහි කියනලද කාලයෙහි; පඤ්චමී; පඤ්චමී විභක්තියවේ;—

කත්තරිපරස්සපදෙ, කර්තෘකාරක පරස්සෙපදයෙහි;

සො, හෙතෙම; ඔදනං, බත; පචතු, පිසේවා; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචන්තු, පිසෙත්වා; ත්වං, තෝ; ඔදනං, බත; පච. පචාහි, පිසෙහිවා; (නොහොත් පිසව) තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචථ, පිසව්වා; (නොහොත් පිසව්) අහං, මම; ඔදනං, බත; පචාමි, පිසෙමිවා; මයං, අපි; ඔදනං, බත; පචාම, පිසමුවා.

(ඒ ඒ විභක්තිවල කර්තෘකාරක පරස්මෛපදයට හා කර්මකාරක ආත්මනෙ පදයටත් ඇඹී යොදන පරිද්දෙන් කර්තෘකාරක ආත්මනෙ පදයට හා කර්මකාරක පරස්මෛ පදයටත් යොදගතයුතු)

කම්මනි අත්තනො පදෙ, කර්මකාරක ආත්මනෙ පදයෙහි;

තෙන තයාමයාවා, ඔහු විසින් හෝ තා විසින් හෝ. මා විසින් හෝ; සො ඔදනො, ආහරවූ හෙතෙම; පච්චතං, පිසනු ලැබේවා; (ඔහු විසින්) තෙ ඔදනා, ආහරවූ ඔහුතුමූ; පච්චන්තං, පිසනු ලබත්වා; (තා විසින්) ත්වං ඔදනො, ආහරවූ තෝ; පච්චස්සු, පිසනු ලැබෙහිවා; (තා විසින්) තුම්හෙ ඔදනා, ආහරවූ තෙපි; පච්චව්හො, පිසනු ලබව්වා; (මා විසින්) අහං ඔදනො, ආහරවූ මම; පච්චෙ පිසනු ලබම්වා; (මා විසින්) මයං ඔදනා, ආහරවූ අපි; පච්චාමසෙ, පිසනු ලබමුවා;

භාවෙ, භාවකාරකයෙහි; භූයතු, වීමවේවා; භූයතං, වීමවේවා; (යනුයි)

සත්තමී—එය්‍ය එය්‍යුං එය්‍යාසි එය්‍යාථ එය්‍යාමි එය්‍යාම—එථ එරං එථො එය්‍යව්හො එය්‍යං එය්‍යාම්හෙ, යන සූත්‍රයෙන්, එය්‍ය එය්‍යුං යනාදී ප්‍රත්‍යදොළස, සත්තමී, සප්තමී විභක්තිනම්-අනුමති පරිකප්පපත්තෙසු, අනුඥනීම් අනියමින් සැලකීම් යන අර්ථයන්හි; සත්තමී, සප්තමී විභක්තියවේ;

කත්තරි පරස්සපදෙ, කර්තෘකාරක පරස්මෛ පදයෙහි;

සො, හෙතෙම; ඔදනං, බත; පචෙ.පචෙය්‍ය, පිසන්නේය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචෙය්‍යුං, පිසන්නාහුය; ත්වං, තෝ; ඔදනං, බත; පචෙය්‍යාසි, පිසන්නෙහිය; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචෙය්‍යාථ, පිසන්නාහුය; අහං, මම; ඔදනං, බත; පචෙය්‍යාමි, පිසන්නෙමි; මයං, අපි, ඔදනං, බත; පචෙය්‍යාම, පිසන්නෙමු.

කම්මනි අත්තනො පදෙ, කර්මකාරක ආත්මනෙ පදයෙහි;

තෙනතයාමයාවා, ඔහු විසින් හෝ. තා විසින් හෝ. මා විසින් හෝ; සො ඔදනො, ආහරවූ හෙතෙම; පච්චෙථ, පිසනු ලබන්නේය; (ඔහු විසින්) තෙ ඔදනා, ආහරවූ ඔහුතුමූ; පච්චෙරං, පිසනු ලබන්නාහුය; (තා විසින්) ත්වං ඔදනො, ආහරවූ තෝ; පච්චෙථො, පිසනු ලබන්නෙහි; (තා විසින්) තුම්හෙ ඔදනා, ආහරවූ තෙපි; පච්චෙය්‍යව්හො, පිසනු ලබන්නාහු; (මා විසින්) අහං ඔදනො, ආහරවූ මම; පච්චෙය්‍යං, පිසනු ලබන්නෙමි; (මා විසින්) මයං ඔදනා, ආහාරවූ අපි; පච්චෙය්‍යාම්හෙ, පිසනු ලබන්නෙමු;

භාවෙ, භාවකාරකයෙහි; භූයෙ, වීමවන්නේය; භූයෙය්‍ය, වීමවන්නේය; භූයෙථ, වීම වන්නේය; (යන) ඉති ආදි, මේ ආදියවේ;

පරොක්ඛා—අ උ එ ත්ථ අ ම්හ ත්ථ රෙ ත්ථො ව්හො ඉ ම්හෙ, යන සූත්‍රයෙන්, අ උ යනාදී ප්‍රත්‍යදොළස, පරොක්ඛා, පරෝක්ෂා විභක්ති නම්; අපච්චක්ඛෙ, ප්‍රත්‍යක්ෂනුවූ; අතීතෙ (කාලෙ) අතීතකාලයෙහි; පරොක්ඛා, පරෝක්ෂා විභක්තියවේ;

කත්තරිපරස්සපදෙ, කත්තෘ කාරක පරස්මෛ පදයෙහි;

සො, හෙතෙමේ; ඔදනං, බත; පපච, පිසීය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පපචු, පිසූය; ත්වං, තෝ; ඔදනං, බත; පපචෙ, පිසුවෙහිය; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පපචිත්ථ, පිසුවහුය; අහං, මම; ඔදනං, බත; පපච, පිසුවෙමිය; මයං, අපි; ඔදනං, බත; පපචිම්හ, පිසුවෙමුය.

කම්මනි අත්තනොපදෙ, කර්ම්මකාරක ආත්මනෙ පදයෙහි;

තෙනතාමයාවා, ඔහු විසින් හෝ තා විසින් හෝ මා විසින් හෝ; සො ඔදනො, ඒ ආහාරයතෙම; පපච්චිත්ථ, පිසනු ලැබීය; (ඔහු විසින්) තෙ ඔදනා, ආහරවූ ඔහුතුමූ; පපච්චිරෙ, පිසනු ලැබූය; (තා විසින්) ත්වං ඔදනො, ආහරවූ තෝ; පපච්චිත්ථො, පිසනුලැබුවෙහිය; (තා විසින්) තුම්හෙ ඔදනා, ආහරවූතෙපි; පපච්චිව්හො, පිසනුලැබුවහුය; (මා විසින්) අහං ඔදනො, ආහරවූ මම; පපච්චි, පිසනුලැබුවෙමිය; (මා විසින්) මයං ඔදනා, ආහරවූ අපි; පපච්චිම්හෙ, පිසනු ලැබුවෙමුය.

භාවෙ, භාවකාරකයෙහි; භූය, වීය; භූයිත්ථ, වීය; බභූය, වීය; බභූයිත්ථ, වීය; (යන) ඉති ආදි, මේ ආදියවේ.

හීයත්තනී —ආ ඌ ඔ ත්ථ අ ම්හා— ත්ථ ත්ථුං සෙ ව්හං ඉං ම්හසෙ, යන සූත්‍රයෙන්, ආ ඌ යනාදි ප්‍රත්‍යදොළොස, හීයත්තනී, හීයත්තනී විභක්තිනම්;-හීයොපභුති, ඊයේදවස පටන්කොට; පච්චක්ඛෙවා, ප්‍රත්‍යක්ෂවූහෝ; අපච්චක්ඛෙවා, ප්‍රත්‍යක්ෂනුවූහෝ; අතීතෙකාලෙ, ඉකුත්කාලයෙහි; හීයත්තනී, හීයත්තනී විභක්තියවේ;—

කත්තරි පරස්සපදෙ, කත්තෘකාරක පරස්මෛපදයෙහි;

සො, හෙතෙම; ඔදනං, බත; අපචා, පිසී; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; අපචූ, පිසූ; ත්වං, තෝ; ඔදනං, බත; අපචො, පිසුවෙහි; තුම්හෙ තෙපි; ඔදනං, බත; අපචත්ථ, පිසුවහු; අහං, මම; ඔදනං, බත; අපච, පිසුවෙමි; මයං, අපි, ඔදනං, බත; අපචම්හා, පිසුවෙමු.

කම්මනි අත්තනොපදෙ, කර්ම්මකාරක ආත්මනෙ පදයෙහි;

තෙනතාමයාවා, ඔහු විසින් හෝ තා විසින් හෝ මා විසින් හෝ සො ඔදනො, ඒ ආහරයතෙම; අපච්චත්ථ, පිසනු ලැබී, (ඔහු විසින්) තෙ ඔදනා, ආහරවූ ඔහුතුමූ, අපච්චත්ථුං, පිසනුලැබූ; (තා විසින්) ත්වං ඔදනො, ආහරවූ තෝ; අපච්චසෙ, පිසනු ලැබුවෙහි; (තා විසින්) තුම්හෙ ඔදනා, ආහරවූ තෙපි; අපච්චව්හං, පිසනු ලැබුවහු; (මා විසින්) අහං ඔදනො, ආහරවූ මම; අපච්චිං, පිසනු ලැබුවෙමි; (මා විසින්) මයං ඔදනා, ආහරවූ අපි; අපච්චාම්හසෙ, පිසනු ලැබුවෙමු.

භාවෙ, භාවකාරකයෙහි; අභූයත්ථ, වී; භූයත්ථ, වී; අභූයා, වී; භූයා, වී; (යන) ඉතිආදි, මේ ආදියවේ.

අජ්ජතනී--ඊ උං ඔ ත්ථ ඉං ම්හා—ආ ඌ සෙ ව්හං අ ම්හෙ, යන සූත්‍රයෙන්, ඊ උං යනාදි ප්‍රත්‍යදොළොස. අජ්ජතනී, අජ්ජතනී

විභත්ති නම්;—අජ්ජප්පභූති, අද්‍ය පටන් කොට; සමීපෙ, සමීපයෙහි; අතීතෙකාලෙ, ඉකුත් කාලයෙහි; අජ්ජතනී, අජ්ජතනී විභත්තියයි.

කත්තරි පරස්සපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි,

සො, හෙතෙම; ඔදනං, බත; අපචි පචි, පිසී; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; අපචිංසු අපචුං, පිසූ; ත්වං, තෝ; ඔදනං, බත; අපචො, පිසුවෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; අපචිත්ථ, පිසුවහු; අහං, මම; ඔදනං, බත; අපචිං, පිසුවෙමි; මයං, අපි; ඔදනං, බත; අපචිම්හා, පිසුවෙමු.

කම්මනි අත්තනොපදෙ, කර්මකාරක ආත්මනෙ පදයෙහි;

තෙනතයාමයාවා, ඔහුවිසින් හෝ තාවිසින් හෝ මාවිසින් හෝ; සො ඔදනො, ඒ බත තෙම; අපචි, පිසනු ලැබී; (ඔහු විසින්) තෙ ඔදනා, ඒ ආහරයෝ තුමූ; අපචු, පිසනු ලැබූ; (තාවිසින්) ත්වං ඔදනො, ආහාරවූ තෝ; අපචිසෙ, පිසනු ලැබුයෙහි; (තාවිසින්) තුම්හෙ ඔදනා, ආහරවූ තෙපි; අපචිව්හං, පිසනු ලැබුවහු; (මාවිසින්) අහං ඔදනො, ආහරවූ මම; අපචං, පිසනු ලැබුවෙමි; (මාවිසින්) මයං ඔදනා, ආහරවූ අපි; අපචිම්හෙ, පිසනු ලැබුවෙමු.

භාවෙ, භාවකාරකයෙහි; අභූයි, වී; භූයි, වි; අභූයා, වි; භූයා, වී; (යන) මෙහි ආදී, මේ ආදියයි.

භවිස්සන්ති—ස්සති ස්සන්ති ස්සසි ස්සථ ස්සාමි ස්සාම—ස්සතෙ ස්සන්තෙ ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හෙ, යන සූත්‍රයෙන් ස්සති ස්සන්ති යනාදී ප්‍රත්‍යයදොළස භවිස්සන්ති, භවිස්සන්ති විභත්ති නම්.

අනාගතෙ, (නොපැමිණි) මතු කාලයෙහි; භවිස්සන්ති, භවිස්සන්ති විභක්තියවේ.

කත්තරි පරස්සපදෙ, කර්තෘකාරක පරස්මෛ පදයෙහි;

සො, හෙතෙම; ඔදනං, බත; පචිස්සති, (මතු) පිසන්නේය; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; පචිස්සන්ති, පිසන්නාහුය; ත්වං, තෝ; ඔදනං, බත; පචිස්සසි, පිසන්නෙහි; තුම්හෙ, තෙපි; ඔදනං, බත; පචිස්සථ, පිසන්නහු; අහං, මම; ඔදනං, බත; පචිස්සාමි, පිසන්නෙමි; මයං අපි; ඔදනං, බත; පචිස්සාම, (මතු) පිසන්නෙමු.

කම්මනි අත්තනොපදෙ, කර්මකාරක ආත්මනෙපදයෙහි; (උදාහරණ) තෙනතයාමයාවා, ඔහු විසින් හෝ; තාවිසින් හෝ; මාවිසින් හෝ; සො ඔදනො, ඒ ආහාරය තෙම; පචිස්සතෙ, (මතු) පිසනු ලබන්නේය; (ඔහු විසින්) තෙ ඔදනා, ආහරවූ ඔහුතුමූ; පචිස්සන්තෙ, පිසනු ලබන්නාහුය; (තා විසින්) ත්වං ඔදනො, ආහරවූ තෝ; පචිස්සසෙ, පිසනු ලබන්නෙහි; (තාවිසින්) තුම්හෙ ඔදනා, ආහරවූ තෙපි; පචිස්සව්හෙ, පිසනු ලබන්නහු; (මාවිසින්) අහං ඔදනො, ආහරවූ මම; පචිස්සං, පිසනු ලබන්නෙමි; (මාවිසින්) මයං ඔදනා, ආහරවූ අපි; පචිස්සාම්හෙ, (මතු) පිසනු ලබන්නෙමු.

භාවෙ, භාවකාරකයෙහි; භූයිස්සති, (මතු) වීම වන්නේය; භූයිස්සන්ති, වීම වන්නේය; (යන) ඉතිආදි, මේ ආදියෙවී.

කාලාතිපත්ති—ස්සා ස්සංසු ස්සෙ ස්සථ ස්සං ස්සම්හා—ස්සථ ස්සිංසු ස්සසෙ ස්සව්හෙ ස්සං ස්සාම්හසෙ, යන සූත්‍රයෙන් ස්සා ස්සංසු යනාදි ප්‍රත්‍යය දොළස, කාලාතිපත්ති, කාලාතිපත්ති විභක්තිනම් ක්‍රියාතිපත්ති, ක්‍රියාවිපත්තියට පැමිණියාවූ; අතීත (කාල) ඉකුත්කාලයෙහි; කාලාතිපත්ති, කාලාතිපත්ති විභක්තියවේ.

කත්තරි පරස්සපදෙ. කර්තෘකාරක පරස්මෛපදයෙහි;

සො, තෙමෙ, ඔදනං, බත; අපචිස්සා, (උපකරණලදීනම්) පිසී; තෙ, ඔහුතුමූ; ඔදනං, බත; අපචිස්සංසු, (උපකරණලදූනම්) පිසූ; ත්වං, තෝ; ඔදනං, බත; අපචිස්සෙ (උපකරණලදුවෙහිනම්) පිසුවෙහි; තුම්හෙ, තෙපි, ඔදනං, බත; අපචිස්සථ, (උපකරණලදුව හුනම්) පිසුවහු; අහං, මම; ඔදනං, බත; අපචිස්සං, (උපකරණලැබුවෙම්නම්) පිසුවෙමි, මයං, අපි; ඔදනං, බත; අපචිස්සාම්හා, (උපකරණලැබුවෙමුනම්) පිසුවෙමු.

කම්මනි අත්තනො පදෙ, කර්මකාරක ආත්මනෙ පදයෙහි;

තෙනතයාමයාවා, ඔහුවිසින් හෝ. තාවිසින්හෝ මාවිසින් හෝ; සො ඔදනො, ආහරවූ තෙමෙ; අපචිස්සථ, (උපකරණලදීනම්) පිසනු ලැබී; (ඔහු විසින්) තෙඔදනා, ආහරවූ ඔහුතුමූ, අපචිස්සිංසු, (උපකරණ ලදූනම්) පිසනු ලැබූ; (තාවිසින්) ත්වං ඔදනො, ආහරවූතෝ; අපචිස්සසෙ, (උපකරණලදුවෙහිනම්) පිසුවෙහි; (තාවිසින්) තුම්හෙ ඔදනා, ආහරවූ තෙපි; අපචිස්සව්හෙ, (උපකරණලදුවහුනම්) පිසුවහු; (මාවිසින්) අහං ඔදනො, ආහරවූ මම; අපචිස්සං, (උපකරණ ලැබුවෙම්නම්) පිසනු ලැබුවෙමි; (මාවිසින්) මයං ඔදනා, ආහරවූ අපි; අපචිස්සාම්හසෙ, (උපකරණ ලැබුවෙමුනම්) පිසනු ලැබුවෙමු.

භාවෙ, භාවකාරකයෙහි; (උදාහරණ)

අභූයිස්සා, (උපකරණලදීනම්) වි; අභූයිස්සථ, (උපකරණලදීනම්) වී; (යන) ඉතිආදි, මේආදියවේ.

වත්තමානෙ, වර්තමාන විභක්ති; හෙතුඅත්ථෙ, හෙතු අර්ථයෙහි;—ධාතුහි, ධාතූන් කෙරෙන්; ණෙ, ණෙප්‍රත්‍යයද; ණය, ණයප්‍රත්‍යයද; ණාපෙ, ණාපෙප්‍රත්‍යයද; ණාපයා, ණාපයාප්‍රත්‍යයද; (යන මොහු වෙත්) කාරිතානි, (ඒ ප්‍රත්‍යයෝ) කාරිතයයිනම් ඇත්තෝදවෙත්;—කත්තරි පරස්සපදෙ, කර්තෘකාරක පරස්මෛපදයෙහි;

පාචෙති, පිසවයි; පාචෙන්ති, පිසවත්; පාචෙසි, පිසව; පාචෙථ, පිසවව්; පාචෙමි, පිසවමි; පාචෙම, පිසවමු;—කත්තරි අත්තනො පදෙ, කර්තෘකාරක ආත්මනෙ පදයෙහි;—පාචෙතෙ, පිසවයි; පාචෙන්තෙ, පිසවත්; පාචෙසෙ, පිසව; පාචෙව්හෙ, පිසවව්; පාචෙ, පිසවමි; පාචෙම්හෙ, පිසවමු; (මේ ණෙප්‍රත්‍යයෙදුනු තැනයි)—කර්තෘ

කාරක පරස්සෙම පදයෙහි (උදාහරණ) පාවයති, පිසවයි; පාවයන්ති, පිසවත්; පාවයසි, පිසව; පාවයථ, පිසවව්; පාවයාමි, පිසවමි, පාවයාම, පිසවමු;--(කත්‍රීකාරක ආත්මනෙ පදයෙහි උදාහරණ) පාවයතෙ, පිසවයි; පාවයන්තෙ, පිසවත්; පාවයසෙ, පිසව; පාවයව්හෙ, පිසවව්; පාවයෙ, පිසවමි; පාවයම්හෙ, පිසවමු; (මේ ණෙ ප්‍රත්‍යයෙ දුනතැනයි) (කත්‍රීකාරක පරස්සෙම පදයෙහි උදාහරණ මෙසේයි) පාවාපෙති, පිසවයි; පාවාපෙන්ති, පිසවත්; පාවාපෙසි, පිසව; පාවාපෙථ, පිසවව්; පාවාපෙමි, පිසවමි; පාවාපෙම, පිසවමු;

(කත්‍රීකාරක ආත්මනෙ පදයෙහි උදාහරණ)

පාවාපෙතෙ, පිසවයි; පාවාපෙන්තෙ, පිසවත්; පාවාපෙසෙ පිසව; පාවාපෙව්හෙ, පිසවව්; පාවාපෙ, පිසවමි; පාවාපෙම්හෙ, පිසවමු; (මේ ණාපෙ ප්‍රත්‍යයෙදුන තැනයි)

කත්‍රීකාරක පරස්සෙමපදයෙහි උදාහරණ)

පාවාපයති, පිසවයි; පාවාපයන්ති, පිසවත්; පාවාපයසි, පිසව; පාවාපයථ, පිසවව්; පාවාපයාමි, පිසවමි; පාවාපයාම, පිසවමු;

(කත්‍රීකාරක ආත්මනෙ පදයෙහි උදාහරණ) පාවාපයතෙ, පිසවයි; පාවාපයන්තෙ, පිසවත්; පාවාපයසෙ, පිසව; පාවාපයව්හෙ, පිසවව්; පාවාපයෙ, පිසවමි; පාවාපයම්හෙ, පිසවමු; (මේ ණාපය ප්‍රත්‍යයෙදුනු තැනයි).

අවසෙසවිභත්තිසුසෙයෙයා, (වත්තීමානාදි අෂ්ඨ විභක්තීන්හි දතයුත්තාහ.


---

**ගණභෙද, (ධාතු) ගණභෙදයයි.**

පචති පචන්තිත්‍යාදි, පචති පචන්ති යනාදිය; භූවාදි; භූවාදි ධාතු ගණයයි;
රුන්ධති රුන්ධන්තිත්‍යාදි, රුන්ධති රුන්ධන්ති යනාදිය; රුධාදි, රුධාදි ධාතු ගණයයි;
දිබ්බති දිබ්බන්තිත්‍යාදි, දිබ්බති දිබ්බන්තියනාදිය දිවාදි; දිවාදි ධාතු ගණයයි;
සුණොති සුණොන්තිත්‍යාදි සුණොති සුණන්ති යනාදිය; සුවාදි, සුවාදි ධාතු ගණයයි;
කිණාති කිණන්තිත්‍යාදි, කිණාති කිණන්ති යනාදිය; කියාදි, කියාදි ධාතු ගණයයි;
ගණ්හාති ගණ්හන්තිත්‍යාදි, ගණ්හාති ගණ්හන්ති යනාදිය; ගහාදි, ගහාදි ධාතු ගණයයි;
කරොති කරොන්තිත්‍යාදි, කරොති කරොන්ති යනාදිය; තනාදි, තනාදි ධාතුගණයයි;
චොරෙති චොරෙන්තිත්‍යාදි, චොරෙති චොරෙන්ති යනාදිය චුරාදි, චුරාදි ධාතු ගණයයි.

සන්නසහිත
ආඛ්‍යාතපදමාලා නිමි.

## සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු